2023 අප්‍රේල්-සැප්තැම්බර්
07 වෙළුම 03 කලාපය
ISSN 2279 - 1027
මිල රු.200/=

අරගලයට අවි තනන

# Left



## IMF LOAN

# මිත්‍යාව සහ යථාර්ථය

අරගලයට
අවි තනන
# Left
න්‍යායික දේශපාලන සඟරාව

2023 අප්‍රේල්-සැප්තැම්බර්
07 වෙළුම
03 කලාපය
ISSN 2279 - 1027

**ප්‍රධාන සංස්කාරක**
ප්‍රසන්න පෙරේරා

**කර්තෘ මණ්ඩලය**
වෛද්‍ය එච්.පී. ධම්මික
සුජීව දිසානායක
වෛද්‍ය සුසිල් රණසිංහ
බිමල් රත්නායක
සුනිල් ගමගේ
ඇන්ටන් ජයකොඩි

**ආරාධිත ලේඛකයෝ**
මහාචාර්ය චන්දන අබේරත්න
මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි

**පරිගණක පිටු සැකසුම**
බන්දුල පුෂ්පකුමාර

**මුද්‍රණය**
ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

**බෙදාහැරීම**
Lanka First Rate Publishers (Pvt) Ltd
0714 492 252

**විමසීම්**
298, කලපළුවාව, රාජගිරිය.
0777 802 707
magazineleft@gmail.com

## පෙළගැස්ම

| | |
|---|---|
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යනු | 03 |
| IMF සමඟ වාසේ | 08 |
| දකුණු කොරියාව \| ග්‍රීසිය | 16 |
| සංවාදය | 28 |
| ලංකාව ගොඩ ගනීද? | 36 |
| දැනුමෙන් ඔබ්බට | 44 |
| කෙටි කතාව | 49 |
| කවි | 53 |
| පාඨක සටහන් | 56 |
| වැව රවුම | 59 |

# අයි.එම්.එෆ්. පස්සේම යන්නේ ඇයි?

මෙවර ලෙෆ්ට් කලාපය වෙන් වී ඇත්තේ, අප රටේ මේ මොහොතට සෘජුවම අදාළ අයි.එම්.එෆ්. ණය පිළිබඳවය. අයි.එම්.එෆ්. පිළිබඳව විශාල වශයෙන් ලංකාව තුළත්, ලෝකය පුරාත් ලියවී තිබේ. එහි අරමුණු සහ ණය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද රටවලට ඇති වී තිබෙන ප්‍රතිවිපාක පිළිබඳවද විශාල වශයෙන් සාකච්ඡා කෙරෙමින් පවතී. එම නිසාම එයට කත්අදින අතිවිශාල මාධ්‍ය ෆැක්ටරිවල මෙහෙයුම් තිබියෙදී, පවා අයි.එම්.එෆ්. පිළිබඳව ලෝකය තුළත්, ලංකාව තුළත් ඇති බහුතර ජනමතය නම්, එය රටවල් විනාශ කරන ආයතනයක්ය යන්නය. එය වමේ සහ ප්‍රගතිශීලී සංවිධාන, ජනතාව සහ ප්‍රගතිශීලී උගතුන් විසින් දශක ගණනාවක් තිස්සේ අප්‍රතිහත ධෛර්යයෙන් සහ දිවි නොතකා කරන ලද අරගලයක ප්‍රතිඵල මතින් ගොඩනැගුණකි. එසේ තිබියෙදීත්, ප්‍රබල ප්‍රශ්නයක් පැනනගී.

අයි.එම්.එෆ්. විනාශකාරී නම් රටවල් ඒ පස්සේම යන්නේ ඇයි?

මෙය විශාල ගැඹුරක් නැතත්, සුලබව මතු කරනු ලබන ප්‍රායෝගික ප්‍රබල ප්‍රශ්නයකි. ලොව පුරා රටවල් සැලකිය යුතු ප්‍රමාණයක් තම ගෙවුම් ශේෂ හිඟය සහ ස්වෛරී ණය අර්බුදවලට විසඳුම් ලෙස අයි.එම්.එෆ්. සරණ පතා යන්නේ ඇයිද යන්නය. එයට හේතු ගණනාවක් දැක්විය හැකි වුවත්, සීමිත ඉඩකඩ තුළ ලිවිය හැක්කේ සීමිතවය.

විශාල ලෙස අන්තර් සම්බන්ධිත ගෝලීය ආර්ථිකයන් පවතිද්දී, විවිධ හේතු නිසා රටවල් තුළ ඇති විය හැකි ආර්ථික අර්බුදවලදී හෝ මූල්‍ය සහ ණය අර්බුදවලදී හෝ ඒවාට පහසුකම් සපයන ගෝලීය මූල්‍ය ආයතනයක අවශ්‍යතාව ඉතා පැහැදිලි එකකි. ධනවාදී ආර්ථිකයේ ඇති ප්‍රබල අවිනිශ්චිත බව නිසාම එවන් ගෝලීය මූල්‍ය ආයතනයක් හෝ කිහිපයක් හෝ අත්‍යවශ්‍යව පවතී. අයි.එම්.එෆ්. යනු ඒ අවශ්‍යතාව හුවාදක්වමින්, ගොඩනඟා තිබෙන ප්‍රධානම ජාත්‍යන්තර මූල්‍ය ආයතනය වන අතර, ඊට විකල්ප ජාත්‍යන්තර මූල්‍ය ආයතන පද්ධතියක් ලොව ගොඩනඟා නැත; ගොඩනැගීමට ඉඩ දීද නැත. ඒ අනුව මෙහිදී සිදු වන්නේ එම ඉතාම විෂයමූලික අවශ්‍යතාව ගසාකමින්, අධිරාජ්‍යවාදී රටවල ආර්ථික, දේශපාලන ඉලක්ක ඉටු කිරීම අරමුණු කර ගනිමින් පමණක් ක්‍රියාත්මක වන ගෝලීය මූල්‍ය ආයතනයක් ලෙස අයි.එම්.එෆ්. ගොඩනඟා ක්‍රියාත්මක කරගෙන යනු ලැබීමයි. එහි අධිරාජ්‍යවාදී අරමුණු සාක්ෂාත් කර ගනුවස් එහි අධ්‍යක්ෂ මණ්ඩලය තුළ නිෂේධ බලය එක්සත් ජනපදයට හිමි වන පරිදි ව්‍යවස්ථාවක්ද සකස් කරනු ලැබ තිබේ. එනමුත්, බොහෝ රටවල් අයි.එම්.එෆ්.හි විනාශකාරී බව දැන දැන එයටම යාමට බලපාන සරල, ප්‍රායෝගික හේතුව වන්නේ රටවල මූල්‍ය අවශ්‍යතා ඉටු කරනු ලබන වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී ගෝලීය මූල්‍ය ආයතන පද්ධතියක් නොමැති වීමයි. විධිමත් ණය දෙන ආයතනයක් නොමැති විට ගම්වැසියන් ගිනි පොලීකරුවන් වෙත යන්නාක් මෙනි!

රටවල් අයි.එම්.එෆ්. සරණ යාමට බලපාන අනෙක් කරුණ වන්නේ, දශක පහකට ආසන්න කාලයක් ලෝක බැංකුව සහ අයි.එම්.එෆ්. මඟින් රටවල්වල අභ්‍යන්තර ආර්ථික ප්‍රතිපත්තිවලට සෘජුව සහ වක්‍රව මැදිහත් වී ණය ලබා දීමේ කොන්දේසි ලෙස අයි.එම්.එෆ්.හි ව්‍යුහාත්මක ගැළපුම් ක්‍රියාත්මක කරවීම නිසා ලොව බොහෝ රටවල ආර්ථිකයන් අධිරාජ්‍යවාදී කොල්ලයට ගැළපෙන ලෙස සකස් කර තිබීමය. උදාහරණයක් ලෙස කෘෂි බීජ නිපදවන සමාගමම ඒවාට ගැළපෙන පොහොර සහ කෘමිනාශකද නිපදවන බැවින්, එම බීජ වගා කරන්නේ නම්, එම පොහොරද, පළිබෝධ නාශකද අනිවාර්යයෙන්ම ගත යුතුවා මෙනි. අයි.එම්.එෆ්. මඟින් රටවල ආර්ථික සකස් කර ඇත්තේම, ණය ගැනීම, පෞද්ගලිකකරණය, දේශීය වෙළෙඳපොළට නොව විදේශීය වෙළෙඳපොළට භාණ්ඩ නිෂ්පාදනය කිරීම, දේශීය නිෂ්පාදකයන්ට නොව විදේශීය ආයෝජකයන්ට ප්‍රමුඛත්වය ලබා දීම, අතිවිශාල යටිතල පහසුකම් ඉදි කිරීම, මූල්‍ය වෙළෙඳපොළ නිදහස් කිරීම වැනි වට්ටෝරුවක් මත බැවින්, කුඩුවලට ඇබ්බැහි වූවන් කුඩු පසුපස යන්නාක් මෙන් රටවල්ද අයි.එම්.එෆ්. පසුපස යයි. මන්ද යත්, කුඩු අතහැරීම ගුණදායක වුවත්, එය අත්හළ විට ආරම්භක කාලයේදී විශාල සංකූලතා සහ වේදනා ගෙන දෙන බැවිනි.

අනෙක් කරුණ වන්නේ දශක ගණනක් තිස්සේ කර ඇති මොළ සේදීම සහ විවේචනාත්මක චින්තනය (Critical Thinking) රහිතව අධිරාජ්‍යවාදී ආයතන විසින් ගොඩනඟනු ලබන යාන්ත්‍රික උගතුන්ගේ සහ නිලධාරීන්ගේ බලපෑමයි. ඉතා සූක්ෂ්මව ලෝකයේ සරසවිවල ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය

ආදී විෂයයන් සියල්ලම අධිරාජ්‍යවාදී කොල්ලය දිගට කරගෙන යාම සහතික කෙරෙන ආකාරයේ පාඨමාලා බවට සකස් කර ඇති අතරම, ලොව පුරා දහසක් ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩසටහන් මඟින් අඛණ්ඩවම මෙම මොළ සේදීම සිදු කරනු ලබයි. ඒ වෘත්තිකයන්ට අනුව මෙම ධනවාදී ආර්ථික ක්‍රමයට විකල්ප නැති අතරම, අයි.එම්.එෆ්.ට විකල්පද නැත. නමුත්, ඔවුන් මුහුණපාන බරපතළ ගැටලුවක්ද තිබේ. එනම්, අයි.එම්.එෆ්. වැඩසටහන්වලින් ග්‍රීසිය, ආර්ජන්ටිනාව ඇතුළු රටවල් තවත් විපතට පත්ව ඇති බව ඇස්පනා පිට පෙනීමයි. එවිට ඔවුහු "ලෙඩ සුව වීමට තිත්ත බෙහෙත් අවශ්‍ය" යැයි කියා ප්‍රශ්නයෙන් පලා යති. "ලෙඩට තිත්ත බෙහෙත් බීමත්, ලෙඩට වස බීමත් අතර වෙනසක් තිබෙනවානේ දැයි" ඇසූ විට සාමාන්‍යයෙන් ඔවුහු ප්‍රකෝප වෙති. නැති නම්, අප ලෝකය ගැන නොදන්නා 'ළිං මැඩියන්' යැයි ප්‍රකාශ කරති.

අනෙක් කරුණ තමාගෙන් ණය ලබා ගන්නා ලෙස අයි.එම්.එෆ්. මඟින් රටවලට කෙරෙන ප්‍රබල වක්‍ර බලපෑමයි. එමෙන් ම අධිරාජ්‍යවාදී දේශපාලන අරමුණු වෙනුවෙන් ණය ලබා දීම හෝ නොදීම අමු අමුවේම සිදු කිරීමයි. ශ්‍රී ලංකාව තුළ ජන වරමක් සහිත ආණ්ඩුවක් නැතිව අයි.එම්.එෆ්. ණය ලබා දීමට නොහැකි බව 2022 නොවැම්බර් මස ප්‍රකාශ කළ අයි.එම්.එෆ්. අධ්‍යක්ෂවරයා 2023 පෙබරවාරි වන විට මැතිවරණය තුළින් වාමාංශික බලවේග ජය ගනීවිය යන බිය නිසා තම කලින් ස්ථාවරය තුට්ටුවකට මායිම් නොකර මැතිවරණ කල් දමන ලද, දූෂිත, මර්දනකාරී වත්මන් ආණ්ඩුවට ණය ලබා දීම අයි.එම්.එෆ්.හි කුප්‍රකට අභිමතාර්ථවලට නිදසුනක් ලෙස දැක්විය හැකිය.

එමෙන්ම වෙනිසියුලාවේ මහජන ඡන්දයෙන් පත් වූ, එක්සත් ජාතීන් විසින් පිළිගනු ලබන ආණ්ඩුව පිළිගත නොහැකි බව පවසමින්, එක්සත් ජනපද ඩොලර් බිලියන තුනක ණයක් වෙනිසියුලාවට නොදීමද එහිම දිගුවක් බව මෙහිදී දැක්විය හැකිය. ණය නොගෙවන බව දැන දැනම සතියක් වැනි කාලයක් තුළ ඩොලර් බිලියන 15ක ණයක් ඇමෙරිකානු ඉත්තකු බවට පත්ව ඇති යුක්‍රේනයට ලබා දීමද එවැන්නකි.

එබැවින්, අයි.එම්.එෆ්. යනු විනිවිද පෙනෙන, ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන මූල්‍ය ආයතනයක්ද නොවේ. එය කිසිදු රටක් සමඟ එළැඹෙන ආරම්භක එකඟතා, ගිවිසුම්, සාකච්ඡා කරනු ලබන කරුණු එම රටේ ජනතාවට හෝ ලෝකයට හෝ ඉදිරිපත් නොකර රහසිගතව පවත්වාගෙන යයි.

අයි.එම්.එෆ්. සරණ යන කිසිදු රටක් එයට යොමු වන්නේ අයි.එම්.එෆ්. ණය වැඩසටහන්වලින් සාර්ථක අත්දැකීම් ලැබූ රටවල අත්දැකීම් සැලකිල්ලට ගෙනද? නැත! ලොව රටවල් සමඟ එළඹි අයි.එම්.එෆ්. ණය ගිවිසුම්වලින් සියයට 63ක්ම පළමු වසර තුළ දී ද, ඉන් සියයට 90ක් පමණ පළමු වසර දෙක තුළ දී ද බිඳවැටීමෙන් ම පෙන්නුම් කරන්නේ අයි.එම්.එෆ්. ණය වැඩසටහන් තුළ ඇති අධික විෂ සහිත බවය.

ලංකාව අයි.එම්.එෆ්. සමඟ ණය කොන්දේසිවලට ගොස් නිල වශයෙන් මාස හයක් වුවද, එහි පූර්ව කොන්දේසි (විදුලි බිල, තෙල් මිල, බදු වැඩි කිරීම) ඉටු කිරීමට පටන්ගෙන මාස 10ක පමණ කාලයක් ගත වී තිබේ. එම කාලය තුළ ලංකාවේ ආර්ථිකය 2022 පළමු කාර්තුවට වඩා 2023 පළමු කාර්තුවේදී සියයට 11.5කින් කඩාවැටී තිබේ. ණය ප්‍රමාණය ට්‍රිලියනයකින් (මෙම මාස හය තුළ) ඉහළ ගොස් තිබේ. අයි.එම්.එෆ්. ණය වැඩසටහනේදී ඔවුන් විසින් ප්‍රකාශිත ඉලක්ක කිසිවක් සම්පූර්ණ දී නැත. මේ වන තෙක් කපනවා යැයි කියූ විදෙස් ණය එක ඩොලරයක්වත් කපා දමා නැත. ඒ වෙනුවට දේශීය සහ විදේශීය ධනපතීන් රකිමින්, ශ්‍රී ලංකාවේ ජනතාවගේ වැටුප් කොල්ලකෑමට අයි.එම්.එෆ්. උපදෙස් ලබා දෙමින් තිබේ.

මෙවර 'ලෙෆ්ට්' වෙන් වන්නේ අප රටේ විනාශය ප්‍රවේගවත් කරන විෂ සහිත අයි.එම්.එෆ්. ණය පිළිබඳ ජාතික, ජාත්‍යන්තර අත්දැකීම් සහ උදාහරණ මඟින් මෙම විනාශයට එරෙහිව සටන් වදින උගතුන්ට, වෘත්තිකයන්ට, ක්‍රියාධරයන්ට තම මතවාදී අවි මුවහත් කර ගැනීමට ගිනිගල් සැපයීම වෙනුවෙනි !

මෙවර 'ලෙෆ්ට්' අයි.එම්.එෆ්. හි විනාශකාරී වැඩසටහන්වලට එරෙහිව සටන් කරන කම්කරු, ගොවි, ශිෂ්‍ය, ජනතා බලවේගවලට තම සටන නිවැරැදි බවත්, ලෝකයේම ජනතා සටන් පෙන්වා දෙන්නේද, තම සටන නිවැරැදි බවත්ය යන්න තහවුරු කර දී, ජනතාව මංමුළා කරවමින් ගෙන එන ව්‍යාජ මතවාදවලින් ආරක්ෂා වීමට මතවාදී පළිහක් තැනීම වෙනුවෙනි!!

මෙවර 'ලෙෆ්ට්' අධිරාජ්‍යවාදය සහ ධනවාදය පරදවන, ජනතාව සංවිධානය කරන ජන අරගලයේ හිස තවත් දියුණු, තියුණු කිරීම වෙනුවෙනි!!!




# ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යනු කුමක්ද?

**සුජීව දිසානායක**

අධිරාජ්‍යවාදයේ එක් ලක්ෂණයක් වන්නේ ආර්ථික බලවතුන් අතර ලෝකය නැවත බෙදා ගැනීමට උත්සාහ කිරීමය. එහි පළමු ප්‍රයත්නය පළමුවැනි ලෝක යුද්ධයට මග පෑදීය. ඊට මූලික වූයේ ජර්මනියයි. පළමුවැනි ලෝක යුද්ධය නිමා වූයේ සමාජවාදී සෝවියට් දේශය බිහිවීමෙනි. යළිත් මෙම අධිරාජ්‍යවාදී අවශ්‍යතාවය වෙනුවෙන් ලෝකයේ රටවල් යුද වැදුනු අතර එම දෙවන ලෝක යුද්ධය ආරම්භ කළේද ජර්මනියමය. ඒ, 1939 දී පෝලන්තය ආක්‍රමණය කරමිනි. එහිදී ජර්මනිය විසින් සෝවියට් දේශයද ආක්‍රමණය කළේය. දෙවන ලෝක යුද්ධය නිමා වූවේ ජර්මනියට හා ජපානයට පරාජය ලබාදෙමින් සෝවියට් දේශය, බ්‍රිතාන්‍යය, එක්සත් ජනපදය ඇතුළු මිත්‍ර පාර්ශවය ජයගනිමිනි. ඒ සමගම නැගෙනහිර යුරෝපය ඇතුළු සමාජවාදී රාජ්‍ය පද්ධතියක්ද බිහිවිය.

කෙසේ වෙතත් මෙම යුද්ධය ලෝක ඉතිහාසයේ දැවැන්තම මානව හා භෞතික හානිය සිදුවු යුදමය තත්වය බව කියනු ලැබේ. මෙම යුද්ධය අවසානයේ නැවත වරක් එවැනි යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහාත් යුද්ධයෙන් කඩා වැටුණු රටවල ආර්ථිකය ගොඩනැංවීම සඳහාත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුණි. එක්සත් ජාතීන්ගේ සංගමය බිහි වන්නේ එවන් වටපිටාවක් තුළය. එය මෙතෙක් ලෝකයේ සාමය ආරක්ෂා කර ගැනීම සඳහා පිහිටුවා ගෙන තිබු ජාතීන්ගේ සංවිධානයට වඩා ලොව රටවල්වලට බලපෑම් කළ හැකි ප්‍රබල මට්ටමේ ජාත්‍යන්තර සංවිධානයක් විය. මෙම සංවිධානය මූලික අනුබද්ධ ආයතන 06 කින් සමන්විත වූවකි.

**මහා මණ්ඩලය**

**ආරක්ෂක මණ්ඩලය**

**භාරකාර මණ්ඩලය**

**ජාත්‍යන්තර අධිකරණය**

**මහලේකම් කාර්යාලය**

**ආර්ථික හා සාමාජික කටයුතු පිළිබඳ මණ්ඩලය**

එම මූලික ආයතන ලෙස හඳුනා ගත හැකිය.

මෙම මූලික ආයතන අතරින් ආර්ථික හා සාමාජික කටයුතු පිළිබඳ මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධානතම ආයතනයකි. මෙම ආයතනයේ මුළු සාමාජිකයන් ගණන 54කි. මෙහි නිල කාලය වසර 03කි. මානව සංහතියේ ආර්ථික හා සමාජීය වර්ධනය දියුණු කිරීම මෙම ආයතනයේ ප්‍රධාන වගකීම වේ. මෙම ආයතනය තම කටයුතු කරගෙන යාමට තවත් අනුබද්ධ ආයතන ගණනාවක් උපයෝගි කර ගැනීමද විශේෂ ලක්ෂණයකි.

**ජාත්‍යන්තර කම්කරු සංවිධානය**

**ආහාර හා කෘෂිකර්ම සංවිධානය**

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල**

**ලෝක සෞඛ්‍ය සංවිධානය**

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක, හා සංස්කෘතික සංවිධානය**

**තීරු බදු හා වෙළඳාම පිළිබඳ පොදු සම්මුතිය**

**ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ අන්තර් ජාතික මණ්ඩලය**

**වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණ මණ්ඩලය** වැනි ආයතනයන් මෙය හා සම්බන්ධ අනුබද්ධ ආයතනයන් ලෙස අදටත් කටයුතු කරනු දැකිය හැක.

ආර්ථික හා සාමාජික කටයුතු පිළිබඳ මණ්ඩලයේ අනුබද්ධ ආයතනයක් වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) යනු 1944දී ඇමරිකා එක්සත් ජනපදයේ බ්‍රෙට්න් වුඩ්ස් (Bretton Woods) හි පැවති සම්මුතියකින් පසුව බිහි වූ මූල්‍ය සංවිධානයකි. බ්‍රෙට්න් වුඩ් සමුළුව අධිරාජ්‍යවාදී කඳවුරේ වුවමනා වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා ලෝක බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක වෙළඳ

> **ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ආයතනයක් වන අතර එහි ව්‍යවස්ථාවට අනුව එක්සත් ජනපදය පමණක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලුම ප්‍රධාන තීරණ සම්බන්ධයෙන් නිෂේධ බලයක් භුක්ති විඳින බව සඳහන් කළ හැකිය. එම තත්වය තුළින්ම පැහැදිලි වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යනු ඇමෙරිකාවේ බලපෑමට යටත් ආයතනයක් බවය.**

සංවිධානය පිහිටුවාගත් අතර ඉන් මූල්‍ය පාලනය පිළිබඳ ආයතනය වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලය. ආරම්භයේදී මෙම සංවිධානය පිහිටුවා ගැනීමේ සමුළුවට රටවල් 44ක් නියෝජනය කරමින් නියෝජිතයින් 730ක් සහභාගි වී ඇත.

ලොව සුපිරි බලවතුන් හතක් වන එක්සත් ජනපදය, එක්සත් රාජධානිය හෙවත් මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, ජපානය, ඉතාලිය සහ කැනඩාව ඇතුළු රටවල් 21ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ස්ථිර සාමාජිකත්වය භුක්ති විඳියි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ආයතනයක් වන අතර එහි ව්‍යවස්ථාවට අනුව එක්සත් ජනපදය පමණක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලුම ප්‍රධාන තීරණ සම්බන්ධයෙන් නිෂේධ බලයක් භුක්ති විඳින බව සඳහන් කළ හැකිය. එම තත්වය තුළින්ම පැහැදිලි වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යනු ඇමෙරිකාවේ බලපෑමට යටත් ආයතනයක් බවය.

මෙලෙස ගොඩනැගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හෙවත් IMF ආයතනය පිහිටුවීමේ ප්‍රකාශිත අරමුණු කිහිපයක් අපට හඳුනා ගත හැකිය. ඒවා අතර පහත අරමුණු කැපී පෙනේ. මූල්‍ය අරමුදලේ සාමාජික රටවල් අතර මූල්‍යමය සහයෝගීතාව ඇති කරගැනීම, විදේශ විනිමය අනුපාතවල ස්ථාවරත්වය සහතික කිරීම, ජාත්‍යන්තර වශයෙන් සිදුවන්නා වූ වෙළඳාමේ ගලායාම දිරිගැන්වීම සඳහා විනිමය පාලනය ඉවත් කිරීම යන කරුණු අරමුණු අතර වේ. ජාත්‍යන්තර වෙළඳාමේදී පැවති පැරණි ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් වෙනුවට බහුපාර්ශ්වික වෙළඳ සහ ගෙවීම් පද්ධතියක් ස්ථාපිත කිරීමත් ලෝක වෙළඳාම තුළ ඇති සියලු බාධක ඉවත් කිරීම මගින් ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමත් සාමාජික රටවල සමතුලිත ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට උපකාර කිරීමත් මෙහි අරමුණු අතර කැපී පෙනේ. ලොව





බොහෝ රටවල ගෙවුම් ශේෂයන්හි ඇති වන අසමතුලිතතාවය ඉවත් කිරීම හෝ අඩු කිරීමත් ධනවත් රටවලින් දුප්පත් රටවලට ප්‍රාග්ධනය අපනයනය ප්‍රවර්ධනය කිරීමත් මෙහි ප්‍රකාශිත අරමුණු අතර දැකිය හැකිය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංවිධාන ව්‍යුහය දෙස බලන විට එය අධිරාජ්‍යවාදීන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් වූ මූල්‍යමය ආයතනයක් බව අද දක්වා එහි ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළවල් මගින් මැනවින් පැහැදිලි වේ. එහිදී මූල්‍ය අරමුදල තමන් සතු ප්‍රාග්ධනය ලොව දුප්පත් රටවල ආර්ථිකය නගා සිටුවීමට යෙදවීම තුළින් තුන්වන ලෝකයේ රටවල ආර්ථිකයට ඇඟිලි ගසන අධිරාජ්‍යවාදී බලවතුන්ගේ අතේ ඇති ආයුධයක් බවට පත්වී අවසන්ය. මෙහිදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තමන් ලබා දෙන්නා වූ මූල්‍ය ප්‍රතිපාදනයන්ට මුවාවෙමින් විවිධ කොන්දේසි මගින් තුන්වැනි ලෝකයේ රටවල් සමඟ මෙහෙයුම් කරන ක්‍රම ගණනාවක්ද අපට හඳුනාගත හැකිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යම් රටකට ණය ලබාදීමේදී තාක්ෂණික කරුණුවලට වඩා අවධානය යොමු කර තිබෙන්නේ ණය වෙනුවෙන් අමුණා ඇති කොන්දේසි කෙරෙහිය. ඔවුන් තමන් ලබාදෙන්නා වූ සෑම ණය වර්ගයකටම අප්‍රකාශිත හෝ ප්‍රකාශිත කොන්දේසි පනවනු ලැබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තම ක්‍රියාකාරීත්වයේදී සිය සාමාජිකයින්ට ඔවුන්ගේ මුදල් ඒකකවල හුවමාරුවට අනෙකුත් සාමාජිකයින්ගේ මුදල් ඒකක විකිණීමට හෝ SDR (Special Drawing Rights) ලබාගැනීමට අවශ්‍ය පහසුකම ලබාදී තිබීම විශේෂ ලක්ෂණයකි. මෙම හැසිරවීම මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පූර්ණ සංචිතය වෙනස් නොවන අතර එහි සංයුතිය පමණක් වෙනස් වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පත් ස්ථිර ප්‍රතිපත්ති මගින් සාමාන්‍ය ගෙවීම් පියවීමට අදාළ අරමුණු සඳහා ලබා ගත හැකිවීමද විශේෂ ලක්ෂණයක් වේ. නිශ්චිත අවශ්‍යතා සඳහා ස්ථිර පහසුකම් වශයෙන් වන්දි සහ හදිසි මූල්‍ය පහසුකම් සැපයීමද ස්වාරක්ෂක තොග පහසුකම් සහ විස්තීරණ මූල්‍ය පහසුකම් ලබාදීමද මූල්‍ය අරමුදල විසින් සිදු කරනු ලබයි. තාවකාලික පහසුකම් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තෙල් පහසුකම් ලබාදීම, අවශ්‍ය වුවහොත් පරිපූරක මූල්‍ය පහසුකම් සැපයීම යනාදිය සිදු කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පත් සඳහා වූ පුළුල් ප්‍රවේශය පිළිබඳ ප්‍රතිපත්තියද මෙහි විශේෂිත සම්ප්‍රදායක් වන්නේය.

සංචිත කොටස් ලබාගැනීම හැරුණු විට යම් සාමාජික රටක් ණය ඉල්ලීම් කළහොත් "ඒවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් දක්වන ප්‍රතිපත්ති අනුගමනය කර එම රටෙහි ගෙවුම් ශේෂයේ දුෂ්කරතා මඟහරවා ගැනීමට අදාළ රට පියවර ගැනීම කළ යුතුය" යන්න මෙහි මූලික ස්ථාවරයක් වී තිබේ. එම ණය ලබා ගැනීමේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය සම්බන්ධ ව්‍යවස්ථාවන්හි ප්‍රතිපාදනවලට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපාදනවලට අනුකූලද යන පරීක්ෂාවට ලක් කිරීමද දැකිය



හැකි තවත් ලක්ෂණයක් වේ.

තුන්වන ලෝකයේ රටවල් මත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දෙන ණය මතින් ඇති කරන ලද ප්‍රතිඵල පිළිබඳව ලොව විවිධ ආර්ථික විශ්ලේෂකයන් විසින් සිය අදහස් ඉදිරිපත් කරනු ලැබ තිබේ. "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි පැකේජය තුන්වන ලෝකයේ රටවල ව්‍යුහාත්මක ගෙවුම් ශේෂ හිඟය නිවැරදි කිරීමටම සැලසුම් කර නොමැත" යන්න එවැනි විවේචනයකි. මෙවැනි කොන්දේසි බොහෝදුරට ආර්ථික තාර්කිකත්වයෙන් තොර වන අතර බොහෝ දුරට අදාළ රටවල ආර්ථික අර්බුදය තව තවත් උග්‍ර කිරීමට හේතු වන බව ඔවුන්ගේ අදහස වේ. මෙම ණය කොන්දේසි කොතරම් දැඩිද යන්න බොහෝ විට ණය ගැතියන් ඒවාට අනුගත වීමට අසමත් වීම තුළින්ම පැහැදිලි වන බව ඔවුන්ගේ තවත් අදහසක් වේ.

"ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පනවනු ලබන කොන්දේසි සම්බන්ධයෙන් එම ආයතනයට පරිශුද්ධභාවයක් නැත" යන්නද ඔවුන්ගේ අදහසකි. සමහර විටෙක එය සුළු අඩුපාඩුවක් අල්ලා ගත හැකි නමුත් සමහර විටෙක ප්‍රධාන උල්ලංඝනය කිරීම් නොසලකා හැරීමටද කටයුතු කරයි. මූල්‍යය අරමුදලේ අරමුණ වී තිබෙන්නේ ණය ගැණුම්කරු ඉතා ඉක්මනින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය නිර්බාධ ප්‍රතිපත්තියට අනුගත වීමට බල කිරීම බවද අපට පැහැදිලි වන්නේ ලංකාව වැනි රටවල් අද මුහුණ පා තිබෙන තත්වය නිසාය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අද ලොව බොහෝ රටවලට ණය පහසුකම් සපයන අන්තර්ජාතික බැංකු නිශ්චිත වශයෙන් නොවුණත් බොහෝ අවස්ථාවලදී ඔවුනොවුන් එකට එකතු වී කටයුතු කරන බව ඒවායේ ක්‍රියාකාරිත්වය තුළින් තහවුරු වේ.

1979දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණයක් ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට ජනතා විරෝධී ප්‍රතිපත්ති ගණනාවක් අනුගමනය කිරීමට සිදු විය. ආනයන සහ මිල පාලනයන් ඉවත් කිරීම, ණය ලබා දීමෙන් පසු ආහාර සලාකයට දෙන සහනාධාර අහෝසි කිරීම, විදේශ ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම සඳහා අපනයන සැකසුම් කලාප ස්ථාපිත කිරීම යනාදිය සිදු කරන ලද්දේ මූල්‍ය අරමුදලේ කොන්දේසි මතය. මෙම තත්වය වර්තමාන කොන්දේසි මගින් තවත් දුරට රැගෙන ගොස් ඇති බව පෙනී යයි.

මූල්‍ය ප්‍රතිපත්තියේ විනය නමැති ජනප්‍රිය කොන්දේසි මගින් වැඩි පොලී අනුපාතික මගින් මූල්‍ය ප්‍රසාරණය සීමා කිරීමද අයවැය හිඟය 'කළමනාකරණය කළ හැකි සමානුපාත' වල පවත්වා ගැනීම අවශ්‍ය වීම හේතුවෙන් මහජනයා වෙනුවෙන් කරන වියදම් නොඑසේනම් සහනාධාර කප්පාදුව සිදුකළ යුතුවීමද ජාත්‍යන්තර අරමුදලේ කොන්දේසි අතර විශේෂිත තත්වයන් වේ.



**ජෝසප් ඊ. ස්ටිග්ලිට්ස්** (Joseph E. Stiglitz)

*ආර්ථික විද්‍යාව පිළිබඳ නොබල් ත්‍යාගලාභියෙකි, කොලොම්බියා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකි, 1997-2000 කාලයේ ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික විශේෂඥයා විය.*

“

තමන්ගේ (IMF හි) වැඩසටහන් වැඩකරන බව පෙන්වීම සඳහා ඉලක්කම් ‘එකතු කරමින්’ ආර්ථික පුරෝකථනයන් සකසන ලදී. මේ සංඛ්‍යා භාවිත කළ බොහෝ දෙනෙක් ඒවා සාමාන්‍ය පුරෝකථනයන්ගෙන් වෙනස් වන බව නොදැන සිටියහ. මෙබඳු අවස්ථාවලදී දළ දේශීය නිෂ්පාදනය පිළිබඳ අනාවැකි, සංකීර්ණ සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමවේදයන් මත පදනම් නොවූවා පමණක් නොව ආර්ථිකය පිළිබඳ හොඳින් දන්නා අයගේ ඇස්තමේන්තුවලටවත් අනුකූළ නොවීය. ඒවා IMF වැඩසටහනේම කොටසක් වශයෙන් ‘කතාබහ කර ගන්නා ලද’ හුදු ඉලක්කම් පමණක් විය.

”

*‘ගෝලීයකරණය හා එහි අසහනයන්’*
*(Globalization and Its Discontents) කෘතියෙනි*



# IMF සමඟ වාසේ

**චන්ද්‍රික අධිකාරි**

1948 නිදහසින් පසු ලංකාව මුහුණ දෙන දරුණුම ආර්ථික අර්බුදයට වර්තමානයේ මුහුණ දෙමින් සිටින බව මහ බැංකුවේ අධිපති නන්දලාල් වීරසිංහ මහතා පවසා ඇත. 2022 අප්‍රේල් 12 දින සිට ශ්‍රී ලංකාව සිය ණය ආපසු ගෙවීම් අත්හිටුවන ලදී. නිදහස ලැබූ දා පටන් ණය ගෙවීමට නොහැකි බව ප්‍රකාශ කිරීමට දින කිහිපයක් දක්වාම සංවර්ධනය නමැති මාවතේ ඉදිරියට යමින් සිටින රටක් ලෙස හැඳින්වූ ශ්‍රී ලංකාව දැන් ඉන්ධන, ගෑස් ටික පවා ගෙන්වා ගැනීමට විදේශ විනිමය නොමැති බංකොලොත් රටක් බවට පත්ව ඇත.

රට පත්ව ඇති මෙම අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඇති එකම විසඳුම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීම බව වත්මන් ආණ්ඩුවේ සෑම කෙනෙක්ම පිළිගනිති. රනිල් වික්‍රමසිංහ සහ රාජපක්ෂවරුන් පමණක් නොව සජිත් ප්‍රේමදාසද, මේ කාරණයේදී ඒකමතිකය.

1965 සිට මේ දක්වා 16 වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබාගෙන ඇති ශ්‍රී ලංකාව මෙවර ණය ගනු ලබන්නේ 17 වැනි වතාවටය. ඉහත ලබාගත් ණය නිසා ලංකාව තම ණය බර වැඩි කර ගැනීම විනා වෙනත් යහපතක් අත්කරගෙන ඇතැයි සිතිය හැකි සාධක නොවේ. මේ මොහොතේද පාලකයන් මෙම ණය මඟින් රටේ ගැටලුවලට විසඳුම් ගෙනෙන බව කීවද සිදු වන්නට යන්නේ තවදුරටත් ප්‍රශ්න කල් දැමීම සහ ණය බර වැඩිකර ගැනීම විනා අන් යමක් නොවේ.

විකල්ප ප්‍රතිපත්ති සඳහා කැනේඩියානු මධ්‍යස්ථානය (CCPA) නම් සංවිධානය මඟින් නිකුත් කරන 'ද මොනිටර්' (The Monitor ) සඟරාවේ 2003 ජූලි/අගෝස්තු කලාපවලට ලිපියක් ලියන ජෝන් කැවේනා සහ ජෙරී මැන්ඩර් එම ලිපිය මඟින් තර්ක කරන්නේ ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුන්වන ලෝකයේ දුප්පත් රාජ්‍යයන් ණයට ඇබ්බැහි වූවන් බවට පත් කරවන බවයි.




"ආරම්භයේදී ණය යොදවනු ලැබුවේ රටේ අපනයන ආදායම්වලට වඩා වැඩියෙන් වියදම් වන යටිතල පහසුකම් සහ ආනයනයන් වෙනුවෙනි. කල්ගතවත්ම, පෙර ගනු ලැබූ ණයවලට පොලිය සහ මූලික මුදල ගෙවීම සඳහා වඩ වඩාත් වැඩියෙන් ණය ගැනීමට අවශ්‍ය විය. ණය ගැනීම එක්තරා අයුරක ආර්ථික ඇබ්බැහියක් බවට පත් විය. ණය නැවත ගෙවීමට සිදුවන විටදී දේශීය ආර්ථිකයන්ට පැටවෙන බර පිළිබඳව සුළුතරයක් පුරවැසි නිරීක්ෂකයින් හැරෙන්නට අන් කිසිවෙකු ගණන් ගන්නේ නැත."

ණය ඇබ්බැහියක් මෙන්ම උගුලක්ද වේ. ණය ලබා ගැනීමට නම් ඔවුන්ගේ කොන්දේසිවලට අවනත වන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ණය අපේක්ෂිත රටවලට බල කරයි. කැවේනා සහ මෙන්ඩර් මෙම ආයතනයන් විසින් පනවනු ලබන කොන්දේසි සහ ව්‍යුහාත්මක ගැලපුම් මඟින් අපේක්ෂිත දේවල් පිළිබඳ වසන් වන කාරණා මෙසේ දක්වයි.

"ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව මඟින් පහළ සහ අතරමැදි ආදායම් තත්වයේ රටවල් වෙත පටවනු ලැබූ ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළවල් තුළින් එම ප්‍රතිපත්තිවල බලපෑම ඉතාමත් නාට්‍යමය ආකාරයෙන් පෙන්නුම් කර තිබේ. ව්‍යුහාත්මක ගැළපුම් මගින් ආණ්ඩු ලවා පහත දේවල් කරගැනීමට බලාපොරොත්තු වේ."

1. අධ්‍යාපනය, සෞඛ්‍ය, පරිසරය සඳහා වන රජයේ වියදම් කප්පාදු කිරීම

2. ආහාර, ධාන්‍ය, පිසින තෙල් සහනාධාර කප්පාදු කිරීම

3. ජාතික මුදල් ඒකකය අවප්‍රමාණය කිරීම

4. අපනයන වැඩි කිරීම හා අපනයන ඉලක්ක කරගත් විදේශීය ආයෝජකයන් සඳහා සහනාධාර සැපයීම, ඉඩ ප්‍රස්ථා ලබාදීම

5. මූර්ත වැටුප් මට්ටම පහත දැමීම

6. ස්වභාවික සම්පත් කොල්ලකෑම වේගවත් කිරීම

7. අවම හෝ සමහරවිට කිසිම ප්‍රයෝජනයක් නොමැතිව අනුමානයන් මත පදනම්ව සමහර ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ ලිහිල් කිරීම. (මෙමඟින් රටවල් තුළ දැවැන්ත මූල්‍ය අස්ථාවරභාවයක් ඇති කරයි)

8. ආනයනයන් මත තීරුබදු සහ අනෙකුත් පාලනයන් ඉවත් කිරීම මඟින් ආනයනයන් ඉහළ දැමීම

9. ණයට ගන්නා ලද විදේශ විනිමය වැය කරමින් පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ දැමීම

10. ලාභ විදේශ ආනයනයන් සමඟ තරග කළ නොහැකි වන පරිදි දේශීය කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය දුර්වල කිරීමට කටයුතු කිරීම (ඒ සඳහා වන සහනාධාර කපා හැරීම)

වඩාත් පොදු කරුණ වශයෙන් මේවා දැක්විය හැකි අතර එක් එක් රටවල්වලට ණය ලබා දීමේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි පරීක්ෂා කිරීමෙන් මෙය වඩා හොඳින් අනාවරණය කරගත හැකිය.

ඉහත කරුණු සාරාංශ වශයෙන් ගතහොත් පහත නිගමනයන්ට එළැඹිය හැක.

1. ලංකාව මීට පෙර 16 වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබාගෙන ඇතත් එමඟින් ලංකාව ණය බරින් නිදහස්ව සංවර්ධනයේ මාවතකට එළඹ නැත.

2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මැදි හා පහළ ආදායම් ලැබෙන රටවල් ණයට ඇබ්බැහි කරවන අතර ණය උගුලක සිර කරයි.

3. ණය උගුලෙහි සිරවූ රටවල් මත පටවන ව්‍යුහාත්මක ගැළපුම් මඟින් තව තවත් ණය අර්බුදයෙහි ගිලෙන එම රටවල් ආර්ථික අර්බුදයට ගමන් කරන අතර එහි වාසිය දියුණු රටවල් අතළොස්සක් මඟින් අත්කර ගනී.

මේ වනවිට ලංකාවේ ප්‍රවාහන, මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය ධුරය දරන ආචාර්ය බන්දුල ගුණවර්ධන මීට දශක කිහිපයකට පෙර "ලෝක බැංකුව - මූල්‍ය අරමුදල හා ශ්‍රී ලංකාව" නමින් කෘතියක් රචනා කරන ලදී. ඒ වන විට මතවාදීමය වශයෙන් ඉහත ආයතනයන්ට එරෙහිව සිටි ඔහු ඉහත කෘතිය රචනා කරන්නේම ඉහත ආයතනයන්හි දේශපාලනය හෙළිදරව් කිරීම සඳහාය. ලෝක ආර්ථිකය කේන්ද්‍රීය ධනපති රටවල් බහුජාතික සමාගම්වලට අවශ්‍ය ලෙස හැසිරවීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (IBRD) සහ ලෝක වෙළෙඳ සංවිධානය (WTO) කටයුතු කරන ආකාරය පෙන්වා දීමටය. එම කෘතියෙහි ඔහු විසින් "නිව් ඉන්ටර්නැෂනලිස්ට්" සඟරාවෙහි පළවූ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ආර්ථික විශේෂඥයෙකු ලෙස වසර 12ක් සේවය කොට ඉන් ඉවත් වූ ඩේවිඩ්සන් එල්බුඩුගේ ප්‍රකාශයක් උපුටා දක්වයි.

"කිසිම රටක් දියුණුවේ මඟට යොමු කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමත් වූ බවට සාක්ෂි නොමැත." යැයි පවසමින් අරඹන එල්බුඩුගේ ප්‍රකාශය මේ සඟරාවෙහි 43 පිටුවේ උපුටා දක්වා ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සැබෑ ප්‍රායෝගික භාවිතය පිළිබඳ එයටත් වඩා පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවන තරම්ය.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබාගෙන ආර්ථික අර්බුදයෙන් මිදීම යන්න කිසිවිටක සිදු නොවන තමාගේ හිසකෙස්වලින් ඇද තමන්වම ගොඩ ගන්නා ආකාරයේ ප්‍රබන්ධ කටයුත්තකි. එහෙත් ලංකාවද ඇතුළු ලෝකයේ බොහෝ රටවල් තමාගේ හිසකෙස්වලින් ඇද තමාවම ගොඩගැනීමට වෙහෙසෙමින් සිටී.**

මැංචෝසන් චාරිකා නම් ප්‍රබන්ධ කතාවෙහි එන මැංචෝසන් නම් පුද්ගලයා අශ්වයෙකු පිටෙහි යන විට මඩ වගුරක ගිලෙන්නට පටන් ගනී. එවිට ඔහු තමාගේම හිසකෙස්වලින් අල්ලා ඇද අශ්වයාවත්, තමාවත් මඩ වගුරෙන් ඉවතට ගනී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබාගෙන ආර්ථික අර්බුදයෙන් මිදීම යන්න කිසිවිටක සිදු නොවන තමාගේ හිසකෙස්වලින් ඇද තමන්වම ගොඩ ගන්නා ආකාරයේ ප්‍රබන්ධ කටයුත්තකි. එහෙත් ලංකාවද ඇතුළු ලෝකයේ බොහෝ රටවල් තමාගේ හිසකෙස්වලින් ඇද තමාවම ගොඩගැනීමට වෙහෙසෙමින් සිටී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය, උපදෙස් අනුව මඩ වගුරෙන් ගොඩ ඒමට උත්සහ දරයි. එසේ ගොඩට පැමිණි කොපමණ රටවල් ප්‍රමාණයක් ලෝකයේ ඇත්ද යන්න අපි ප්‍රවේසමෙන් සලකා බැලිය යුතුය.

## ලෝකයේ සංවර්ධිත රටවල්

ලෝකයේ සියලුම රටවල් අත්පත් කරගෙන ඇති ආර්ථික මට්ටම් අනුව සංවර්ධිත, සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත වශයෙන් බෙදා වෙන් කර ඇත. ඉතා සරලවම පවසන්නේ නම් දුප්පත් හා පොහොසත් රටවල් වශයෙන් බෙදා වෙන්කොට ඇත. මෙහිදී ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් ඌණ සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් යටතට වැටෙන අතර ඉතාම කුඩා රටවල් ප්‍රමාණයක් සංවර්ධිත රටවල් යටතට ගැනේ. දැනට ලෝකයේ පවතින රටවල් 195ක් පමණ සංඛ්‍යාවෙන් සංවර්ධිත යන වර්ගීකරණය ගත හැකි රටවල් ඇත්තේ 37ක් පමණ වේ."ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා සංවිධානය" (OECD)ට අයත් වන්නේ මෙම රටවල් 37යි. "සංවර්ධිත රටවල් සංගමය" (Developed Countries Club) යනුවෙන් හඳුන්වන්නේද මෙම රටවල් 37යි.

1960 සංවිධානය ආරම්භ වූ අතර ආරම්භයේදීම එහි සාමාජිකත්වය ලැබූ රටවල් 20ක් වන අතර අනෙක් ඒවා වරින් වර එහි සාමාජිකත්වය ලැබීය.



1961 ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය, තුර්කිය, ස්විට්සර්ලන්තය, ස්වීඩනය, ස්පාඤ්ඤය, නෝර්වේ, නෙදර්ලන්තය, පෘතුගාලය, පෝලන්තය, ලක්සම්බර්ග්, අයර්ලන්තය, අයිස්ලන්තය, ග්‍රීසිය, ජර්මනිය, ප්‍රංශය, ඩෙන්මාර්කය, කැනඩාව, බෙල්ජියම, ඔස්ට්‍රියාව 60 දශකයේම පින්ලන්තය, ඉතාලිය, ජපානය යන රටවල්ද මෙම සාමාජිකත්වය ලබාගත් රටවල්ය. ඉන්පසු ඕස්ට්‍රේලියාව, චෙක් ජනපදය, හංගේරියාව, කොරියාව, මෙක්සිකෝව, නවසීලන්තය, පෝලන්තය ඊට ඇතුළත් විය.

2000න් පසු ස්ලොවැකියාව, ස්ලෝවේනියාව, ඊශ්‍රායලය, එස්තෝනියාව, කොස්ටරිකාව, කොළොම්බියාව සහ චිලිය ඊට ඇතුළත් වීය.

මේ රටවල් වැඩි ප්‍රමාණයක් යුරෝපීය රටවල් වන අතර ඒවා බොහොමයක් යටත් විජිත පවත්වා ගෙන ගිය රටවල් බවද මේ දෙස බැලූ විට ඔබට පෙනේ. ලතින් ඇමෙරිකානු රටවල් ලෙස චිලිය සහ මෙක්සිකෝවත්, ආසියානු රටවල් ලෙස ජපානය සහ කොරියාවත්, ඊට අයත් වේ. අප්‍රිකානු රටවල් කිසිවක් මෙතෙක් ඊට අයත්ව නැත.

ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත යැයි වර්ගීකරණය වූ රටවල් සංවර්ධිත රටවල් වල තත්වයට පත්වීම සඳහා උත්සාහ කළද එම තත්වයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවේ. මෙම තත්වය ඉතා දිගු කාලයක් තිස්සේ අපිට එන තත්වයකි.

1944 බ්‍රෙටින්වුඩ් සමුළුව මඟින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව ගොඩනඟන්නේ මෙම ගැටලුවට පිළියම් සෙවීම සඳහා යැයි පවසමිනි. නමුත් ගතවූ දශක 7 - 8 ක නිරීක්ෂණ වලින් පෙනී යන්නේ මෙම ආයතන ලෝකයේ රටවලට සංවර්ධනය වීම සඳහා, ආර්ථික අර්බුදයන්ගෙන් ගොඩ ඒම සඳහා උදව් කරනවා වෙනුවට, ලෝකයේ ආධිපත්‍ය අත්පත් කරගත් ප්‍රමුඛ ආර්ථිකයක් සහිත විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ ධනවාදී ලෝකයට අවශ්‍ය ලෙස ලෝක රටාව පවත්වාගෙන යාම සඳහා, ලෝකයේ රටවල් හීලෑ කිරීම සඳහා කටයුතු කරන බවය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මෙහෙයුම් බලය ඇති රටවල් විසින් තමන්ට රිසි පරිදි ලෝකය හැසිරවීමට, ඒ රටවල සම්පත්, දේපළ කොල්ල කෑමට තම මූල්‍ය ප්‍රාග්ධනය මෙහෙයවනු ලබන්නේ මෙම ආයතන මගිනි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රශ්න විසඳීම සඳහා මැදිහත් වූ රටවල් කිහිපයක් ගෙන පරීක්ෂා, කිරීමෙන් මෙය පැහැදිලි කරගත හැක.

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ඉන්දියාව

IMF ණය මගින් ප්‍රශ්න බේරාගත් රටවල් මොනවාද යන ප්‍රශ්නයට ඉන්දියාව නිදර්ශනයක් ලෙස සැපයේ.

ඉන්දියාවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අවස්ථා ගණනාවකදීම ණය ආධාර ලබාගෙන ඇත. පළමුවරට 1957 වසරේදී ණය ලබා ගත් ඉන්දියාව 1962, 1963, 1965, 1981 යන වසරවලදීද නැවත නැවතත් ණය ලබාගෙන ඇත. 1991 ජනවාරි සහ නැවත ඔක්තෝබර් මාසයේදී දෙවරක්ම ණය ලබාගෙන ඇත.

1991 වසරේදී ඉන්දියාව ලබාගත් IMF ණය සහ ඒ සඳහා පනවන ලද කොන්දේසි ඉන්දීය ආර්ථිකයට,

ජන ජීවිතයට කරන ලද බලපෑම අධ්‍යනය කරමින් "ඉන්දීය විප්ලවවාදී ශිෂ්‍ය සම්මේලනය (AIRSF)" විසින් අධ්‍යන වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත.

බොහෝ විට මෙම ණය පිළිබඳ කටයුතු පූර්ණ විනිවිදභාවයකින් සිදු නොවේ. ලංකාවේ අත්දැකීම එය වන අතර ඉන්දියාවට IFM ලබාදුන් ණය පිළිබඳවද සමස්ත ඉන්දීය විප්ලවවාදී ශිෂ්‍ය සංගමය පවසන්නේ මෙවැන්නකි. පහත ඡේදය එම වාර්තාවෙනි. "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබාදුන් වත්මන් ණයට අදාළව යොදා ඇති කොන්දේසි පිළිබඳව සම්පූර්ණ අවබෝධයක් ලබාගත හැකි වන්නේ ඒ සම්බන්ධ ලේඛන ප්‍රකාශයට පත්කළ විට පමණය. නමුත් අතීත අත්දැකීම් සලකන විට, ආණ්ඩුව සියලු තොරතුරු හෙළිදරව් කරනු ඇතැයි සිතිය නොහැක. දැනටමත් වැරදි තොරතුරු බොහොමයක් ඇත."

ණය මුදල ලබාදීමට දින නියමව පැවතියේ 1991 ඔක්තෝබර් 31 දා වන අතර ජූලි මාසයේ මුල් සතිය තුළදී විදේශ මුදල් ඒකකයන්ට සාපේක්ෂව ඉන්දීය රුපියල අඛණ්ඩව අවප්‍රමාණය වන්නට පටන් ගත්තේය. එය ප්‍රතිශතයක් ලෙස 20% ක් පමණ වේ. මෙය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලපෑමෙන් සිදු වුණද ඉන්දීය මුදල් ඇමතිවරයා එය තදින් ප්‍රතික්ෂේප කළේය. ණය ලබාගැනීමේ අරමුණින් රජය ක්‍රියා කළේ ඉතා අත්තනෝමතික ස්වභාවයෙනි.

මෙහි මූලික ප්‍රතිවිපාකය වන්නේ, ඉන්දීය ආර්ථිකයේ ස්වෛරීභාවය විනාශ වී යාමය. එමෙන්ම ඉන්දියානු පොදු ජනයාට ඉන් ඇතිවන අනිසි ප්‍රතිවිපාක රාශියකි. මෙය ආර්ථිකය තුළ ඇති වූ තත්වයක් මත සිදු වූ අවප්‍රමාණය වීමකට වඩා අධිරාජ්‍යවාදී වුවමණාව තෘප්ත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිදුකරන ලද බලපෑමකට යටවීමක්, ඉන්දීය ස්වෛරීත්වය නිග්‍රහයට හා හෑල්ලුවට ලක් කිරීමක් ලෙස AIRSF පවසයි.

ඉන්දීය රුපියල අවප්‍රමාණය වීමත් සමඟම බොරතෙල් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන ආනයනය සඳහා වන ඉන්දියාවේ බිල්පත් ඉහළ යනු ඇති අතර ඒ අනුව සියලුම භාණ්ඩවල මිල ඉහළ යනු ඇති බවත් එනිසාම උද්ධමනය ඉහළයාම සිදුවන බවත් එහි බර දුගී හා මධ්‍යම පාංතික පිරිස් මත පැටවෙන බවත් AIRSF සඳහන් කරයි.

IMF ණය ලබාගැනීම සඳහා අද ලංකාව පොරොන්දු වී ඇති කොන්දේසිවලටම ඉන්දීය රජයද එකඟ වී ඇත. එහි ප්‍රතිවිපාකද ලංකාව මුහුණ දෙන ආකාරයේ ඒවාය. එනම්, උද්ධමනය, සහනාධාර කප්පාදුව, වේතන වැඩිකිරීම්වලට බාධා සිදුකිරීම සහ සාමූහික කේවල් කිරීම බාධාවට ලක්කිරීම, පෞද්ගලීකරණය, විදේශ ණය වර්ධනය වීම, අධිරාජ්‍යවාදීන්ට සහ බහුජාතික සමාගම්වලට ඉන්දියානු වෙළඳපොළ බන්දේසියක තබා දීම ආදිය වේ.

ඉන්දියානු රජය ණය ලැබීමටත් පෙරම ඉන්දියානු ආර්ථිකය සම්පූර්ණයෙන්ම විදේශ ආයෝජකයන් සඳහා විවෘත කර ඇත. ලෝක බැංකුවේ නිර්දේශයන්ට අනුකූල වන පරිදි ලිබරල් වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදී. විදේශ ආයෝජන පාලනය කරන නීති ලිහිල් කිරීම මෙන්ම පෞද්ගලීකරණයට ඉඩ දීමද සිදු



වීය.

ඉන්දියාවේ පැවති රාජ්‍ය මැදිහත්වීම සහිත ආර්ථිකය වෙනුවට රාජ්‍ය ආර්ථිකයට මැදිහත්වීම බාධාකාරී ලෙස සලකන සහ නවලිබරල් ප්‍රතිපත්තිය ඔසවා තබන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගැනීමෙන් ප්‍රශ්න විසඳාගත් රටකට උදාහරණයක් ලෙස ඉන්දියාව ගැන නිතරම කියවෙනු දැකිය හැකිය. එහෙත් ඒ පිළිබඳ අධ්‍යයනය කළ AIRSF පවසන්නේ කුමක්ද?

"ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ණයෙහි අහිතකර ප්‍රතිපල ලැයිස්තුව අවසන් කළ නොහැක. තුන්වන ලෝකයේ රටවල ජනතාව සූරාකෑමටද, මර්ධනය කිරීමටද, අහිතකර ප්‍රතිපත්ති විශාල ප්‍රමාණයක් අධිරාජ්‍යවාදීන් සතුව ඇත. අධිරාජ්‍යවාදී බලයන්ගේ ග්‍රහණයෙන් ජනතාව ගලවා ගැනීමට හැක්කේ අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් කිරීමෙන් සහ විකල්ප සෙවීමෙන් පමණි."

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල උප සහරා අප්‍රිකාවේ සිදු කළ මැදිහත්වීම

(මෙහි අඩංගුව africaw.com වෙබ් අඩවියෙහි පළවූ How the world bank and the IMF destroy Africa නම් ලිපියෙනි.)

ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ යුරෝපයේ ආර්ථිකයන් යළි ගොඩනැගීම සඳහා පිහිටුවන ලදී. කෙසේ වෙතත්, ලෝක බැංකුව සහ IMF ඔවුන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා, ඔවුන් දුප්පත් රටවලට ණය ලබා දීමට පටන් ගත් නමුත් එසේ කළේ දුප්පත් රටවල් ඔවුන්ගේ ආර්ථිකයන් පෞද්ගලීකරණය කර බටහිර සංගතවලට ඔවුන්ගේ අමුද්‍රව්‍ය සහ වෙළඳපොළට නොමිලේ ප්‍රවේශ වීමට ඉඩ දුන්නේ නම් පමණි. එය දිළිඳු උගුලක් වූ අතර බොහෝ දුප්පත් රටවල් එය තේරුම් ගත්තේ බොහෝ ප්‍රමාද වීමෙන් පසුවය.

අද අප්‍රිකාවේ මුහුණ දෙන බොහෝ ප්‍රශ්නවල ආරම්භය එයයි. දැන් අප්‍රිකාව සිටින්නේ දරිද්‍රතාවයේ විෂම චක්‍රයක වන අතර එයින් මිදීමට මගක් නොමැති බව පෙනේ. දුප්පතුන් දිගටම දරිද්‍රතාවයෙන් මිය යද්දී බටහිර සංගත සමෘද්ධිමත් වේ. දුප්පතුන් තවත් දුප්පත් වන අතර ධනවතුන් පොහොසත් වේ. අප්‍රිකාවේ සහ ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල මිනිසුන් අන්ත දරිද්‍රතාවයෙන් හා කුසගින්නෙන් දිගටම මිය යති, නමුත් මේ සියල්ල පිටුපසම ලෝක බැංකුව, IMF සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) සිටින බව බොහෝ දෙනෙක් නොදනිති. මෙය ධනවත් බටහිර සංගත සාගින්න සහ මරණය මහා විනාශයේ ආයුධ ලෙස භාවිතා කරන නව ආකාරයේ යුද්ධයකි.

වෙනත් වචන වලින් කිවහොත්, ලෝක බැංකුව, IMF සහ WTO ලෝකයේ සෑම සංවර්ධනය වෙමින් පවතින රටකම පාහේ ප්‍රගතියේ ත්‍රිත්ව සතුරන් වේ. දැන් අපි බලමු ලෝක බැංකුව, IMF සහ WTO උප සහරා අප්‍රිකාවේ ක්‍රියාත්මක වන ආකාරය. උදාහරණයක් ලෙස ඝානාව වැනි රටක් ගනිමු. ඝානාව ස්වභාවික සම්පත් බහුල රටකි. ලෝක බැංකුව සහ IMF ස්වභාවික සම්පත් සහ වෙළඳපළ පහසුවෙන් පාලනය කළ හැකි ඝානාව වැනි රටවලට ඉතා උනන්දුවෙන් මැදිහත් වෙති. (1966 සිට 2015 දක්වා 16 වතාවක් ඝානාව IMF ණය ලබාගෙන ඇත.)

ඝානාවේ උතුරු ප්‍රදේශවල සමෘද්ධිමත් සහල් ගොවි ප්‍රජාවන් සිටි අතර ඝානා රජය එම සහල් නිපදවන ගොවීන්ට ජාතිය පෝෂණය කිරීම සඳහා මහා පරිමාණයෙන් සහල් නිෂ්පාදනය කිරීමට හැකි වන පරිදි ගොවි සහනාධාර කිහිපයක් ලබා දුන්නේය. කෙසේ වෙතත්, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නැඟී සිටිමින් ඝානා රජයට පැවසුවේ රජය දුප්පත් සහල් ගොවීන්ට ලබා දෙන ගොවි සහනාධාර කපා හරින්නේ නම් මිස ඝානාව සඳහා තවත් ණයක් අනුමත නොකරන බවයි. එයට ප්‍රධානතම හේතුව වූයේ ඝානාව එක්සත් ජනපදය වැනි බටහිර රටවලින් (ලෝක බැංකුවේ සහ IMF හි ප්‍රධාන හවුල්කරුවෙකු) සහල් ආනයනය කිරීමට සිදු වන තැනට පත් කිරීමය. දැන් ඝානාව සෑම වසරකම විශාල මිල ගණන් යටතේ සහල් බොහොමයක් පිටරටින් ආනයනය කරයි. අවසානයේදී ඝානාව ලෝක බැංකුවට සහ IMF වෙත විශාල මුදලක් ණය වී ඇත. නමුත් එම මුදල් ඝානා ආර්ථිකයේ රැඳී නොසිටියේ පිටරටින් ආහාර ආනයනය කිරීමට ඝානාවට ණය භාවිතා කිරීමට සිදු වූ බැවිනි.

ඝානාවේ සහල් නිපදවන ප්‍රජාවන්ට ජාතිය පෝෂණය කිරීමට ප්‍රමාණවත් සහල් නිෂ්පාදනය කිරීමට සහ වැඩි ලාභයක් ලබා ගැනීම සඳහා යම් ප්‍රමාණයක් පිටරටට අපනයනය කිරීමට පවා උදව් කළ හැකිව තිබුණි. දැන් ඝානාවේ උතුරු ප්‍රජාවන් බොහෝ ප්‍රදේශවල වඩා හොඳ රැකියා නොමැති සහ කිසිසේත්ම අවස්ථා නොමැතිව රටේ දුප්පත්ම අය බවට පත්ව ඇත. වයස අවුරුදු නවයක් තරම් කුඩා පිරිමි ළමයින් සහ ගැහැනු ළමයින් රටේ දකුණු ප්‍රදේශවලට කුමාසි සහ ඇක්‍රා වැනි

ප්‍රධාන නගරවලට සංක්‍රමණය වේ (ළමයින්ට ඉතා භයානක ගමනකි.) සියලු දෙනා රැකියා සොයමින් යන්නේ ඔවුන්ගේ දුප්පත් මියයමින් සිටින පවුල් රැකබලා ගැනීමටය. මේ ළමයින්ගෙන් බහුතරයක් නැවත ගෙදර නොපැමිණෙති. සමහරු මගදී මිය යන අතර ඇතැමුන් පෙරට වඩා නරක ලෙස ආපසු පැමිණෙති. මුදල් ආපසු ගෙවූවද ඔවුන්ට ඇති ණය අවසන් නොවේ. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෝක බැංකුවට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට විශාල වශයෙන් ණය ගෙවන්නේ එබැවිනි. සමහර විට ඔබට "ණය අවලංගු කිරීම්" ඇසෙන අතර ඔවුන් දුප්පත් රටවලට ණය සමාව (කපා හැරීම්) දෙන බව ඔබ සිතනු ඇත, නමුත් යථාර්ථයේ දී එය ක්‍රියාත්මක වන්නේ එසේ නොවේ.

ලෝක බැංකුව සහ IMF කිසිවිටක සමාව නොදෙන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙම ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු විශාල ණය නිසා, ඔවුන් (මෙම ආයතනවල ප්‍රධාන හවුල්කරුවෙකු ලෙස එක්සත් ජනපදය ද ඇතුළුව) එම දුප්පත් රටවල සියලු කටයුතු පාහේ පාලනය කරයි. වෙනත් වචනවලින් කිවහොත්, ඔබ ලෝක බැංකුව සහ IMF පවසන දෙයට අවනත නොවන්නේ නම්, ඔබ ණය ආපසු ගෙවිය යුතු අතර ඔබට ණය ආපසු ගෙවිය නොහැකි නිසා, ඔවුන් ඔබට ලබාදුන් සෑම උපදෙසකටම ඔබ අවනත විය යුතුය. මෙම මූල්‍ය ආයතනවලට විරුද්ධ වූ හෝ අකීකරු වූ නායකයන්ගේ ඕනෑම රටක් "ඒකාධිපති" හෝ "ත්‍රස්තවාදී" රටක් ලෙස සලකනු ලබන අතර බොහෝ අවස්ථාවල එම නායකයින් ඉවත් කරනු ලැබේ.

නිදසුනක් වශයෙන්, යම් සංවර්ධනය වෙමින් පවතින රටක (ලෝක බැංකුවට ණයගැති) තෙල් සොයාගැනීමක් සිදු වූ විට සහ එම රටේ නායකයා සහයෝගයෙන් කටයුතු කිරීමට සූදානම් නැති විට (හැසිරවීම සඳහා බටහිර සමාගම් විසින් අත්පත් කර ගැනීමට) තීරණය කරනු ලැබේ. බොහෝ විට කැරැල්ලකින් හෝ යුද්ධයෙන් රජය හෝ රට ඉක්මනින් විනාශ කරයි. උදාහරණයක් ලෙස ඉරාකය, ලිබියාව, සුඩානය, ආදිය දැක්විය හැක.





**නයෝමි ක්ලේන්** (Naomi Klein)

*බ්‍රිටිෂ් කොලොම්බියා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරියකි, කැනඩා ජාතික සමාජ ක්‍රියාකාරිනියකි, ගත්කතුවරියකි.*

“ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ‘ස්ථායීකරණ වැඩසටහන්’ ලෙස හඳුන්වනු ලබන දෙය පිළිබඳව නොකියන කථාන්දරයක් තිබේ. ඔවුන්ට රටවල් යනු වෙළඳපොළ නම් දරුණු රළ නගින සාගරයේ ඉහළ විසිවෙමින් ඇති නෞකාවන්ය. ඔවුන් අවසානයේ ඒවා ස්ථාවර කරනු ඇත. එහෙත් නව සමතුලිතභාවය අත්කර ගනු ලබන්නේ මිලියන සංඛ්‍යාත ජනතාවක් නැව් තට්ටුවෙන් ඉවතට තල්ලු කර දමමිනි. ඒ අතරට රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්, කුඩා ව්‍යාපාර හිමියන්, දිළිඳු ගොවීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් ඇතුළත්ය. ‘ස්ථායීකරණයේ’ අවලස්සන සත්‍යය වනුයේ “මෙයින් අති බහුතරයකට කිසිදා නැවත නෞකා තට්ටුව මතට නැග ගැනීමට නොහැකි වනු ඇත” යන්නය. ඔවුන්ට සිදුවනු ඇත්තේ දැනටමත් බිලියන 01ක ජනගහනයක් ජීවත් වන මුඩුක්කු කරා පසුබැසීමටය. ගණිකා නිවාසවල හෝ බහාලුම් තුළ ජීවත් වන්නටය. මුල් සිඳුණු ජනතාවක් බවට පත් වන්නටය. ජර්මානු කිවි රේනර් මරියා රයික් විස්තර කළ පරිදි ‘අතීතයට හෝ අනාගතයට යන කිසිවකට අයත් නොවන්නවුන්’ බවට පත්වීමටය. ”

*කම්පන ධර්මතාවය: ආපදා ධනවාදයේ නැගීම*
*(The Shock Doctrine: The Rise of Disaster Capitalism)*




# දකුණු කොරියාව සහ IMF අර්බුදය

**_බිමල් රත්නායක_**

දකුණු කොරියානු මූල්‍ය අර්බුදයේ මුල් ඇත්තේ, කොරියානු ආර්ථිකයේ පදනමේ ම ඇති දුර්වලතා තුළ ය. 1960-1980 දක්වා ආණ්ඩුව මුල් වූ, ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොර හමුදා පාලනයකින් මෙහෙයවන ලද අඩු වැටුප්, දරුණු කම්කරු කොන්දේසි, ආණ්ඩුවේ සෘජු ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ආදිය මඟින් ආරම්භ කරන ලද දූෂණයෙන් පිරි කොරියාවේ ධනවත් පවුල් කිහිපයක් (Chaebol) මුල් කර ගත් මහා පරිමාණ සමාගම් (Samsung, Hundai, Daywoo වැනි) මත පදනම් වූ ආර්ථිකය 1980 පමණ සිට දුර්වල වන්නට විය. එයට බලපාන ලද්දේ ඉන්දුනීසියාව, තායිලන්තය, මැලේසියාව, චීනය වැනි රටවල් ද කොරියාවට තරගකාරී මට්ටමක කාර්මිකකරණයට පත් වීමත්. එම රටවල් ද අඩු වැටුප්, දරුණු කම්කරු කොන්දේසි මොඩලය ක්‍රියාත්මක කිරීමත්, 1985දී පමණ ඇමෙරිකාවේ ද එකඟතාව මත ජපන් යෙන් අවප්‍රමාණ කිරීම නිසා (මිල අඩු වීම හරහා) ජපාන භාණ්ඩවලට අන්තර්ජාතික වෙළෙඳපොළේ වැඩි ඉඩක් ලැබීමත්, 1987දී දකුණු කොරියාවේ ඇති වූ හමුදා පාලනයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය මඟින් කම්කරු නීති සංශෝධනය කර වෘත්තීය සමිති ඇති කිරීම, සාමූහික කේවෙල් කිරීමේ අයිතිය ලබා ගැනීමට හැකි වීමත් නිසා ය. මීට අමතරව හිමිකාර පවුලක් මත කේන්ද්‍ර වූ සහමුලින් ම ආණ්ඩුවේ

රැකවරණය මත ක්‍රියාත්මක වූ මහා පරිමාණ පවුල් සමාගම්වල කළමනාකරණ ක්‍රමවේදය ද




නූතන සමාගම් කළමනාකරණයට වඩා පසුගාමී වීම ද මෙයට බලපාන ලදී.

1997 මූල්‍ය අර්බුදය ද පුපුරා යාමට බලපෑ ප්‍රධාන අභ්‍යන්තර හේතු සහ බාහිර සාධක දෙකක් මෙහි දී සඳහන් කළ හැකි ය. අභ්‍යන්තර කාරණය වූයේ මෙම මූල්‍ය අර්බුදය පුපුරා යාමට පෙර පවුල් කේන්ද්‍රීය මහා ව්‍යාපාර කිහිපයක් ම 1997 මුල දී ම බංකොලොත් වීමයි. එය ආරම්භ වූයේ කොරියාවේ 'චේබල්' (Chaebol) පවුල් ව්‍යාපාර සමූහයෙන් 14 වැනි විශාලතම ව්‍යාපාරය වූ 'හැන්බෝ ස්ටීල්' (Hanbo Steel) ආයතනය බංකොලොත් වීමයි. 1997 දෙසැම්බර් වන විට කොරියාවේ විශාලතම පවුල් සමාගම් 30න් හතක් එනම්, 'කියා මෝටර්ස්' (KIA Motors - 8 වැනි විශාලතම) ආයතනය වැනි ඒවා බංකොලොත් වී තිබූ අතර, එම නිසා එම සමාගම් බැංකුවලින් ලබාගෙන තිබූ අතිවිශාල ණය ගෙවීමට නොහැකි වී තිබිණි. 1997 අවසන් වන විට කොරියාවේ මූල්‍ය ආයතනවල පැහැර හරින ලද ණය ප්‍රමාණය 'කොරියානු වොන්' (Korean Won) ට්‍රිලියන 32ක් - දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 7ක් - වී තිබිණි. මෙය 1996දී තිබූ පැහැර හරින ලද ණය ප්‍රමාණය මෙන් දෙගුණයක් විය.

එයට බලපාන ලද ප්‍රධාන බාහිර හේතුව වූයේ ඒ වන විටත් තායිලන්තයේ මුදල් ඒකකය වන 'තායි බාට්' (Thai Baht) කඩාවැටීමත් සමඟ ආරම්භ වී තිබූ නැඟෙනහිර ආසියා මූල්‍ය අර්බුදයේ බලපෑමයි. එකක් නම්, අර්බුදයට ලක් වී තිබූ රටවල මූල්‍ය ඒකක කඩාවැටීම නිසා ඒවායෙන් අපනයනය කරන භාණ්ඩවල මිල තවත් අඩු වීම නිසා ඒ වන විටත් තරගකාරීත්ව අර්බුදයකට මුහුණ දී තිබූ කොරියාවේ තරගකාරී හැකියාව තවත් දුර්වල වී කොරියානු මුදල් ඒකකය ද අවප්‍රමාණ කිරීමට විශාල බලපෑමක් ඇති වීමයි. එබැවින්, කොරියානු වොන් මුදල 1997 නොවැම්බර් 30 පමණ කාලය තුළ දී සියයට 20කින් පමණ කඩාවැටිණි. දෙවැනි බාහිර හේතුව වූයේ 1999 ඔක්තෝබර් 23 වැනිදා හොංකොං (Hong Kong) හි 'හැන්ග් සෙන්ග් ඉන්ඩෙක්ස්' (Hang Seng Index) කොටස් වෙළෙඳපොළ කඩාවැටීම නිසා විදේශ ආයෝජකයන් කොරියානු කොටස් වෙළෙඳපොළෙන් ද වහා ම ඉවත් වීම නිසා කොරියානු කොටස් වෙළෙඳපොළ සියයට 30කින් පමණ කඩාවැටීමයි. මේ නිසා ම කෙටිකාලීන විදේශ ණය විශාල වශයෙන් ගෙවීමට සිදු වීම නිසා 1997 ඔක්තෝබරයේ දී ඇමෙරිකානු ඩොලර් බිලියන 22.3ක් වූ කොරියානු මහ බැංකුව සතුව තිබූ විදේශ සංචිත ප්‍රමාණය මසක් තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 7.3ක් දක්වා පහළ වැටිණි.

**අයි.එම්.එෆ්. (IMF) වැඩසටහන**

1997 දෙසැම්බර් 3 වැනිදා ඇමෙරිකාවේ ආශීර්වාදය ද ඇතිව කොරියාව අයි.එම්.එෆ්. ණය ගිවිසුමට අත්සන් කරන ලදී. එය එක්සත් ජනපද ඩොලර් 58.3ක ණයක් වූ අතර, 'සාර්ව ආර්ථික ස්ථායීකරණය, ව්‍යුහාත්මක

ගැළපුම් සහ කොන්දේසි රාශියකින් එය සමන්විත විය. අයි.එම්.එෆ්. මඟින් හදිසි අරමුදල් ලෙස එක්සත් ජනපද ඩොලර් බිලියන 14ක් ද පොරොන්දු විය. මීට අමතරව දෙවැනි පෙළ ආරක්ෂක අරමුදල් සැපයීම වෙනුවෙන් ඇමෙරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව සහ 'ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ' (OECD) අනෙකුත් රටවල් ද එක්සත් ජනපද ඩොලර් බිලියන 23.3ක් ද පොරොන්දු වූහ. අයි.එම්.එෆ්. වැඩසටහන ආරම්භයේ දී එක්සත් ජනපද ඩොලර් බිලියන 5.5ක් ලබා දුන් නමුත්, ජාත්‍යන්තර ණයකරුවන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ කිසිදු වැඩපිළිවෙළක් සාකච්ඡා නොකෙරිණි.

**අයි.එම්.එෆ්. මඟින් පැනවුණු කොන්දේසි :**

1. බංකොළොත් වී ඇති මූල්‍ය ආයතන බැංකු ද ඇතුළුව වහා ම වසා දැමීම. දෙසැම්බර් 2 වැනි දින බැංකු 9ක් වසා දැමිණි.

2. බැංකු පොලී අනුපාත සියයට 300කින් පමණ ඉහළ දැමීම. 1997 දෙසැම්බර් 1 වැනිදා සියයට 12.3ක් ද, 1997 දෙසැම්බර් 3 වැනිදා සියයට 20.7ක් ද, දෙසැම්බර් 23 වැනිදා සියයට 30.1ක් ද ලෙස ඉහළ නැංවිණි.

3. 1997 දෙසැම්බර් මුල එක්සත් ජනපද ඩොලර් 1 කොරියානු මුදල් ඒකකය වන වොන් 1,150 දක්වා ද, දෙසැම්බර් අග වන විට එක්සත් ජනපද ඩොලර් 1 වොන් 2,000 දක්වා ද පහත වැටිණි.

4. 1998 ජනවාරි 16 වැනිදා කොරියානු ආණ්ඩුව සහ බැංකු එයට ගෙවීමට ඇති ණය ගෙවීම නතර කරන බව නිවේදනය කරන ලද අතර, 1998 පළමු කාර්තුවේ ගෙවීමට තිබූ එක්සත් ජනපද ඩොලර් බිලියන 24ක කෙටිකාලීන ණය වසර 1-3ක් දක්වා කල් දමන ලදී.

එමඟින් වොන් මුදලේ කඩාවැටීම සහ කොරියානු කොටස් වෙළෙඳපොළේ බිඳවැටීම පාලනය විය.

5. අන්තර්ජාතික බේරුම්කිරීමේ බැංකුව (Bank for International Settlements - BIS) මඟින් වෙළෙඳ බැංකුවලට සියයට 4ක ප්‍රාග්ධන සංචිතයක් සහ අනෙකුත් වාණිජ බැංකුවලට සියයට 8ක ප්‍රාග්ධන සංචිතයක් තබා ගැනීමට කොන්දේසි පැනවීම.

6. බැඳුම්කර වෙළෙඳපොළට විදෙස් ආයෝජකයන්ට මැදිහත් වීමට එතෙක් සීමා කර පනවා තිබූ සියලු ම ප්‍රාග්ධන ගිණුමේ සීමාවන් ඉවත් කිරීම.

**අයි.එම්.එෆ්. වැඩසටහනෙහි ප්‍රතිවිපාක :**

1. බැංකු පොලී අනුපාත සියයට 30 සිට 40 දක්වා ඉහළ දැමීම නිසා සමාගම් ඒ වන විටත් මුහුණ දී තිබූ මූල්‍ය දුෂ්කරතා තවත් වැඩි වීම.

2. අන්තර් ජාතික බේරුම්කිරීමේ බැංකුව (BI) මඟින් බැංකුවල ප්‍රාග්ධන සංචිත වැඩි කිරීම නිසා සමාගම්වලට ණය දීමට බැංකු පැකිළීම.

3. ණය කල් දැමීම විදෙස් ණය හිමියන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම.

4. දේශීය ගිණුම් හිමියන් තම ගිණුම් විදෙස් බැංකුවලට ගෙන යාම.

5. ණයගැතිභාවයේ ගිලී තිබූ සමාගම්වලට ණය දීම බැංකු ප්‍රතික්ෂේප කිරීම නිසා විශේෂයෙන් ම කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර විශාල ලෙස බංකොළොත් වීම. එනම්, අර්බුදයට පෙර මෙන් සියයට 300කින් බංකොළොත් වීම වැඩි වීම.

**ව්‍යාපාර බංකොළොත් වීම**

1997 දෙසැම්බර් 3,197

1998 ජනවාරි 3,323

1998 මාර්තු 2,749

6. අයි.එම්.එෆ්. ණය ක්‍රියාත්මක කිරීමෙන් පසු දළ දේශීය නිෂ්පාදිතය (GDP) :

1998 කාර්තුව - I (-3.6)

1998 කාර්තුව - II (-7.2)

1998 කාර්තුව - III (-7.1)

1998 කාර්තුව - IV (-5.4)

ලෙස බිඳවැටිණි.

1998 වසර තුළ දළ දේශීය නිෂ්පාදිතය 1997 වසරට සාපේක්ෂව සියයට 5.8කින් බිඳවැටිණි.

7. 1998 වසර තුළ මිලියන 1.66ක රැකියා නැති වූ අතර, විරැකියාව සියයට 2.2 සිට 1998 දෙසැම්බර් වන විට සියයට 7.9ක් දක්වා වැඩි විය. 1998 වසරේ විරැකියාව සියයට 6.8ක් වූ අතර, 1997දී සියයට 2.6ක් විය.

8. ඒකපුද්ගල ආදායම

1996 එ.ජ. ඩොලර් 10,542

1997 එ.ජ. ඩොලර් 9,511

1998 එ.ජ. ඩොලර් 6,300

දක්වා බිඳවැටිණි.

9. වැටුප්වල මූර්ත අගය 1998දී 1997ට වඩා සියයට 2.5කින් බිඳවැටිණි.

10. 1997 ඔක්තෝබර් දක්වා සෑම මසක ම හිඟයක් පෙන් වූ ආණ්ඩුවේ ජංගම ගිණුමේ (Current Account) 1998දී එක්සත් ජනපද ඩොලර් බිලියන 40ක අතිරික්තයක් වාර්තා විය. මෙය අයි.එම්.එෆ්. ඉලක්කයකි. කෙසේ වුව ද, මෙම අතිරික්තය ඇති වූයේ

**සමාලෝචනය**

අයි.එම්.එෆ්. ණය වැඩසටහන කොරියාවේ ආර්ථික කඩාවැටීමේ සැබෑ හේතු හඳුනාගෙන නො තිබූ අතර ම එසේ හඳුනා ගැනීමට උත්සාහයක්ද නොගත්තේය. එහි සම්පූර්ණ අවධානය ;
(ස) ණය ආපසු ගෙවීම. (සස) මූල්‍ය වෙළෙඳපොළ ලිබරල්කරණය.
(සසස) කම්කරු නීති ලිබරල්කරණය.
(සඩ) වෙළෙඳුම ලිබරල්කරණය. (ඩග) රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය වැනි ඒවාට යොමු වී තිබිණි.

එය ආරම්භක මොහොතේදී කළ යුතුව තිබුණේ;
(i) ප්‍රාග්ධනය එළියට ගලා යාම සීමා කිරීම සහ දේශීය ආර්ථිකය ස්ථාවර කිරීමත්,
(ii) රටේ සැබෑ ආර්ථිකය (මූල්‍ය වෙළෙඳපොළ නොවේ.) කඩාවැටීම වැළැක්වීමට කටයුතු කිරීමත් ය. මධ්‍යකාලීන, දිගුකාලීන ව්‍යුහාත්මක ගැළපුම් අවශ්‍ය වූයේ මෙම හදිසි තත්ත්වය ඉක්මවා ගැනීමෙන් පසු දිගුකාලීන ආර්ථික ස්ථාවරතාව වෙනුවෙනි. නමුත්, අයි.එම්.එෆ්. වැඩසටහන ලබා දුන් හදිසි ප්‍රතිකාර කොරියානු අර්බුදය තවත් උග්‍ර කළ අතර, වැඩපිළිවෙළ වැරැදි බව වසරක් ඇතුළත එය පස් වතාවක් වෙනස් කිරීමට සිදු වීමෙන් සහ අයි.එම්.එෆ්. ප්‍රධානීන් විසින් පිළිගනු ලැබීමෙන්ම සනාථ වී තිබේ. නමුත්, එවිට අර්බුදය විනාශයක් වී අවසන්ය. ආර්ථික වර්ධනය අඩු වීම, ආර්ථික වර්ධනය සෘණ වී කඩාවැටීමත් කර අවසන්ය. තායිලන්තයට සහ ඉන්දුනීසියාවට ලබා දුන් අයි.එම්.එෆ්. ණය වැඩසටහන්ද හතර වතාවක් වෙනස් කර තිබිණ.

**- අයි.එම්.එෆ්. හි ආර්ථික ඉලක්ක සහ සැබෑ ප්‍රතිඵල 1998 -**

අපනයන වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස නොව ආනයන අඩු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

උදාහරණයක් ලෙස කොරියානු අපනයන 1997ට වඩා 1998දී සියයට 2.8කින් අඩු විය. කොරියානු ආනයනවල අඩු වීම සියයට 35.5ක් විය.

**කොරියානු මූල්‍ය වෙළෙඳපොළ ස්ථාවර කිරීමට අයි.එම්.එෆ්. වැඩපිළිවෙළ උදවු වීද?**

I. කෙටියෙන් ම ගතහොත්, අයි.එම්.එෆ්. ආරම්භක වැඩපිළිවෙළ වෙළෙඳපොළ ස්ථාවර කරනවා වෙනුවට එය තවත් අරාජික කළ අතර, අන්තර්ජාතික ආයෝජකයන් තුළ භීතිය තවත් වැඩි කළේ ය. එමඟින් ප්‍රාග්ධනය එළියට ගලා යාම වැඩි කර කොරියානු වොන් බිඳවට්ටන ලදී.

II. එය කොරියාවට ණය ලබා දී තිබූ විදේශීය පෞද්ගලික මූල්‍ය ආයතනවල ණය කැපීම, කල් දැමීම පිළිබඳව කිසිදු සත්‍ය, ප්‍රායෝගික මැදිහත් වීමක් නො කළේ ය. එබැවින්, පොරොන්දු වූ හදිසි විදේශ මුදල් සැපයුම වූ එක්සත් ජනපද ඩොලර් බිලියන 58.3න් 1997දී ලබා දුන්නේ එක්සත් ජනපද ඩොලර් 13.2 පමණි. එය මූල්‍ය වෙළෙඳපොළ ස්ථාවර කිරීමට ප්‍රමාණවත් නොවිණි.

III. අයි.එම්.එෆ්. වැඩසටහනෙන් අනිවාර්යය කළ
(i) බංකොළොත් මූල්‍ය ආයතන වසා දැමීම.
(ii) දැඩි අය-වැය පාලනය.
(iii) ඉහළ බැංකු පොලී අනුපාත ආදිය මඟින් මූල්‍ය වෙළෙඳපොළ ස්ථාවර කිරීම ඉලක්ක කර තිබිණි. එයින් සැබැවින් ම ආර්ථිකය විශාල පීඩනයකට ලක් විය. උදාහරණයක් ලෙස අධික බැංකු පොලී අනුපාත මඟිනුත්, දේශීය ඉල්ලුම අඩු වීම මඟිනුත් එතෙක් ලාභ උපයන ලද විශාල සමාගම් පවා බංකොළොත් වී ආර්ථිකය බිඳවැටීමට හේතු විය. බැංකු පොලී අනුපාතය සියයට 30ක මට්ටමේ පවතින විට ලොව ඕනෑ ම සාර්ථක සමාගමක් වුවත්, බිඳවැටීමට ඉඩ ඇති බව සාමාන්‍ය සත්‍යයකි.

IV. 1998 අගභාගයේ දී විශේෂයෙන් ම දේශීය ආර්ථිකය දුර්වල කරන මෙම සමහර වැරැදි ප්‍රතිකර්ම අයි.එම්.එෆ්. විසින් වෙනස් කරන ලදී. නමුත්, එවිට

අර්බුදය ආපසු හැරවීමට එය ප්‍රමාද වැඩි වී තිබිණි.

V. අයි.එම්.එෆ්. ණය සහමුලින් ම වෙන් වී තිබුණේ, ගත් ණය ගෙවීමට මිස සැබෑ ලෙස ම ආර්ථිකය ශක්තිමත් කිරීමට නොවේ. උදාහරණයක් ලෙස කර්මාන්තවලට සහ අපනයනවලට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම වැනි ආර්ථිකය ශක්තිමත් කරන ඒවාට අයි.එම්.එෆ්. ණය යොමු කර නොතිබිණි.

**අවසානය**

1. අයි.එම්.එෆ්. ණය වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟ කොරියානු ආර්ථිකය 2 Lows and 4 Highs ආර්ථිකයක් බවට පත් විය.

2 Lows

(i) අඩු ආර්ථික වර්ධනය

(ii) අඩු වැටුප්.

4 Highs

(i) ඉහළ භාණ්ඩ මිල.

(ii) ඉහළ විනිමය අනුපාතය.

(iii) ඉහළ විරැකියාව.

(iv) ඉහළ පොලී අනුපාත.

2. ආර්ථික වර්ධනය සහ ප්‍රසාරණය ඉලක්ක කර ගත් ආර්ථික මොඩලයක සිට අයි.එම්.එෆ්. ආර්ථික දර්ශනයට ගැළපෙන රටක් බවට කොරියානු ආර්ථිකය පරිවර්තනය කිරීම.

3. ජනතාව සතු රත්‍රන් එකතු කිරීමේ වැඩපිළිවෙළ 1998දී ආරම්භ වූ අතර, එය ජනතාව තුළින්ම ආරම්භ වූ සුවිශාල මහජන ව්‍යාපාරයක් විය. එමඟින් 1998 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දී රත්‍රන් ටොන් 227ක් එකතු වූ අතර, එය ඩොලර් බිලියන 2.13ක අගයකට සමාන විය.

4. දකුණු කොරියානු අර්බුදය බරපතළ වීමත් සමඟ ඇමෙරිකානු ජනාධිපති බිල් ක්ලින්ටන්ගේ නායකත්වයෙන් කොරියානු ආර්ථික සමුළුවක් 1998දී කැඳවා දකුණු කොරියාවට උදවු කිරීම (දකුණු කොරියාව තද ඇමෙරිකානු හිතවතකු විය).

5. දකුණු කොරියාව විශාල කාර්මික සහ දියුණු රටක්ව තිබීමත්, ආසියානු මූල්‍ය අරමුදලේ එයට තරගකාරීව සිටි අනෙක් රටවල්ද බිඳවැටීම නිසාත්, 1999-2000 පමණ වන විට එහි අපනයන වර්ධනය කර ගැනීමට හැකි විය. එමෙන් ම විශාල ලෙස දුප්පත්කම, විරැකියාව, බංකොළොත් වීම් වැඩි වුවද, ආනයන අඩු වීම නිසා අතිරික්ත වෙළෙඳ ශේෂයක් ඇති කර ගැනීමට හැකි විය. එමෙන්ම රත්‍රන් එකතු කිරීමේ ව්‍යාපාරය මඟින් විදේශ විනිමය හිඟය පියවා ගැනීමට මූල්‍යමය සහායක් මෙන්ම විශාල දේශපාලන සහයක්ද ජනතාව විසින් ලබා දෙන ලදී. එම නිසා තමන් ලබා ගත් එක්සත් ජනපද ඩොලර් බිලියන 19.5ක අයි.එම්.එෆ්. ණය මුදල වසර






තුනකට කලින් 2001 අගෝස්තුවේ දී ගෙවා දැමූ දකුණු කොරියාව අයි.එම්.එෆ්. ණය වැඩසටහනින් ගැලවිණි.

6. 2017දී කොරියානු සංවර්ධන ආයතනය විසින් කරන ලද සමීක්ෂණයක ප්‍රතිඵල පහත දැක්වේ

දකුණු කොරියාවේ 50 අවුරුදු ඉතිහාසය තුළ මුහුණ දුන් බරපතළම අර්බුදය අයි.එම්.එෆ්. විසින් ඇති කරන ලද අර්බුදය බව ජනතාවගෙන් සියයට 57.4කගේ අදහස විය. එමෙන්ම කොරියානු ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට බලපෑ හේතු අතුරින් ප්‍රධාන හේතුව ලෙස සියයට 54.4කගේ අදහස වූයේ ජනතාවගේ එකමුතුකම සහ සහයෝගය බවයි. නමුත්, පසුව මෙම ජනතාවගේ දේශප්‍රේමී හැඟීම පාලකයෝ, සමාගම්කරුවෝ ගසාකෑම් සාධාරණීයකරණයට සහ කම්කරු නීති කප්පාදුව සාධාරණීයකරණයට යොදා ගත්හ.

7. 1998 ආර්ථික අර්බුදය තුළදීම පවත්වන ලද ජනමතවිචාරණයෙන් අයි.එම්.එෆ්. වැඩපිළිවෙළ අනුමත කළ පක්ෂය පරාජයට පත් විය. 2021දී 'ගාලප් කොරියා' (Gallup Korea) ආයතනයෙන් කරන ලද සමීක්ෂණයෙන් දකුණු කොරියාවේ ජනාධිපතිවරුන් අතුරින් අඩුම ජනතා කැමැත්ත (6%ක්) ඇති ජනාධිපති ලෙස (එම අයි.එම්.එෆ්. ණය වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ) කිම් යන්ග්-සෑම් (Kim Young-sam) පත් වී ඇත.

**දකුණු කොරියාවේ 50 අවුරුදු ඉතිහාසය තුළ මුහුණ දුන් බරපතළ ම අර්බුදය අයි.එම්.එෆ්. විසින් ඇති කරන ලද අර්බුදය බව ජනතාවගෙන් සියයට 57.4කගේ අදහස විය. එමෙන් ම කොරියානු ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට බලපෑ හේතු අතුරින් ප්‍රධාන හේතුව ලෙස සියයට 54.4කගේ අදහස වූයේ ජනතාවගේ එකමුතුකම සහ සහයෝගය බවයි.**




# ග්‍රීසිය සහ IMF අර්බුදය

**ආර්ථික අර්බුදය සහ ණය අර්බුදය**

1. ලෝක ආර්ථික අර්බුදයට පෙර 2006-2007 වර්ෂ වන විටද ග්‍රීසියේ දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව ණය ප්‍රමාණය සියයට 102ක් විය.

2. 2001දී ග්‍රීසිය තම ස්වෛරී මුදල් ඒකකය වන 'ඩ්‍රැක්මා' (Drachma) ඉවත ලා 'යුරෝ' (Euro) මුදල් ඒකකයට බැඳීමත් සමඟ ග්‍රීසියේ මූල්‍ය ස්වෛරීභාවය විශාල වශයෙන් අහිමි වීම සහ ග්‍රීක ආණ්ඩුවේ ජංගම ගිණුම (Current Account) 2001 සිට විශාල ඍණ වෙළෙඳ පරතරයක් ඇතිව වර්ධනය වීම ආරම්භ වීම.

3. 2008දී ඇරැඹි ලෝක ආර්ථික අර්බුදයෙන් පසුව ග්‍රීසියේ ආර්ථිකය කඩාවැටීම වේගවත් වීම.

උදාහරණයක් ලෙස එක්සත් ජනපද මහා ආර්ථික අර්බුදය 1929-1939 වසර 10ක කාලය තුළ බිඳවැටුණාට වඩා ග්‍රීක ආර්ථිකය බිඳවැටිණි.

ග්‍රීක සමාගම් 1,00,000ක් බංකොළොත් විය. රැකියා විරහිතභාවය 2003දී සියයට 10 සිට 2012දී සියයට 25 ඉක්ම වී ය. තරුණ රැකියා විරහිතභාවය සියයට 50ක් විය.

ග්‍රීක ජනගහනය අඩු වීමට පටන් ගත් අතර, උගත් සහ ආර්ථික ශක්‍යතා ඇති බොහෝ අය රට අතහැර ගියහ.

4. ආර්ථික අර්බුදය නිසා සමාගම් බදු නොගෙවීම්, ජනතාවගෙන් අය කරනු ලබන බදු ආණ්ඩුවට ලබා නොදීම් ආදිය ඇතුළුව වංචා, දූෂණ ඉහළ යාම. මේ නිසා බදු ආදායම් තවත් අඩු වීම ආදිය සිදු වීමෙන් ආර්ථික අර්බුදය තවත් වැඩි විය.

5. ග්‍රීසියේ ධනවතුන් විසින් බදු නොගෙවා දූෂිත ආකාරයෙන් රැස් කරන ලද ධනය ස්විස් බැංකුවල 2012දී යුරෝ බිලියන 20ක් ද, 2015දී යුරෝ බිලියන 80ක් ද විය. ග්‍රීසිය විසින් එම අයගේ නම් හෙළි කරන ලෙස කොතරම් ඉල්ලීම් කරනු ලැබුව ද, එම නම් හෙළි කිරීම ස්විස් ආණ්ඩුව වසර ගණනාවක් ප්‍රමාද කර එම දූෂිතයන්ට තම මුදල් වෙන රටවලට ගෙන යාමට අවශ්‍ය උපරිම කාලය ලබා දෙන ලදී.

6. මෙම ආර්ථික අර්බුදය, ණය අර්බුදය, ඒ සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 'යුරෝ ගෲප්' සහ යුරෝපා මධ්‍යම බැංකුවේ උපායමාර්ග අනුගමනය කිරීම නිසා අවසානයේ ග්‍රීසිය දණින් වැටිණි.

| කප්පාදු පැකේජය | කාලය | කපන ලද ණය/ඉතිරි කර ගත් ආදායම | කප්පාදු කරන ලද අයිතීන් සහ සහන |
|---|---|---|---|
| 1 වැනි සහන කප්පාදු පැකේජය | 2010 පෙබරවාරි 9 වැනිදා සිට | යුරෝ මිලියන 800කින් අය-වැය පරතරය අඩු කර ගැනීම. | 1. රජයේ සේවක වැටුප් කප්පාදුව.<br>2. 'බෝනස්' දීමනාවලින් සියයට 10ක් කැපීම.<br>3. අතිකාල කප්පාදුව.<br>4. රාජකාරිවලට අදාළ විදෙස් ගමන් නතර කිරීම. |
| 2 වැනි සහන කප්පාදු පැකේජය | 2010 මාර්තු 13 වැනිදා සිට | ආර්ථික ආරක්ෂක පනත මඟින් යුරෝ බිලියන 4.8ක් ඉතිරි කර ගැනීම. | 1. නත්තල්, පාස්කු සහ පැමිණීමේ පාරිතෝෂිකවලින් සියයට 30ක කප්පාදුව.<br>2. පොදු පාරිතෝෂිකවලින් (Bonus) සියයට 12ක කප්පාදුව.<br>3. රජයේ සහ පෞද්ගලික අංශයේ සේවක වැටුප් සියයට 7කින් කප්පාදුව.<br>4. 'වැට්' (VAT) බද්ද සියයට 4.5 - 5 සිට සියයට 19 - 21ක් දක්වා වැඩි කිරීම.<br>5. ඉන්ධන බදු සියයට 15කින් වැඩි කිරීම.<br>6. ආනයනික රථවාහන බද්ද සියයට 10-30 අතර ප්‍රමාණයකින් වැඩිවීම. |
| 3 වැනි සහන කප්පාදු පැකේජය | 2010 මැයි 06 වැනිදා සිට | 2012 වසර වනවිට රාජ්‍ය වියදම්වලින් යුරෝ බිලියන 38ක් ඉතිරි කර ගැනීම. | 1. රජය සතු සමාගම් ගණන 6,000 සිට 2,000 දක්වා අඩුකිරීම.<br>2. 13 වැනි සහ 14 වැනි වැටුප් යුරෝ 500කට සීමා කිරීම.<br>3. රාජ්‍ය අංශයේ දීමනා සියයට 8කින් කැපීම.<br>4. පළාත් පාලන ආයතන ප්‍රමාණය 1,000 සිට 400 දක්වා අඩු කිරීම.<br>5. 13 වැනි සහ 14 වැනි විශ්‍රාම වැටුප් වාරිකය යුරෝ 800ට අඩු කිරීම.<br>6. ඉහළ විශ්‍රාම වැටුප්වලට බදු ගැසීම.<br>7. කාන්තාවන්ගේ විශ්‍රාම වයස අවුරුදු 60 සිට 65 දක්වා වැඩි කිරීම.<br>8. වැට් බද්ද සියයට 19 සිට සියයට 23 දක්වා වැඩි කිරීම.<br>9. සමාගම්වල ලාභයට බදු ගැසීම.<br>10. සේවකයන් ඉවත් කිරීම, අතිකාල ගෙවීම් පිළිබඳ නීති වෙනස් කිරීම.<br>11. 2012 දක්වා යුරෝ බිලියන 110ක ණය ලබා දීමේ කොන්දේසියක් ලෙස ජර්මනියෙන් සහ ප්‍රංශයෙන් ගැනීමට පොරොන්දුවී තිබූ ආයුධ ග්‍රීසිය මිලදී ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| 4 වැනි සහන කප්පාදු පැකේජය | 2011 ජුනි | | 1. රාජ්‍ය දේපළ විකිණීමෙන් යුරෝ බිලියන 50ක් සොයා ගැනීම.<br>2. වාර්ෂික ආදායම යුරෝ 8,000ට වැඩි අයට නව බදු පැනවීම.<br>3. විරැකියාව අඩු කිරීම සඳහා සියයට 2ක බද්දක් පැනවීම.<br>4. විශ්‍රාම වැටුප් සියයට 6 සිට 14 දක්වා ප්‍රමාණයකින් කප්පාදු කිරීම.<br>5. රාජ්‍ය ආයතන විකිණීම සඳහා වෙනම ආයතනයක් පිහිටුවීම.<br>6. වර්ග මීටරයකට යුරෝ 3 සිට 20 දක්වා නගර තුළ දේපළ බද්දක් ඇතිකිරීම.<br>- මෙම දරුණු බදු නිසා ආණ්ඩුවේ ආදායම යුරෝ බිලියන 1.9කින් අඩුවී වියදම යුරෝ බිලියන 2.7කින් වැඩිවී තිබිණි. |
| 5 වැනි සහන කප්පාදු පැකේජය | 2011 ඔක්තෝබර් 20 වැනිදා | ග්‍රීසියට ලැබීමට පොරොන්දුවී තිබූ 6 වැනි ණය වාරිකය ලබා ගැනීමේ ඉලක්කය | 1. වැටුප් සියයට 30කින් කැපීම.<br>2. බදු නොගෙවන වාර්ෂික ආදායම යුරෝ 12.000 සිට යුරෝ 5,000 දක්වා අඩු කිරීම.<br>3. මාසික විශ්‍රාම වැටුප යුරෝ 12,000ට වැඩි අයගෙන් සියයට 20ක් කැපීම. වයස 55ට අඩු විශ්‍රාමිකයන්ගෙන් යුරෝ 1,000ට වැඩි විශ්‍රාම වැටුප් ලබන අයගේ වැටුප් සියයට 40කින් කැපීම.<br>4. පාසල් වසා දැමීම තුළින් සහ පාසල් කිහිපයක් එක් කිරීම මගින් අධ්‍යාපනය සඳහා වන වියදම් කැපීම. |
| 6 වැනි සහන කප්පාදු පැකේජය | 2012 පෙබරවාරි 12 වැනිදා | අමතර ණය ලබා ගැනීමේ ඉලක්කය - යුරෝ බිලියන 1,000ක ණය සහ පෞද්ගලික ණයවලින් සියයට 50ක් කැපීම | 1. අවම වැටුප යුරෝ 750 සිට යුරෝ 585ක් දක්වා සියයට 22කින් කැපීම.<br>2. 13 වැනි වැටුප මුළුමනින්ම කපාදැමීම.<br>3. රාජ්‍ය අංශයෙන් 2012දී රැකියා 15,000ක්ද, 2015දී රැකියා 1,50,000ක්ද කපාදැමීම.<br>4. 2012දී යුරෝ මිලියන 300ක් වටිනා විශ්‍රාම වැටුප් කැපීම.<br>5. සේවකයන් ඕනෑම අවස්ථාවක රැකියාවෙන් නෙරපීමට බලය ලැබෙනසේ කම්කරු නීති සැකැසීම.<br>6. සෞඛ්‍යය සඳහා වන වියදම් සහ ආරක්ෂක වියදම් කප්පාදුව.<br>7. ග්‍රීක ගෑස් සමාගම් වන ඩී.එෆ්.පී.ඒ. (DFPA) සහ ඩී.ඊ.එස්.එෆ්.ඒ. (DESFA) ඇතුළු සමාගම් පෞද්ගලිකකරණයෙන් යුරෝ බිලියන 15ක් අය කර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| 7 වැනි සහන කප්පාදු පැකේජය | 2012 නොවැම්බර් 8 වැනිදා | රාජ්‍ය වියදම් යුරෝ බිලියන 10කින් කැපීම සහ බදු යුරෝ බිලියන 3.5කින් වැඩි කර යුරෝ බිලියන 13.5ක් ලබා ගැනීම. | 1. බදු වැඩි කිරීම.<br>2. ශ්‍රම වෙළෙඳපොළ ලිබරල්කරණය.<br>3. විශ්‍රාම වැටුප් කප්පාදුව.<br>4. බැංකු ප්‍රාග්ධනීකරණය.<br>5. භාණ්ඩ, සේවා සහ බලශක්ති වෙළෙඳපොළ ලිබරල්කරණය.<br>6. සමහර වෘත්තීන්වලට පෞද්ගලික ව්‍යාපාර ලෙස කටයුතු කිරීමට තිබූ බාධා ඉවත්කිරීම.<br>7. රාජ්‍ය මිලදී ගැනීම්වලට එක් ආයතනයක් ගොඩනැගීම.<br>8. විශ්‍රාම වැටුප වයස අවුරුදු 65 සිට 67 දක්වා වැඩි කිරීම.<br>9. ආදායම් බදු ප්‍රතිශතය සියයට 28 දක්වා වැඩි කිරීම. |
| 8 වැනි සහන කප්පාදු පැකේජය | 2013 අප්‍රේල් 28 වැනිදා සිට ජූලි 17 වැනිදා දක්වා | 'ට්‍රොයිකා' (Torika) මඟින් ලබා දීමට එකඟවූ යුරෝ බිලියන 2.5 ලබා ගැනීමේ අරමුණ. | 1. ගුරුවරුන්, පාසල් මුරකරුවන් ඇතුළු 15,000ක් ඉවත් කිරීම.<br>2. උද්සෝෂණ තහනම් කිරීම. |
| 9 වැනි සහන කප්පාදු පැකේජය | 2014 මැයි 14 වැනිදා | ප්‍රාථමික ගෙවුම් ශේෂ හිඟය ධන අගයකට ගැනීම සඳහා. | 1. වැටුප් සහ විශ්‍රාම වැටුප් 2018 දක්වා වැඩි නොකිරීම.<br>2. සෞඛ්‍ය වියදම් කප්පාදුව. |
| 10 වැනි සහන කප්පාදු පැකේජය | 2015 ජූලි 23 වැනිදා | තවත් ණය ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළකට අනුමැතිය ලබා ගැනීම. | 1. වැඩි භාණ්ඩ ප්‍රමාණයක වැට් බදු සියයට 23ක අගයට පත් කිරීම.<br>2. සංචාරක කර්මාන්තයට ලබාදී තිබූ සියයට 30ක වැට් බදු සහනය ඉවත් කිරීම.<br>3. කුඩා සමාගම්වලටද සමාගම් බද්ද සියයට 26 සිට 29 දක්වා වැඩිකිරීම.<br>4. කලින් විශ්‍රාම යාම නතර කර වසර 67න් විශ්‍රාම යාම අනිවාර්යය කිරීම. |
| 11 වැනි සහන කප්පාදු පැකේජය | 2015 අගෝස්තු 14 වැනිදා | තුන්වැනි 'ට්‍රොයිකා' ණය ලබා ගැනීම සඳහා. | 1. ගොවීන්ට ලබාදී තිබූ ඉන්ධන සහනාධාරය මත බද්ද සියයට 350කින් සහ සියයට 550කින් වැඩි කිරීම.<br>2. ගොවීන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සියයට 27.5 සිට 55 දක්වා වැඩිකිරීම.<br>3. පෞද්ගලික අධ්‍යාපනය සඳහා බද්ද සියයට 23ක් කිරීම.<br>4. නාවික කර්මාන්තයට සියයට 4ක බද්දක් පැනවීම. |

| | | | |
|---|---|---|---|
| 12 වැනි සහන කප්පාදු පැකේජය | 2015 ඔක්තෝබර් 13 වැනිදා | ට්‍රොයිකාහි ඉල්ලීම අනුව. | 1. විශ්‍රාම වැටුප් ගණනය මූලික වැටුපට පමණක් සීමා කිරීම.<br>2. විශ්‍රාම වැටුප් ලැබීමේ අවම වයස අවුරුදු 67 කිරීම.<br>3. හමුදා විශ්‍රාම වැටුප් කැපීම. විශ්‍රාම ලැබීමේ වයස අවුරුදු 61 කිරීම. |
| 13 වැනි සහන කප්පාදු පැකේජය | 2016 මැයි 22 වැනිදා | යුරෝ බිලියන 86ක ණය කැපීම අරමුණු කර ගැනීම. ප්‍රාථමික අය-වැය අතිරික්තය 2018දී සියයට 3.5ක් කර ගැනීම. | 1. විශ්‍රාම වැටුප් තවත් කැපීම. එමගින් යුරෝ බිලියන 3.6ක් ඉතිරි කර ගැනීම.<br>2. බදු වැඩි කිරීම මඟින් යුරෝ බිලියන 1.8ක් ලබා ගැනීම.<br>3. වැට් බද්ද සියයට 24ක් කිරිම.<br>4. නිෂ්පාදන බදු වැඩි කිරිම.<br>5. තරු දෙවැනි පන්තියේ හෝටල්වල සිට සංචාරක බදු අය කිරීම. |
| 14 වැනි සහන කප්පාදු පැකේජය | 2017 මැයි 18 වැනිදා | 13 වැනි කප්පාදු පැකේජය සංශෝධනය කිරීම. | 1. ග්‍රීසියේ පී.පී.සී. විදුලි බලාගාරය, දුම්රිය මාර්ග, ඇතැන්ස් අන්තර්ජාතික ගුවන්තොටුපොළ, තෙසලොනිකි (Thessaloniki) වරාය පෞද්ගලිකකරණය.<br>2. ආදායම් බදු ගෙවීමේ අගය යුරෝ 8,600 සිට 5,700 දක්වා අඩු කිරීම. |

## ග්‍රීසියේ මූලික ආර්ථික දත්ත - අයි.එම්.එෆ්. වැඩසටහන් හතරකින් පසු (2010-2023)

1. 2010දී ග්‍රීසියේ දළ දේශීය නිෂ්පාදිතය - යුරෝ බිලියන 220කි.

2010දී ග්‍රීසියේ ණය ප්‍රමාණය - යුරෝ බිලියන 295කි.

දළ දේශීය නිෂ්පාදිතයට අනුව ණය ප්‍රතිශතය - සියයට 134කි.

උපරිමව ක්‍රියාත්මක කළ අයි.එම්.එෆ්. වැඩසටහන් හතරකට පසු

2023 මැයි - ග්‍රීසියේ දළ දේශීය නිෂ්පාදිතය - යුරෝ බිලියන 192කි.

2023 මැයි - ග්‍රීසියේ ණය ප්‍රමාණය - යුරෝ බිලියන 400කි.

දළ දේශීය නිෂ්පාදිතයට අනුව ණය ප්‍රතිශතය - සියයට 208කි.

| | 2010 | 2023 | |
|---|---|---|---|
| වසර 13ක දී දළ දේශීය නිෂ්පාදිතයේ හැකිළීම - යුරෝ බිලියන | 220 | 192 | = 28 |
| අයි.එම්.එෆ්. වැඩසටහන් 4කට පසු ණයවල වැඩි වීම - යුරෝ බිලියන | 295 | 400 | = 105 |

2. ග්‍රීසියේ ණය ගෙවීම 2060 දක්වා කාලයකට වෙන්කර ඇති අතර, ග්‍රීසිය තුළ ක්‍රියාත්මක කළ අයි.එම්.එෆ්. වැඩසටහන් වැරැදි සහ දෝෂ සහිත බවත්, ඒවා අර්බුදය වැඩි කළ බවත් අයි.එම්.එෆ්. ප්‍රධානීන් විසින්මත් වක්‍රව සහ සෘජුව පිළිගෙන තිබේ.

3. ග්‍රීසිය ආර්ථික වශයෙන් මුහුණ දුන් අර්බුදය නිසා ගෙවීමට සිදු වූ සමාජයීය, මානව, පාරිසරික හානිය ගණනය කළහොත්, එය අතිශය විශාල සමාජ ඛේදවාචකයක් බව පෙන්නුම් කළ හැකි ය. මෙහි ලා සඳහන් කර ඇත්තේ, ග්‍රීසියේ මූල්‍ය අර්බුදයට 'ට්‍රොයිකා' (Troika - European Group) විසින් යෝජනා කරන ලද සහ ග්‍රීසියේ විවිධ ආණ්ඩුවලින් උපරිම වශයෙන් ක්‍රියාත්මක කළ අයි.එම්.එෆ්. ණය වැඩසටහන් හතරකට පසු වසර 13කින් පසු ඇති වී තිබෙන ආර්ථික අර්බුදයේ ප්‍රමාණයයි.

**බරාම් නවුසාද්** ( Bahram Nowzad)

*ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විනිමය හා වෙළඳ සබඳතා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර අධ්‍යක්ෂවරයෙකි.*

"ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, නිදහස් වෙළපොළට, පෞද්ගලික ආයෝජනයන්ට සහ ඉල්ලුම හා සැපයුම මත මිල තීරණය වීමට කැපීපෙනෙන ලෙස පක්ෂපාතී වෙළඳපොළ ඉලක්ක කරගත්, ව්‍යාපාර හිතවාදී, ධනවාදී, සමාජවාදයට එරෙහි මතවාදයක් දරයි. එය කාර්මික රටවල් විසින්, විශේෂයෙන් එක්සත් ජනපදය විසින් ණය ගැතියන් මත (සංවර්ධනය වෙමින් පවතින රටවල් මත) 'ලෝක දර්ශනයක්' පටවයි. බොහෝ ආර්ථික විද්‍යාඥයෝ සහ දේශපාලකයෝ මෙම මතවාදය මත පදනම් වූ ප්‍රතිපත්ති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා යෝග්‍යතම ඒවා ලෙස විශ්වාස කරති. කෙසේ වුවද මෙම නිලධාරීන් බටහිර අධ්‍යාපනය ලැබූ සහ වෙළඳපොළ පිළිබඳව විශ්වාස කරන්නවුන්ය. මෙම මතවාදයට කාර්මික රටවල අධිපති ඡන්ද බලය විසින් පහසුකම් සලසන අතර අරමුදල, ණය ලබාදෙන රටවල සම්පත් ආරක්ෂා කර ගැනීමටත් සංවර්ධනය වෙමින් පවතින රටවලින් තව තවත් සම්පත් ඇදගැනීමටත් උදව් කරමින් එම රටවල වුවමනාකම්වලට සේවය කරයි. සාරාංහයක් ලෙස (එක් රාජ්‍ය නායකයෙකු කියූ පරිදිම) අරමුදල යනු ධනවත් රටවලට දුප්පත් රටවල් මත තම බලය ව්‍යාප්ත කර ගැනීම සඳහා වන යාන්ත්‍රණයකි."

*The IMF and its critics කෘතිය*



# ආර්ථිකය ගොඩගන්න රටට උචිත වැඩසටහනක් අවශ්‍යයි

## මහාචාර්ය සී.බී. චන්ද්‍රසේකර්


නව දිල්ලි ජවහල්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ ආර්ථික අධ්‍යයන සහ සැලසුම් මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකුව සිටි මහාචාර්ය සී.බී. චන්ද්‍රසේකර මහතා විශ්වවිද්‍යාල ගණනාවක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙසද ප්‍රධාන කර්තෘවරයෙකු ලෙසද කටයුතු කළේය. මේ වනවිට ඔහු ඉන්දියානු රජයේ කර්මාන්ත අමාත්‍යාංශ උපදේශකයෙකු ලෙස හා ත්‍රිවේන්ද්‍රම් හි සංවර්ධන අධ්‍යයන මධ්‍යස්ථානයේ පර්යේෂකයෙකු ලෙසද කටයුතු කරයි.

Left :- **ශ්‍රී ලංකාව තම බංකොලොත්භාවය 2022 අප්‍රේල් 22 වැනිදා ප්‍රකාශයට පත් කළා. ශ්‍රී ලංකාවේ ණය අර්බුදය හා සැලකීමේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගන්නවා වෙනුවට ලංකාව සතුව තිබූ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග මොනවාද?**

**චන්ද්‍රසේකර් මහතා:** ලංකාවේ අර්බුදය පුපුරා යාමටත් කලින් ශ්‍රී ලංකාවේ  ප්‍රභූ පන්තිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා ආරම්භ කිරීම පුදුමය විය යුතු කරුණක් නොවෙයි. ඔවුන්ට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබාදෙන විසඳුමක් අවශ්‍ය වී තිබුණා. රාජපක්ෂ පාලනය විසින් අති විශාල වශයෙන් විදේශීය ණය ලබාගෙන තිබීමත්,

කොරෝනා වසංගතය විසින් ශ්‍රී ලංකාවට ලැබෙමින් තිබූ විදේශ ප්‍රේෂණ අඩුවීම විසිනුත් ,යුක්රේන යුද්ධය විසින් බලශක්ති සහ ආහාරවල මිල වේගයෙන් ඉහළ යාමත් නිසා  ශ්‍රී ලංකාවට තමා විදේශ ණය සේවාකරණය කිරීමට නොහැකි බව පැහැදිලියි. රට බංකොලොත් බව ප්‍රකාශ කිරීමෙන් සිදු වූයේ එම නොවැළැක්විය හැක්ක සිදු වූ බවයි.

ශ්‍රී ලංකාවේ දූෂිත දේශපාලනඥයන් විසින් මෙම අර්බුදය තවත් නරක් වීමට උත්ප්‍රේරක වූ බව සත්‍යයක් වුවත් මෙහි ලා විශේෂයෙන් ම අවධානයට ගත යුතු කරුණ වන්නේ දිගු ඉතිහාසයක් තිස්සේ ශ්‍රී ලංකාව තම ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මත රැඳී සිටීමත්, එහිම ප්‍රතිවිපාකයක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පැනවූ කොන්දේසි මත වෙළඳාම  ලිබරල් කරණය කිරීමත්, රට තුළට එන විදේශීය ප්‍රාග්ධනයට, මූල්‍ය ප්‍රාග්ධනය පාලනය කිරීම සඳහා තිබූ රෙගුලාසි ඉවත් කිරීමත් මෙයට සෘජුව බලපා ඇති බවයි.




**එම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාව තුළ සිදු කර ඇති සෘණාත්මක කාර්යභාරය ලෙස  සැලකීමේදී ණය අර්බුද විසඳීම සඳහා නැවත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටම යෑමට සිදු වීම අනිවාර්ය වශයෙන්ම නරක ප්‍රතිඵල ගෙනත් දෙනු ඇති.**

එනිසා මෙහි මෙහිලා තේරුම් ගත යුතු මූලික කරුණ වන්නේ රාජපක්ෂ පාලනය විසින් මෙම ගෙවුම් ශේෂ හිඟය පිළිබඳ ගැටලුව වඩාත් අර්බුදයට ගෙන ගියත්, මෙම අර්බුදයට පදනම දැමුයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් යෝජිත ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැඟීම මත බවයි.

එම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාව තුළ සිදු කර ඇති සෘණාත්මක කාර්යභාරය ලෙස  සැලකීමේදී ණය අර්බුද විසඳීම සඳහා නැවත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටම යෑමට සිදු වීම අනිවාර්ය වශයෙන්ම නරක ප්‍රතිඵල ගෙනත් දෙනු ඇති.

ශ්‍රී ලංකාවට ණය දී ඇති ද්විපාර්ශවීය ණය හිමියනුත්, පුද්ගලික ණයහිමියනුත්, ලංකාවේ ස්වෛරී බැඳුම්කර මිලදී ගත් සියලු දෙනාත් දැන සිටි නිශ්චිත කරුණක් වූයේ ශ්‍රී ලංකාවට කලින් පොරොන්දු වී තිබූ පරිදි ණයසේවාකරණය සිදු කිරීමට නොහැකි වනු ඇති බවයි. එම නිසා එම ණය හිමියන්ට තම ණය කපා දැමීමට හෝ වෙනත් ආකාරයන්ගෙන් තම ණය වල වටිනාකම අඩු කර ගැනීමට සිදුවනු ඇති බව පැහැදිලිව තිබූ කරුණක්. එනම් ණයවලින් කොටසක් කපා දැමීම, ණය ගෙවා අවසන් කළ යුතු සීමාව දිගු කිරීම හෝ ණය සඳහා වන පොලී අනුපාතයන් අඩු කිරීම හෝ වැනි දේයි. මෙහිදී ශ්‍රී ලංකාවට ණය දී තිබූ ද්විපාර්ශික ණය හිමියන් එනම් රටවල්, මුලදීම මෙවැනි ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම  පිළිබඳ සාකච්ඡාවලට පැමිණ තිබූ අතර එසේ නොවන්නට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වැඩසටහන ආරම්භ නොවනු ඇති. ශ්‍රී ලංකාවට ණය ලබාදී තිබූ පුද්ගලික ණය හිමියන් ශ්‍රී ලංකාවට ලබා දී තිබූ ණය ප්‍රමාණය මෙන්

කිහිප ගුණයක් ඒ වනවිටත් අත්පත් කරගෙන තිබූ අතර එසේ වූයේ තමාට උපරිම ලාභ ලබාගත හැකි වන පරිදි අවස්ථා කිහිපයකදීම ඔවුන් විසින් තම ආරම්භක ණය ගිවිසුම් වෙනස් කිරීම මගින්.
එමෙන්ම අනෙක් අතට ශ්‍රී ලංකාව විසින් නිකුත් කරන ලද විදේශ විනිමය බැඳුම්කර ද්විතීක වෙළෙඳ පොළේ දී විකුණනු ලැබුවේ හැම ඩොලර් එකටම ඩොලර් සත කිහිපයක් වට්ටමක් ලෙස ලබාදෙමින්. ඉන් පැහැදිලි වන්නේ මෙම ස්වෛරී බැඳුම්කර හිමියන් ඒ වන විටද ලංකාවට ලබා දී තිබෙන ණයවල වටිනාකම පහත වැටී ඇති බව දැන සිටි බවයි.
මෙම තත්වය හමුවේ දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුව එයට එරෙහිව අභියෝගාත්මකව කටයුතු කළේ නම් හා මෙම පෞද්ගලික විදේශීය ණය හිමියන් සමග ණය කපා හරින ලෙස සාකච්ඡා ආරම්භ කළේ නම් ඔවුන් විසින් බොහෝ දුරට කැමැත්තෙන්ම තම ණය අඩු මුදලකට පියවාගැනීමට එකඟ වීමට ඉඩ තිබුණා. එවන් විසඳුමකට ආණ්ඩුවට යෑමට හැකි වූයේ නම් කුඩා ණය මුදලක් වෙනුවෙන් නැවත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ණය වැඩසටහනකට යනවා වෙනුවට මෙම අර්බුදයට ඉතාම කුඩා දායකත්වයක් පමණක් ලබාදී තිබෙන ලංකාවේ දුප්පත් සහ මධ්‍යම පාන්තික ජනතාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් පනවන ලද කොන්දේසි නිසා මුහුණ දීමට සිදුවන බරපතළ ප්‍රතිවිපාක වලින් තොරව මෙම ණය ගැටලුව විසඳා ගැනීමට අවස්ථාවක් තිබුණා.

**Left :- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකට බැඳී ඇති වචනයක් වන්නේ ණය උගුල යන්නයි. මෙහිදී ණය කන්දකට යටවීම හා ණය උගුලකට ගොදුරු වීම යන්නෙහි වෙනස කුමක් ද?**
**එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගිවිසුම් මගින් රටවල් දිගින් දිගටම ණය උගුලේ පටලවන්නෙ කෙසේද යන්න පැහැදිලි කරන්න පුළුවන්ද?**

ණය කියන්නේ කොහොමත් බරක්. මොකද ඒ ණය ගෙවිය යුතු නිසා. නමුත් විදෙස් ණය කියන්නේ සාමාන්‍ය ණය කටත් වඩා විශාල බරක්. මොකද විදෙස් ණය ගෙවන්න සිදුවෙන්නේ ඉතාම අමාරුවෙන් උපයන ලද දුර්ලභ විදෙස් මුදල් යොදාගනිමින් නිසා. ණය උගුල කියලා කියන්නේ අති විශාල ණය ප්‍රමාණයක් එකතුවීමත් විශාල කැපකිරීම් සිදුකිරීමෙන් පසුව පවා ණය ගෙවා දැමීමට තරම් ප්‍රමාණවත් හෝ ණය තිරසාර මට්ටමට අඩු කර ගැනීමට නොහැකි වූ විට ඇතිවන තත්වයයි. වෙනත් විදියකට කියනවා නම් ණය උගුලේ පැටලුණු රටවල් වලට සාමාන්‍ය පරිදි තම ආර්ථිකය යන්තමින් හෝ පවත්වාගෙන යෑමට නම් එම ලබාගත් ණය ගෙවීමට සිදුවන අතරම හි ප්‍රතිඵලයක් ලෙස අනිවාර්යෙන්ම ආර්ථිකය පුපුරා යෑමකට ලක් වනවා.
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනාගතයේදී හෝ එවැනි අර්බුද පුපුරා යෑම වැලක් වීමට නොහැකියි. එයට කළ හැකි උපරිම දේ වන්නේ පැලැස්තර මය විසඳුම් ලබාදීම පමණයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ලබාදෙන කුඩා විදේශ විනිමය ණය ප්‍රමාණය වෙනුවෙන් විශේෂයෙන්ම ගෙවුම් ශේෂ තුලනය පවත්වා ගැනීම වෙනුවෙන්, ආණ්ඩුවට සිදු කිරීමට සිදුවන ප්‍රතිපත්තිමය වෙනස්කම් ගණනාවක් තිබෙනවා.
වෙළඳාම ලිබරල්කරණය කිරීම මගින් අනිවාර්ය වශයෙන්ම ආනයන වැඩි කිරීමට සිදු වන අතරම ජංගම ගිණුමේ හිඟයක් ඇති කරනවා. මෙමගින් සිදුවන විශාලම ගැටලුව වන්නේ විදෙස් ප්‍රාග්ධනය මත තව තවත් රඳා පැවතීමට සිදුවීම සහ විදෙස් ණය ගැනීම තවත් වැඩිවීමයි.
එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තවත් ප්‍රතිපත්තියක් සහ කොන්දේසියක් වනුයේ රට තුළට එන ප්‍රාග්ධනය පාලනය කිරීමට තිබුණ රෙගුලාසි සහමුලින්ම ඉවත් කිරීමට ආණ්ඩුවලට බලපෑම් කිරීමයි. එමඟින් සිදුවන්නේ ආණ්ඩු විසින් පහසුවෙන් කෙටිකාලීන විදෙස් ණය, රටේ සමස්ත ණය ප්‍රමාණය ගැන නොසලකා ලබා ගැනීමට පෙළඹීමත්, ඕනෑම අවස්ථාවක පහසුවෙන් කෙටිකාලීන විදේශ ණය ලබාගැනීමට හැකි ය යන පදනම මත කටයුතු කිරීමට පෙළඹීමත් විසින් රටේ විදේශීය ණය ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වීමයි. නැවත ණය අර්බුදය පුපුරා යන තෙක්ම මෙම ප්‍රතිපත්තිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලපෑම සහ අධීක්ෂණය යටතේ යළි යළිත්, යළි යළිත් සිදුවනවා.


**Left :- 2023 මාර්තු මස ශ්‍රී ලංකාව අත්සන් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගිවිසුම මගින් ලංකාව ණය අර්බුදයෙන් ගැලවේද? එමඟින් ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒවිද?**
**උදාහරණයක් ලෙස මෙම ණය ගිවිසුමේ ඇති සමහර ඉලක්ක එක් අතකින් මායාකාරී වන අතරම අනිත් පැත්තෙන් ස්වයං ප්‍රතිවිරෝධීද වන බවක් ජේනවා. උදාහරණයක් ලෙස බලශක්ති ගාස්තු සියයට 300කින් ඉහළ**

**දමන ගමන් වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගැනීම පෙන්විය හැකියි. ලංකාව අත්සන් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුමේ ඇති ඉලක්ක යථාර්ථවාදී යයි ඔබ කල්පනා කරනවාද?**

මම කලින් ද සඳහන් කළ පරිදි ලංකාවේ ණය අර්බුදය විසඳීමට අවම වශයෙන් පියවර දෙකක් අනුගමනය කළ යුතු වෙනවා. ඉන් පළමුවැන්න නම් ගෙවීමට ඇති ණයවලින් කොටසක් ණය ප්‍රතිව්‍යුහගතකරණය මගින් අඩු කරගත යුතු වෙනවා. මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණ වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තීන් සහ ඉලක්ක සම්පූර්ණයෙන්ම ඉටු කිරීමට ශ්‍රී ලංකාව සහතික වී තිබූ පමණින්ම ශ්‍රී ලංකාවට ණය ලබාදී ඇති පුද්ගලික ණය හිමියන් තමාට ලබාගත හැකි අතිවිශාල ලාභ අත්හැර පහසුවෙන් ලංකාව සමග එකඟතාවයකට පැමිණේවිද යන්නයි.
මන්ද යත් මෙම ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැගීම දුෂ්කර විය හැකි අතරම දැනටමත් ආර්ථික වශයෙන් ප්‍රපාතයට වැටී ඇති ජනතාවක් මත තවත් ආර්ථික දුෂ්කරතා වැඩිකරන අරමුණෙන් ඉදිරිපත් කළ ඇති සමහර ඉලක්ක සපුරා ගැනීම ප්‍රායෝගික නොවනු ඇති බැවිනි. එමෙන්ම ආර්ථික වර්ධනය සහ සාර්ව ආර්ථික ඉලක්ක විශේෂයෙන්ම අයවැය තුළින් ඉදිරිපත් කර ඇති ඒවා එකිනෙක හා ප්‍රතිවිරෝධී වනවා පමණක් නොව සහමුලින්ම යථාර්ථවාදී ඒවා නොවෙයි.

දෙවැනි කරුණ වන්නේ ණය මත යැපීම අඩු කර ගැනීම මගින් ගෙවුම් ශේෂ හිඟය අවම කර ගැනීමයි. මෙය තරමක්දුරට සිදුවීමට ඉඩ ඇති අතර විශේෂයෙන්ම කොවිඩ් වසංගතය අවසන් වීමත්, රටේ ඇති වී තිබෙන පශ්චාත් අර්බුද වටපිටාව විසිනුත් විදේශ විනිමය විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය වැනි ඒවා මගින් කලින් වසරවලට වඩා ලැබීමත්, විශේෂයෙන්ම භාණ්ඩ හා සේවා ආනයනය සඳහා කලින් වියදම් කරන ලද විදේශ විනිමය ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහළ වැටීමත් මගිනුයි.

මෙම ආනයන බිල අඩු කර ගැනීම සඳහා වඩාත්ම සාර්ථක ක්‍රමය වන්නේ සමාජයේ ප්‍රභූන්ට සහ සුපිරි ධනවතුන්ට අවශ්‍ය වන සුඛෝපභෝගී භාණ්ඩ ආනයනය කිරීම සීමා කිරීම මගිනි. මෙම ධනවත් කොටස්වල පරිභෝජනය මිල ඉහළ යාම්වලින් එතරම් දුර්මුඛ නො වන නිසා මෙම ආනයන පාලනය සිදුකළ හැක්කේ මෙවැනි අත්‍යවශ්‍ය නොවන සෑම ආකාරයකම සුඛෝපභෝගී භාණ්ඩ ප්‍රායෝගිකවම ආනයනය කිරීම නතර කිරීම තුළිනි. නමුත් වෙළඳාම ලිබරල්කරණය කිරීමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දැඩි ප්‍රතිපත්තිය නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් මෙවැනි සුඛෝපභෝගී භාණ්ඩ ආනයනය කිරීම නතර කිරීමට උපදෙස් දෙනු ඇතැයි බලාපොරොත්තු විය නොහැක. ඒ වෙනුවට සිදු කිරීමට ඉඩ ඇත්තේ සමහර අවස්ථාවන්වලදී විවෘතවම හා වැඩි අවස්ථාවන් ප්‍රමාණයකදී ව්‍යංගයෙන් අත්‍යවශ්‍ය වන ආනයනයන් උදාහරණයක් ලෙස ආහාර සහ බලශක්තිය වැනි



සීමා කිරීම, එමඟින් මහජනතාවගේ ආදායම් මාර්ග සීමා වීම හරහා ඔවුන්ගේ මිලදී ගැනීමේ ශක්තිය අඩු වීම වැනි දේයි.

මෙම ආර්ථිකය හැකිළීමේ ක්‍රියාවලිය පැති ගණනාවකින් කරගත යුතුව තිබෙනවා. ආණ්ඩුවේ වියදම් කප්පාදු කිරීම විශේෂයෙන්ම සමාජ ආරක්ෂණයට සහ සුභ සාධනය සඳහා වෙන්කර ඇති, තෙල් හා විදුලි ගාස්තු අධික ලෙස වැඩි කිරීම, රුපියල අවප්‍රමාණ වීම මගින් රටින් ආනයනය කරන අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිල අධික ලෙස වැඩි කිරීම, ඉතාම මෑතකදී ආණ්ඩුවේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හරහා විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම අරමුදල් උදුරා ගැනීම දැක්විය හැකියි. මේවායින් දැනටමත් ආර්ථික වශයෙන් අති විශාල දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින දුප්පත් හා මධ්‍යම පාන්තික ජන කොටස්වලට සිදුවන බලපෑම අතිශය විනාශකාරී වනු ඇති.

මේවා මෙසේ සිදු කළ ද එමගින් දැනට තිබෙන ගෙවුම් ශේෂ ගැටලුව පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට මෙම ක්‍රියාමාර්ග මගින් එතරම් ප්‍රයෝජනයක් නොවනු ඇති. මන්දයත් ධනවතුන් විසින් දිගින් දිගටම ආනයනය කර සුඛෝපභෝගී භාණ්ඩ පරිභෝජනය කිරීම අත්නොහරින නිසාත්, ඔවුන් තමන්ගේ දේපළ විදේශ මුදල්වලට පරිවර්තනය කර විදෙස් රටවල් වල තැම්පත් කිරීම සිදු කරන නිසාත්ය.

**Left :- ජාත්‍යන්තර ණය වැඩසටහන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වුවහොත් ඉන් ඇතිවිය හැකි ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක කවරේද?**

මා කලින් සඳහන් කළ පරිදිම දුප්පත් සහ මධ්‍යම පාන්තික කොටස් විශේෂයෙන්ම ආර්ථිකයේ අවිධිමත් අංශයේ රැකියා කරන අයගේ තත්වය තව තවත් විනාශකාරී වනු ඇති. එමෙන්ම අනෙක් අතට බැලුවහොත් මෙම අර්බුදයේ දී විදෙස් ණය හිමියන් සහ දේශීය ධනවතුන් දැරිය යුතු බර විශාල වශයෙන් අඩුකර, ආවරණය කර තිබෙනවා.

විශේෂයෙන්ම මෙවන් අර්බුදකාරී වටපිටාවකදී ආර්ථික කොන්දේසි නිසා දුෂ්කරතාවයට පත් වන ජනතාවට සහන සැපයීම සඳහා ආණ්ඩුවට යොදාගත හැකි අරමුදල් සම්පාදනයට ධනවතුන්ගේ ආදායම් මත නව බදු පැනවීම සහ ඔවුන්ගේ වත්කම් මත බදු පැනවීම වැනි කිසිදු දෙයක් සිදු කර නොමැති අතර එවන් උත්සාහයක් ගන්නා බවද නොපෙනේ .

සත්‍ය වශයෙන්ම වඩාත් බියජනකම වනු ඇත්තේ මෙමගින් ඇති කරන සමාජ ප්‍රතිවිපාක පිළිබඳ සලකා බැලීමේදීයි. ශ්‍රී ලංකාවේ පැවති අරගල, විරෝධතා විසින් පෙන්නුම් කරන ලද්දේ ලාංකීය ජනතාව තුළ රටේ ප්‍රභූන්ට එරෙහිව සුවිශාල කෝපයක් ඇති බවත් එම කෝපය ඕනෑම අවස්ථාවකදී අහම්බිය සටන් ලෙස පුපුරා යා හැකි බවයි. මේ වන විට මෙම අරගල සහ හදිසි පුපුරා යෑම අඩු වී ඇති අතර එයට හේතුව ඇත්තේ ජනතාවගේ සටන්වලට එරෙහිව ක්‍රියාත්මක දැඩි මර්දනය සහ විශේෂයෙන්ම ලංකාවේ ආර්ථික අර්බුදයට විසඳුම වනු ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන බවත්, ජාත්‍යන්තර ණය හිමියන් එම ණය කපා දැමීම පිළිබඳ සාකච්ඡාවලට එනු ඇත්තේ මෙම වැඩපිළිවෙළ තුළින් පමණක් බවත් ජනතාවට ඒත්තු ගැන්වීම නිසායි. නමුත් මෙම පොරොන්දු ඉටු කිරීමට නොහැකි වනු ඇති අතරම ජනතාවගේ කෝපය නැවතත් වර්ධනය වී එය නැවත සමාජ පුපුරා යෑමකට පාර කපනු ඇති. මෙම තත්වය නිසා ඇතිවිය දේශපාලන වර්ධනයන් පිළිබඳ සම්පූර්ණයෙන්ම නිශ්චිත යමක් ප්‍රකාශ කළ නොහැකි වුවද, එම තත්වය ජනතාවගේ බහුතරයක් විසින් අනුමත කරන වඩා ප්‍රගතිශීලී සහ සාධාරණ නව වැඩපිළිවෙළක් ඉදිරිපත් කරන්නට හා නව ආණ්ඩුවක් ගොඩ නගා ගැනීමේ දිශාවට වර්ධනය වීමටද ඉඩ තිබෙනවා.
එසේම අත්දැකීම් පෙන්වා දෙන්නේ මෙම තත්ත්වය දක්ෂිණාංශික ජාතිකවාදී පිළිගන්නා සුළු වර්ගවාදී මතවාදයන් වර්ධනය වීමටත් සමාජයේ විවිධ කණ්ඩායම් එකිනෙකාට සතුරු, බවට පෙළ ගැසීමත්ය. එම තත්වය ආර්ථික අර්බුදය තවත් දරුණු කරනු ඇති අතර වැඩි ජනතාවක් සුවිශාල බේදවාචකයන්ට ගොදුරු වනු ඇති.

**Left :- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මෑත භාගයේ විවිධ රටවලට ලබාදුන් ණය වැඩසටහන් පිළිබඳ සොයාබැලීමේදී පෙනී යන කරුණක් වන්නේ ඒවා සියල්ලම බරපතළ ලෙස අසාර්ථක වී ඇති බවයි. ණය ලබාගත් රට තවත් අර්බුදයේ ගිලී ඇති බවයි. ආර්ජන්ටිනාව, ග්‍රීසිය, ඝානාව, ලෙබනනය දැක්විය හැකියි. ඕනෑම ආයතනයක අසාර්ථකවීම් තිබිය හැකි වුවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබාගත් සෑම රටක්ම**




**පාහේ එම ණය නිසාම තවත් බිඳ වැටීමට ලක්වී තිබෙනවා. වෙනත් විදියකට කිවහොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය බෙහෙත් ලබා ගන්නා රෝගීන් එම බෙහෙත විසින්ම මිය යාමට ලක් වෙනවා. එම නිසා මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සෙල තුළම ඇති රෝගීන් මරා දමන DNA පිළිබඳව පැහැදිලි කරන්න පුළුවන්ද?**

ඔබ එයට DNA කියා කීමට කැමති නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඩී එන් ඒ යනු එහි ඡන්ද හිමිකම් ව්‍යුහයත්, එහි ප්‍රතිපත්ති රාමුවත්ය. ඒවා සකස් කර ඇත්තේ ගෝලීය ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ඉටුකිරීමටත්, විශේෂයෙන්ම මූල්‍ය ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ඉටු කිරීමට හැකිවන ලෙසත් හා ඇමරිකා එක්සත් ජනපදය සහ එහි සහකාර රටවල අවශ්‍යතාවයන් ඉටු කිරීමට හැකි වන ලෙසත්ය.

එම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙ ක්‍රියාත්මක වීමේ ප්‍රධානම කටයුත්ත ඉහත අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීමට මිස පහළ හා මැදි ආදායම් ලබන රටවලට ස්ථාවර හා තිරසර සංවර්ධනයක් ලබා දීමේ අරමුණින් නෙමෙයි. එසේ වූයේ නම් දැනට ලෝකයේ ඇති ඇදහිය නොහැකි තරම් වන අසමානතාවයන් අඩු කරගැනීමට එය උදව් විය හැකිව තිබුණා.

**Left** :- **ශ්‍රී ලංකාවේ සිටින සමහර ආර්ථික විද්‍යාඥයන්ට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 1991 දී ඉන්දියාවට ලබා දුන් ණය මුදල 1998 දී දකුණු කොරියාවට ලබාදුන් ණය මුදල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාර්ථක වැඩසටහන් ලෙස සඳහන් කෙරෙනවා. විශේෂයෙන්ම ආසියානු මූල්‍ය අර්බුදය පිළිබඳව ඉතා ගැඹුරින් අධ්‍යයනය කරන ලද ආර්ථික විද්‍යාඥයන් අතර ඔබ ඉහළින්ම සිටිනවා. ඔබ සහ මහාචාර්ය** Jyoti Ghosh **විසින් ඒ පිළිබඳව**'Crisis as Conquest ( Learning from East Asia'' Also'' 'Neoliberal Economic reforms in India' and 'The market that failed ( neoliberal economic reforms in India'' **ඔබගේ අධ්‍යයනයන් අනුව ඉන්දියාවේ සහ දකුණු කොරියාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න?**

1991 දී ඉන්දියාවේ 1997දී දකුණු කොරියාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත්වීම් ස්ථිරවම සාර්ථක අත්දැකීම් නොවෙයි. දකුණු කොරියාවට ලබාදුන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ව්‍යුහාත්මක ගැළපුම් උපායමාර්ගය විසින් සිදුකරන ලද්දේ දකුණු කොරියානු ධනවතුන් විසින් ජාත්‍යන්තර වෙළඳපොළ තුළ බටහිර ආධිපත්‍යයට කරන ලද අභියෝගය විදේශීය ප්‍රාග්ධනය දකුණු කොරියාවට විශාල ලෙස කඩා වැදීමට සැලැස්වීම මගින් බිඳ දැමීමයි. දකුණු කොරියානු ආර්ථික අර්බුදයට පිළිතුරු ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පැටවූ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමෙන් පසු 1970 සිට 1990 දක්වා දකුණු කොරියාව පෙන්නුම් කළ විශේෂ ආර්ථික හැකියාව අහෝසි කළා. ඉන්දියාවේ අත්දැකීම සැලකුවහොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කරන ආකාරයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තුළින් ඉන්දියාව ගෝලීය නිෂ්පාදනයේ සහ අපනයනයේ කේන්ද්‍රයක් බවට පත් කරනු ඇති බවට ඔවුන්

ලබාදුන් සහතික හා පොරොන්දු පුස්සක් බවට පත් වී තිබෙනවා. එමෙන්ම එමගින් ඉන්දියාව තුළ අසමානතාවය විශාල ලෙස වැඩි කර තිබෙනවා.
අද වන විට මෙම රටවල් ලෝකය තුළ වඩාත් සාර්ථක ආර්ථිකයන් බවට පත් වී තිබේ නම් එයට හේතු වී ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් නොව එම වැඩසටහන් අත්හැර වඩා සුදුසු රටට උචිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

**Left :- අප විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන්වල ඇති අසාර්ථකභාවය බරපතළ ලෙස පෙන්වා දෙන අතරම එයට විකල්ප වැඩසටහනක් ඉදිරිපත් කිරීමද අත් නොහැරිය හැකි වගකීමක්. එම නිසා ජනතා වරමක් සහිත ජනතා හිතවාදී වාමාංශික පාලනයකින් ලංකාව මුහුණ දී ඇති ගැටලු විසඳීම සඳහා ඇතුළත් කරගත හැකි ප්‍රධාන යෝජනා පිළිබඳ යම් අදහසක් දැක්විය හැකිද?**

මේ ඉඩකඩ ඒ සඳහා ප්‍රමාණවත් නොවේ. කරුණු කීපයක් සඳහන් කිරීමට උත්සාහ කිරීම තුළින් විකල්ප ආර්ථික වැඩපිළිවෙලක් සඳහා වාමාංශික ව්‍යාපාරයන් විසින් එදා මෙදාතුර කරගෙන යනු ලබන අතිවිශාල කාර්ය භාරයට සාධාරණයක් ඉටු නොවෙනු ඇති.

ඒ ඒ රටේ පවතින විශේෂතාවයක් මත පදනම් වෙමින් ප්‍රගතිශීලී ආණ්ඩුවකට ගත හැකි සහ ක්‍රියාවට නැගිය හැකි විසඳුම් හා ක්‍රියාමාර්ග රාශියක් තිබෙන බව පමණක් මෙහිලා ප්‍රකාශ කළ හැකිය. නමුත් සෑම තැනකම මුහුණ දී ඇති අර්බුදය වී තිබෙන්නේ ජන ජීවිතය සහ පරිසරය යන දෙකම ආරක්ෂා කරගෙන, දියුණු කළ හැකි, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාව හා

**උවමනාවන් සහ අභිප්‍රායන් ආදී බොහෝ දේ ඒකාධිකාරී සමාගම්වලින් පාලනය කිරීම වැනි තවත් බොහෝ දේ සමඟ ගෝලීය ආර්ථිකයේ අනාගතය පිළිබඳව අප ඔබෙන් දැන ගැනීමට කැමතියි. ආර්ථික**




**නමුත් සෑම තැනකම මුහුණ දී ඇති අර්බුදය වී තිබෙන්නේ ජන ජීවිතය සහ පරිසරය යන දෙකම ආරක්ෂා කරගෙන, දියුණු කළ හැකි,ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාව හා එම හැකියාව සහිත රාජ්‍යයක් නොමැතිවීම යි.**

එම හැකියාව සහිත රාජ්‍යයක් නොමැතිවීමයි.

**Left :- ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනයේ මෙම අදියර විසින් ස්වෛරී ණය අර්බුද, බැංකු කඩාවැටීම්, මානව අවශ්‍යතා, සරණාගතයින්, සංවර්ධනය වෙමින් පවතින රටවලින් වෘත්තිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වීම, දූෂණය යනාදියද සමග අපි 2008ට වඩා විශාල අර්බුදයකට යනවාද? ඇතැමුන් ශුභවාදීව**

**දකින ගෝලීය මුදල් ඒකකය ලෙස ඩොලරය ඉවත් කිරීම හෝ නව ගෝලීය මුදල් ඒකකයක් අවම වශයෙන් දශකයක් හෝ දෙකක් සඳහා විසඳුමක් වේවිද? විකල්පයක් ලෙස, නිෂ්පාදන මාධ්‍යයන්, තාක්ෂණය ආදියෙහි ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහතික කරන සමාජ පරිවර්තනය සඳහා ව්‍යාපෘතියක් ඔබ යෝජනා කරනවාද?**


ඉතාම මෑතකදී ඇමරිකා එක්සත් ජනපදයේ හා බ්‍රිතාන්‍යයේ ඇති වූ බැංකු කඩා වැටීම පිළිබඳ අර්බුදය මගින් පෙන්නුම් කරන ලද්දේ ඊනියා දියුණු ධනපති රටවල් තුළ පවා අති විශාල අර්බුදයක් ඇති කළ හැකි මට්ටමේ මූල්‍ය ක්ෂේත්‍රයේ සුවිශාල බිඳවැටීමක් ඇති බවයි.

2008 දී ඇති වූ සුවිශාල ආර්ථික අවපාතය කළමනාකරණය කර ගැනීමටත් එදා සිට අද දක්වා එම එම මට්ටමේ මහා පරිමාණ අර්බුදයක් තවම ඇති නොවී තිබෙන්නේ එම රටවල ආණ්ඩු සහ මහ බැංකු මගින් කරණ ලද්දවූ දැවැන්ත මැදිහත්වීම නිසයි.

එම මැදිහත්වීම් විසින් ධනපති ක්‍රමයේ සියලුම නීතිරීති පමණක් නොව දැනට දියුණු වෙමින් පවතින රටවලට සහ නව ආර්ථික බලයක් බවට පත්වෙමින් තිබෙන චීනයට ඔවුන් විසින් යෝජනා කරන "නීතියේ පාලනයට යටත් වූ ජාත්‍යන්තර ක්‍රමයක්" rule based international order උල්ලංඝනය කර තිබෙනවා. දැවැන්ත ප්‍රාග්ධනයන්ට සහ ගෝලීය මූල්‍ය ආයතනවලට මනස කළඹවන මට්ටමේ ආධාර එම රටවල ආණ්ඩු මගින් සිදු කළ අතරම ලොව දුප්පතුන් සඳහා ඉතා අවම මට්ටමේ ආධාර උපකාර කරන අවස්ථාවන්වලදී ඒවා ජනප්‍රියවාදී හා වැරදි ආර්ථික ප්‍රතිපත්තීන් ලෙස හංවඩු ගසනවා.

ඔවුන්ගේම නීති ඔවුන් විසින්ම බිඳ දැමීම තුළින් පෙන්නුම් කරන්නේ ධනපති ක්‍රමය තුළ ස්ථාවර භාවය ඇති කර ගැනීම සඳහා මීට පෙර පොදුවේ එකඟ වී ඇති ක්‍රමවේද තුළින් කළමනාකරණය කළ නොහැකි බවයි. එම නිසා තවත් විශාල අර්බුදයක් ඇති වීම වැළැක්විය නොහැකයි. එසේ වුවද මා කලින් ප්‍රකාශ කළ පරිදිම එසේ ඇතිවන සෑම අර්බුදයක් ම ප්‍රගතිශීලී සහ තිරසාර විකල්පයන් කරා යොමු වේ යයි සහතිකයක් නැහැ. එය තීරණය වන්නේ ජනතාව සහ ජනතාව විසින් ඔවුන් සංවිධානය කරන ආකාරය තුළයි.







# IMF ණය ලංකාව ගොඩගනීද?

**මංජුල පද්ම කුමාර**

ශ්‍රී ලංකාව මේ වන විට ආසියානු කලාපයේ දැවැන්තම ආර්ථික අර්බුදයට පත් වූ රටවල් අතර ප්‍රධාන රටකි. පසුගිය වසරේ (2022) අප්‍රේල් 12 න් පසුව ජාත්‍යන්තර ණය හා පොලිය යළි ගෙවීමට නොහැකි බව නිල ලෙස ප්‍රකාශ කළ තත්වය නිසා ලෝකයේ ණය ශ්‍රේණිගත කිරීම අනුව ණය ගෙවිය නොහැකි (Default) රටක් ලෙස ලංකාව නම් කෙරුණි. ඉන් පසුව ආණ්ඩුව විසින් ආනයන සීමා පනවන ලදී. මිල උද්ධමනය 78% ට පමණ ඉහළ ගියේය. ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික මෙන්ම වාණිජ ණය ලැබීම නතර විය. මෙම තත්වය යටතේ 2023 මාර්තු 20 දින රැස්වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය අමෙරිකානු ඩොලර් බිලියන 2.286 ක විස්තීරණ ණය පහසුකමක් ලංකාවට අනුමත කර එහි පළමු වාරිකය ලෙස USD මිලියන 334ක් ලබා දී ඇත. ඒ පිළිබඳව පිටු 151 ක වාර්ථාවක් මූල්‍ය අරමුදල නිකුත් කොට ඇත.

ලංකාව මින් පෙර 16 වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වාරික ලබා ගෙන ඇත. ඉන්, සම්පූර්ණ ණය මුදල ලබා ඇත්තේ අවස්ථා 9කදී පමණි. 1979, 2003 සහ 2016 ලෙස අවස්ථා තුනකදී විස්තීරණ ණය



පහසුකම (EEF) ලබා ඇතත් එම අවස්ථා සියල්ල අතරමග අතහැර දමනු ලැබීය. මේ අවස්ථාවේ ගිවිසුම කඩකළහොත් ශ්‍රී ලංකාව තවදුරටත් ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ හෝ වෙනත් බහුපාර්ශ්වීය හෝ ද්විපාර්ශ්වීය මූලාශ්‍ර මගින් අරමුදල් හා සහන ගැනීම ඉතා අසීරු වනු ඇත.

## කොන්දේසි මාලාවක්

පවතින ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවේ රජය විසින් වසර හතරක් තුළ ඉටුකළ යුතු කර්තව්‍යයන් 45 ක ලැයිස්තුවක් ලබා දී ඇත. ඉන් 15ක් පූර්ව කොන්දේසි වන අතර, ඉතිරි 30 වැඩසටහනේ වර්ෂ හතර තුළ සම්පූර්ණ කළ යුතුය. පූර්ව කොන්දේසි සියල්ල මේ වනවිට ආණ්ඩුව සම්පූර්ණ කොට ඇත.

මෙම වැඩසටහනේ ක්‍රියාත්මක බව පිළිබඳ දෙයාකාරයක අවිනිශ්චිතභාවයක් තිබෙන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින්ම ප්‍රකාශ කරයි. කලාපයේ ඇතිවිය හැකි අර්බුද, සැපයුම් ජාල බාධා, භාණ්ඩ මිල ඉහළ යාම්, ගෝලීය ආර්ථික අවපාත, මූල්‍ය වෙළෙඳපොළ කඩාවැටීම් යනාදී බාහිර අභියෝග එක් වර්ගයකි.

දේශීය අභියෝග ලෙස කරුණු කිහිපයක් දක්වා ඇත. එනම් යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදි ජනයා තුළ ඇති වියහැකි අසහනාකාරී තත්වයන්, වංචා දූෂණ, ප්‍රතිසංස්කරණ කෙරෙහි ලංකාවේ තිබෙන පසුගාමී බව, උද්ධමනය, බැංකු මත ඇතිවිය හැකි දැඩි පීඩනය හමුවේ පැන නගින ද්‍රවශීලතා ප්‍රශ්න සහ බැංකු සතු වත්කම් පිරිහීම යනාදියයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිකුත්කර ඇති වාර්තාවේ අභිමතාර්ථ 06 ක් කෙරෙහි අවධානය යොමු කොට ඇත.

i. ආදායම් ඉහළ දැමීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය, සමාජ ආරක්ෂණ වැඩසටහන්, මූල්‍ය ආයතන සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම.

ii. රාජ්‍ය ණය තිරසරභාවය තහවුරු කිරීම

iii. මිල ස්ථායිතාවය තහවුරු කිරීම සහ සංචිත ගොඩනැගීම

iv. මූල්‍ය ස්ථායීතාවය තහවුරු කිරීම

v. දූෂණ අවදානම් අවම කිරීම

vi. ආර්ථික වෘධිය ඉහළ නැංවීම

## සැලැස්ම

ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව ලංකාවේ ගෙවුම් ශේෂයෙහි ඇතිවන හිඟය පියවීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඩොලර් බිලියන 2.982 ක ණය මුදලක් ලබා දෙයි. එය ලබාගත් පසු ගෙවුම් ශේෂ හිඟය පියවීමට හා විදේශ සංචිත අපේක්ෂිත මට්ටමේ පවත්වාගෙන යාම සඳහා සපුරාලිය යුතු අතිශය දුෂ්කර සහ අතාත්වික ඉලක්ක කිහිපයක් ගිවිසුමට ඇතුළත්ය.

1. විදේශීය ණයවලින් ඩොලර් බිලියන 14.087ක ණය සහනයක් (Debt Relief) ලබා ගැනීමට බලාපොරොත්තු වේ. එම ප්‍රමාණය සමස්ත විදේශ ණය ඩොලර් බිලියන 41න් 1/3 කි. එනම් ණය කපා හැරීමකි.

2. වසර 4ක් තුළ කොටස් වශයෙන් ලැබෙන පරිදි ලෝක බැංකුවෙන් ඩොලර් බිලියන 1.75ක ණය මුදලක් ලබා ගැනීම.

3. වසර 4ක් තුළ කොටස් වශයෙන් ලැබෙන පරිදි ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් බිලියන 2.0 ක ණය මුදලක් ලබා ගැනීම.

4. වසර 4ක් තුළ කොටස් වශයෙන් ලැබෙන පරිදි බහුපාර්ශවීය සහ ද්වීපාර්ශවීය මූලාශ්‍රවලින් ඩොලර් බිලියන 10.283 ක ණය ලබා ගැනීම.

5. වසර 2027 දී ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ස්වෛරීත්ව බැඳුම්කර මගින් ඩොලර් බිලියන 1.5ක ණය ලබා ගැනීම. 2028 දී නැවත ස්වෛරීත්ව බැඳුම්කර මගින් ඩොලර් බිලියන 1.575ක ණය ලබා ගැනීම

6. ඒ අනුව අලුතෙන් ලබා ගැනීමට සැලසුම් කරන ණය අපේ මුළු විදේශ ණය පහළ යන්නේ ණය හිමියන් විසින් කපා හරින ලද ණය ප්‍රමාණයටත් වඩා අඩුවෙනි.

7. සෘජු විදේශ ආයෝජන මගින් වසර 4ක් තුළ ඩොලර් බිලියන 8ක් රැස් කර ගැනීම. (ශ්‍රී ලංකාවට ලැබුණු වැඩිම විදේශ ආයෝජන ප්‍රමාණය 2016 වසරේ ඩොලර් බිලියන 1.6 කි. 2010-2020 අවුරුදු 10ට ලද විදේශ ආයෝජන එකතුව ඩොලර් බිලියන 7.7කි.

8. වසර 4ක් තුළ අපනයන ආදායම 30% කින් වර්ධනය කර ගැනීම.

9. වසර 4ක් තුළ සේවා අපනයනයෙන් ලබන ශුද්ධ ආදායම 37%කින් වැඩි කරගැනීම.

සංචිත යළි දියවී යාමේ අවදානමක් පවතී.

IMF මේ සියලුම ගණනය කිරීම් කොට තිබෙන්නේ ඉදිරියේ දී ආර්ථිකය 3% පමණ වේගයෙන් ප්‍රසාරණය වන උපකල්පනය මත පිහිටාය. එහෙත්, 8.7%කින් හැකිළුණු ආර්ථිකය ප්‍රසාරණය කිරීමට අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් ආණ්ඩුව මෙතෙක් ගෙන නොමැත. 2023ත් තව 3%කින් ආර්ථිකය කඩා වැටෙන බව IMF වාර්තාව ප්‍රකාශ කරයි. දිනෙන් දිනම අපනයන ඉපයුම් සංකෝචනය වෙමින් පවතී. 2022ට සාපේක්ෂව 2023 මුළු අපනයන ඉපයුම් 9.68% කින් කඩා වැටී ඇත. රෙදිපිළි හා ඇඟලුම් 2.32%කින්, රබර් අපනයන 17.81% කින්, පොල්

| | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | Total |
|---|---|---|---|---|---|---|---|
| IMF | 0.663 | 0.665 | 0.663 | 0.662 | 0.329 | | 2.982 |
| WB | 0.250 | 0.400 | 0.400 | 0.400 | 0.300 | | 1.750 |
| ADB | 0.650 | 0.450 | 0.300 | 0.300 | 0.300 | | 2.000 |
| Bilateral / Multi | 2.109 | 1.542 | 1.585 | 1.633 | 1.682 | 1.732 | 10.283 |
| ISB | | | | | 1.500 | 1.575 | 3.075 |
| Total New Loan | 3.672 | 3.057 | 2.948 | 2.995 | 4.111 | 3.307 | 20.090 |

ප්‍රමාණය ඩොලර් බිලියන 20.09ක් වන අතර එය වසර 6ක සත්‍ය ණය ගෙවීම් ප්‍රමාණය වන ඩොලර් බිලියන 13.8 ට වඩා වැඩිය.

එයින් කියවෙන්නේ අප ණය වාරික හා පොලියෙන් කොටසක් කපා හැරීමෙන් පසුව ඉතිරිවන හිඟ මුදල පවා, වසරක් පාසා ගෙවාගෙන යන්නේ නැවත

10. වසර 4ක් තුළ විදේශ සංචිත ඩොලර් බිලියන 0.7ක සිට ඩොලර් බිලියන 10.3ක් දක්වා (ආනයන මාස 4, 1/2 ) වර්ධනය කර ගැනීම.

මෙම ඉලක්ක එකක් හෝ සම්පූර්ණ කරගැනීමට අපොහොසත් වුවහොත් මූල්‍ය අරමුදලින් දෙන

නිෂ්පාදන අපනයන 19.74% කින් කඩා වැටී ඇත. ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ වන ඇමෙරිකා එක්සත් ජනපදයට පමණක් කරණු ලබන අපනයන වසරක් ඇතුළත 20.9% කින් කඩා වැටී ඇත. බදු ඉහළ දැමීමත්, විදුලි බිල් ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ගාස්තුවල ඉහළ යාමත්

| | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | Total |
|---|---|---|---|---|---|---|---|
| Total debt service due | 5.452 | 5.200 | 5.494 | 4.477 | 3.861 | 3.426 | 27.910 |
| (less) Debt relief | 3.376 | 3.328 | 3.655 | 2.246 | 1.482 | - | 14.087 |
| Actual loan repayment | 2.076 | 1.872 | 1.839 | 2.231 | 2.379 | 3.426 | 13.823 |

අලුතෙන් ණය ගනිමිනි. ඒ හේතුවෙන්, IMF සැලසුම අවුරුදු 6ක් ක්‍රියාත්මක කළ පසුව වුවද, ණය පහසුකම ගෙවුම් ශේෂ හිඟය පියවීමට ප්‍රමාණවත් නොවන අතර එසේ හිඟ වන ප්‍රමාණයෙන් විදෙස්

නිසා දේශීය කර්මාන්ත මෙන්ම විදේශීය සමාගම්වල කර්මාන්තද බලවත් අර්බුදයකට මුහුණපා සිටී. කර්මාන්ත හා ව්‍යාපාර

රුසක් නතරවී ඇති අතර විදේශීය සමාගම් වෙනත් රටවලට සිය කර්මාන්ත ගෙනයමින් තිබේ.

### පටි තද කරගැනීමට සිදුවීම

ණය කොන්දේසිවල ප්‍රධාන කරුණක් වන්නේ ආදායම් පාදක අයවැය ඒකාබද්ධකරණයයි. එනම් ආදායමට සරිලන ලෙස වියදම් සැලසුම් කිරීමයි. ඒ අනුව, 2022 දී රාජ්‍ය අයවැයේ 3.8% ක් වූ ප්‍රාථමික හිඟය 2025 දී 2.3% අතිරික්තයක් දක්වා වර්ධනය කර ගැනීමේ මූලික ඉලක්කයක් සැලසුම් කර ඇත. එහෙත් එය කිසිසේත් ප්‍රායෝගික නොවන අතර, එය පුරෝකථනය කර ඇති පරිදි ළඟා කරගැනීමට උත්සාහ කිරීමේ දී සිදුවිය හැකි අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ තව තවත් බදු වැඩි කිරීම, පොදු සේවා හා වියදම් කප්පාදු කිරීම හා පොදු දේපළ කුණු කොල්ලයට විකිණීම පමණි. එනම් මහජනතාවට පටි තද කරගැනීමට බල කිරීමයි.


IMF පහසුකම පිළිබඳ මීළඟ විමර්ශනයේදී බදු ලිහිල් කිරීම පිළිබඳ සලකා බලනවා යැයි ආණ්ඩුව විසින් ප්‍රකාශ කර ඇත. එහෙත්, 2023 වසරේ අපේක්ෂිත බදු ආදායමටත් වඩා වැඩි බදු ආදායමක් ඊළඟ වසරේ දී එක් රැස් කරගන්නා බව ආණ්ඩුව IMF වෙත පොරොන්දු වී තිබේ. 2023 බදු ආදායම රුපියල් බිලියන 3000 සිට එය 2024 දී රුපියල් බිලියන 4,150 දක්වා 38% කින් වැඩි කිරීමට නියමිතය. ඒ සඳහා VAT බදු, ආදායම් බදු, විදේශ වෙළඳාම මත බදු, මේ සියල්ලම වැඩි කිරීමට නියමිතය. ඊට අමතරව 2025 දී අලුතෙන් ත්‍යාග හා ධන බද්දක් ද හඳුන්වාදීමට නියමිතය. එසේ නම් බදු ලිහිල් කිරීමක් ගැන කියන්නේ ජනතාව රැවටීමටද යන ප්‍රශ්නය මතුවේ.

බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව වැඩි කරගැනීමට අමතරව, ආණ්ඩුවේ බදු ආදායම වැඩි කරගැනීමට පදනමක් සකසා දෙන දළ දේශීය නිෂ්පාදිතය, 2022 දී 8.7% කින් පහළ ගිය අතර 2023 වර්ෂය දී අපේක්ෂා කරනුයේ තවත් 3.0% කින් ආර්ථිකය හැකිළීමයි. ෂළුජ වාර්තාවේ පුරෝකථනයට අනුව 2024, 2025 හා 2026 දී අපේක්ෂා කරනුයේ පිළිවෙළින් 1.5%, 2.6% හා 3.0% ක ආර්ථික වර්ධනයකි. අලුත් ණය හා විදේශ ආයෝජන ලැබෙන බවද පුරෝකථනය කරමින් 2026 අවසාන වනවිට අත්කර ගැනීමට අපේක්ෂිත ආර්ථිකයේ තත්වය, 2021 දී තිබූ තත්වයටත් වඩා පහළ මට්ටමකි.

### යටි අරමුණු සහිතයි

රටේ ආර්ථිකය ගොඩගැනීම හා මහජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ දැමීම වෙනුවට, ආණ්ඩුවේ බලය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය එකම අරමුණ කරගනිමින්, IMF විස්තීරණ අරමුදල් පහසුකම අනුමත වූ බව පෙනෙන්නට තිබේ. ඒ නිසා සමස්ත ආර්ථිකය දියුණු කිරීමේ අඩිතාලම ලෙස හුවා දක්වමින් මහජනතාව නොමඟ යැවීමත්, දූෂණය හා වංචාවට එරෙහිව පැනනැගුණු මහජන විරෝධය යටපත් කිරීමත්, ප්‍රතිවිරෝධයකින් තොරව බදු වැඩි කිරීම හා, පොදු දේපළ විකිණීම සඳහා සැලසුම් සහගතවම ආර්ථිකය හකුළුවා තබන්නේද යන සැකයද පැන නගී.

උද්ධමනය අඩු කිරීම (මුදල් සැපයුම පාලනය කිරීම මඟින් පමණක්), පොළී අනුපාත හා විදේශ විනිමය අනුපාත වෙළඳපොළ මත නිශ්චය වීමට ඉඩ හැරීම, මූල්‍ය ස්ථාවරත්වය අත්පත් කරගැනීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ තුළ ඇති ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය අඩුකිරීම හා මහ බැංකුව ස්වාධීන කිරීම යන දර්ශක, ආර්ථිකය දියුණු කිරීම සියලු ආර්ථික



ක්‍රියාකාරකම් සුසංයෝජනය වූ සමස්ත වැඩපිළිවෙළක් තුළ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සකස් කර නැත. ඒවා හුදෙක්ම ලේඛන හා අතාත්වික, තනි තනි පුරෝකථන මත IMF අරමුදල් ලබා ගැනීම සඳහා පමණක්ම ඉදිරිපත් කර ඇති බව පෙනේ.

එක අතකින්, විදුලිය හා ඉන්ධන වැනි උපයෝගිතා එහි පිරිවැය මත මිල කළ යුතු බව පවසන අතරම, ඉන්ධන මිල නියම කිරීමේදී අයකරන බදු දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2023 දී 0.3% දක්වා වර්ධනය කරගත යුතු බව සඳහන් කර ඇත. පුද්ගල බදු නිදහස් සීමාව අඩුකිරීම්, බදු අනුපාත වැඩි කිරීම සිදු කර ඇත. මේ සියලු අහිතකර බලපෑම් හා පීඩනයන් මහජනතාව මත පැටවීම අනිවාර්යයක් වී ඇත.

පවතින තත්වය හා හකුළන ආර්ථිකයක් තුළ, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 10% ට වඩා අඩු මට්ටමක පවතින ආණ්ඩුවේ ආදායම, 2025 දී 14% දක්වා වර්ධනය කිරීමේ ඉලක්කය ප්‍රයෝගික නොවන අතර, අසාධාරණ බදු වැඩිකිරීම්, බදු ආශ්‍රිතව වංචා හා දූෂණ තවත් වැඩි වීමටද හේතුවිය හැක.

රාජ්‍ය සේවක පඩි වැඩිවීම්, හා පෙන්ෂන් වැඩි වීම සීමා කළ යුතු බවත්, එවැනි වැඩි වීම් සිදුවන්නේනම් ඒවා උද්ධමන අනුපාතයට වඩා අඩුවෙන් පවත්වාගැනීමට යෝජනා කිරීම මඟින් මූර්ත වැටුප තවත් පහළ යන අතර, එමඟින් මහජනතාවට මුහුණ දීමට සිදුවන පීඩනය නොසලකා ඇත.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, විදුලිබල මණ්ඩලය, Sri Lankan Airline ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම නමින් අනුමැතිය ලබා දෙන්නේ, එවැනි ආයතන ලබාගෙන ඇති විශාල ණය ප්‍රමාණය මහජනතාව මත පැටවීම ය.

මෙම ක්‍රියාවලියේ තවත් ප්‍රධාන කොටසක් වන, ණය තිරසරභාවය අත්පත් කර ගැනීමේ ඉලක්කය පහසු නොවන අතර, දැනට වාර්තා කර ඇති පරිදි, ද.දේ. නි. ප්‍රතිශතයක් ලෙස 128% වන

**පවතින තත්වය හා හකුළන ආර්ථිකයක් තුළ, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 10% ට වඩා අඩු මට්ටමක පවතින ආණ්ඩුවේ ආදායම, 2025 දී 14% දක්වා වර්ධනය කිරීමේ ඉලක්කය ප්‍රයෝගික නොවන අතර, අසාධාරණ බදු වැඩිකිරීම්, බදු ආශ්‍රිතව වංචා හා දූෂණ තවත් වැඩි වීමටද හේතුවිය හැක.**

රාජ්‍ය ණය 2032 දී 95% කට පහත දැමීමේ අපේක්ෂාව එක් අතකින් ශ්‍රී ලංකාවට තම සැලැස්මක් මත ණය තුලනය මඟින් අත්පත් කරගත හැකි ආර්ථික විභවයන් සීමාකරන අතර අනෙක් අතට, වේගයෙන් වෙනස් වන විදේශ විනිමය අනුපාත යටතේ හා සෘණ හා නොසැලකිය යුතු ආර්ථික වර්ධනයක් යටතේ, පොදු ණය වාර්තා කරන මට්ටමේ පවත්වාගැනීමද අසීරු වේ.

තවද, 2027-2032 කාලසීමාව තුළ විදේශ ණය සේවාකරණය ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස 4.5% මට්ටමට ගෙන ඒම, ඉහළ පොලී අනුපාත යටතේ ආණ්ඩුව ලබාගෙන ඇති ණය, ඉදිරියේ දී ලබාගැනීමට අපේක්ෂිත ණය සඳහා වන වැඩි පොලිය, රුපියලේ අගය අවප්‍රමාණ ප්‍රවණතාව නිසා පහසු කටයුත්තක් නොවේ.

### දේශීය ණය කපා හැරීම

ලංකාවට ස්වෛරී බැඳුම්කර හරහා ණය ලබා දී ඇති කණ්ඩායම් සමගද සාකච්ඡා සිදුකරන විට ඔවුන්ගේ පැත්තෙන් ඉදිරිපත්වී ඇති ප්‍රධාන කරුණක් වී ඇත්තේ ලංකාවට ණය සහන ලබා දීමට නම් ලංකාව සිය දේශීය ණය කපාහැරීමක් සිදුකළ යුතු බවය. ආණ්ඩුවට මූල්‍ය අරමුදලේ නියෝජිතයන් මේ බව කල් ඇතුවම දන්වා සිටියද ආණ්ඩුව මුලදී දිගටම ප්‍රකාශ කළේ දේශීය ණය කපාහැරීමක් සිදු නොකරන බවය. එහෙත් ජුනි මස අවසානයේ මේ ගැන රටට හෙළි කිරීමටත්, දේශීය ණය කපාහැරීමේ යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීමටත් ආණ්ඩුව කඩිමුඩියේ කටයුතු කළේය.

ඒ අනුව EPF/ ETF අරමුදල්වලින් ආණ්ඩුව ලබාගෙන ඇති ණය සඳහා යෝජනා කිහිපයක් සම්මත කරගන්නා ලදී. එමගින් භාණ්ඩාගාර බිල්පත් සියල්ල යළි අතින් නිකුත් කරන අතර කලින් පැවති ඉහළ පොලී අනුපාතික වෙනුවට 2025 දක්වා 12% ක පොලියකුත් ඉන් පසුව 09% ක පොලියකුත් ලෙස පොලී අනුපාතික පහත දමා ඇත. මෙය බරපතළ ලෙස EPF/ ETF අරමුදල්වල ප්‍රතිලාභීන්ට

බලපාන්නකි. තවද EPF/ ETF අරමුදල්ද ඇතුළත් වන අරමුදල් 117ක් තිබෙන අතර ඒවා සඳහා 30%ක බද්දක් පනවන බව ප්‍රකාශ කර ඇත. එසේ බදුපැනවීමෙන් නිදහස් වීමට නම් ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන පොලී අනුපාතික පහත දැමීමේ සැලැස්මට එම අරමුදල් ඇතුළත් විය යුතු වේ. "මග හිටියොත් තෝ නසී ගෙදර ගියොත් අම්බු නසී" කියමන මෙහි දී සිහිපත් වේ. මේ සියල්ල මගින් අමෙරිකානු ඩොලර් බිලියන 19කින් දේශීය ණය කපා හැරීමට ආණ්ඩුව අපේක්ෂා කරයි.

මෙහි ඇති බරපතළම කරුණ වන්නේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ තීන්දු තීරණ ගැනීමේ බලය මුදල් ඇමතිවරයාට පැවරෙන සංශෝධනයක්ද මෙහිදී සිදු කිරීමයි. ඒ අනුව මේ කුමක් සම්මත කර තිබුණද මුදල් අමාත්‍ය වගකීම දරන ජනාධිපති රනිල් වික්‍රමසිංහට මේ සම්බන්ද තනි තීරණ ගැනීමේ අත්තනෝමතික බලයක් හිමිව ඇත.
මහ බැංකුව ස්වාධීන කිරීමට බැංකු පනත සංශෝධනය කිරීමට යෝජිතය. විශේෂයෙන්ම ආණ්ඩුවේ අයවැය හිඟය පියවීමට මුදල් මුද්‍රණය කරමින් මහ බැංකුවෙන් ණය සැපයීම එමගින් වලක්වාලයි. නව සංශෝධන යටතේ භාණ්ඩාගාර ලේකම් මුල්‍ය මණ්ඩලයෙන් ඉවත් කිරීමට නියමිතය. එසේ වුවද මූල්‍ය ප්‍රතිපත්ති තීන්දු ගන්නා මුදල් මණ්ඩලයටද, මහබැංකු පරිපාලන තීන්දු ගන්නා පාලක මණ්ඩලයටද තමාට අවශ්‍ය අය පත්කරගැනීමේ බලය වක්‍රාකාරයෙන් ජනාධිපති අත තබා ගනී.

## ඇති විය හැකි බරපතළ ප්‍රතිවිපාක

01) ණය ප්‍රතිව්‍යුහගතකරණය මගින් දේශීය වශයෙන් වැඩකරන ජනතාවගේ අයිතීන් කප්පාදුවට ලක් වීම. දැනටමත් අර්ථසාධක අරමුදල් හා රක්ෂණ අරමුදල් හා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනය කර ඇත.

දේශීය ණය ප්‍රතිව්‍යුහගතකිරීමට මුදල් ඇමතිට පවරා ඇති බලතල අනුව බැංකු මගින් රජයට ලබාදී ඇති ණය කපා හැරීමට තීන්දු කළහොත් එමගින් බරපතළ ප්‍රතිඵල ගෙන දෙනු ඇත.

රාජ්‍ය බැංකු රජයට ලබාදී ඇති ණය ප්‍රමාණය.

- ලංකා බැංකුව රුපියල් බිලියන 1566
- ඉතිරි කිරීමේ බැංකුව රුපියල් බිලියන 961
- මහජන බැංකුව රුපියල් බිලියන 906

03) නව මහ බැංකු පනත මගින් මහ බැංකුව පාර්ලිමේන්තු නියාමනයෙන් ඉවත්කිරීම මගින් ඇතිවිය හැකි අර්බුදයන් රැසකි. දැනටමත් මේ පිළිබඳව විරෝධයන් මතු කර ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝග කර ඇති නිසා ආණ්ඩුව තාවකාලිකව එම බැංකු පනත ක්‍රියාත්මක කිරීම නවතා ඇත.

04) වෘත්තීය සමිති හා ජනතා විරෝධයන් මර්දනයට අවශ්‍ය නව නීති සම්පාදනයට ක්‍රියා කිරීමට ප්‍රති ත්‍රස්ත පනත වැනි මර්දන අණපනත් ගෙන එමින් තිබේ.

05) රජය බලශක්තිය ඇතුළු ජනතා සම්පත් විකිණීම හා රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය මගින් විදේශ විනිමය ඉපයීමට දරන උත්සාහය තුළින් අනාගත






පරම්පරාවන්ට භුක්ති විඳීමට ඇති මහජන දේපළ ජනතාවට අහිමි කිරීම.

06) ජනතාව මෙතෙක් භුක්ති විඳි සමාජ සුබසාධන පහසුකම් කප්පාදු කිරීමට ලක්වීම. මේ වනවිටත් සමාජ සුභසාධන ප්‍රතිලාභ ලෙස ජනතාව බුක්ති විඳි සමෘද්ධි ප්‍රතිලාභයට අදාළ වන පවුල් ප්‍රමාණය පළමු පියවරේදීම ලක්ෂ තුනකින් පමණ අඩු කිරීමට නීති සම්පාදනය කර ඇත. අස්වැසුම නමින් එන මෙම ව්‍යාපෘතියට අනුව 2023 දෙසැම්බර් වනවිට එයිනුත් ලක්ෂ 04ක් ඉවත් කෙරේ. එවිට ඉතිරි වන්නේ සහනාධාරලාභීන් ලක්ෂ 16කි. 2024 මාර්තු මාසය අවසන්වන විට තවත් ලක්ෂ 04ක් ඉන් ඉවත් කෙරේ. ඉතිරිවන ලක්ෂ 12ක පිරිසට 2025 මැද දක්වා සහනාධාර ලැබෙන බව සඳහන් වේ.

07) 2023 ආදායම් ඉපයීමට අදාළව වැටී බදු ප්‍රතිශතයන් 8% සිට 15% දක්වා ඉහ දමා ඇත. 2024 දී යෝජනා බදු ඉලක්ක සඳහා මෙම ප්‍රතිශතයන් තවත් ඉහළ දමනු ඇත.

08) උපයන විට ගෙවීම බදු ප්‍රතිශතයන් ඉතා ඉහළ ප්‍රතිශතයකින් 6% සිට 36% ඉහළ දමා ඇති නිසා වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් වැනි වෘත්තිකයන් විශාල ලෙස රට හැරදා යාමට පටන්ගෙන ඇති හා ඉදිරියේදී එම තත්වය තවත් ඉහළ යනු ඇත.

09) මූල්‍ය අරමුදල ඇමරිකානු ඩොලර් බිලියන 2.9 ලබාදෙන තත්වය යටතේ ලංකාවේ ආණ්ඩුව අදාළ කාලසීමාව තුළ ඩොලර් බිලියන 13 ක ණය වෙනත් පාර්ශ්වයන්ගෙන් ගෙවීම කළයුතු වේ. එසේම ඩොලර් බිලියන 20.4 ගෙවිය යුතු ණය ලෙස 2024 වසර අගදී ඉතිරි වේ. ණය සහනය ලබාගැනීම සාර්ථක ලෙස ඉටු කර ගැනීමට ඩොලර් බිලියන 14 එම ප්‍රමාණයවත් මෙම කාලසීමාව තුළදී ආපසු ගෙවිය යුතු මුළු ණය ප්‍රමාණයෙන් ඩොලර් බිලියන 27 අයකරගැනීමට හැකියාවක් ලංකාවේ පාලකයන්ට නොලැබේ. මේ වනවිට මූල්‍ය අරමුදලේ නියෝජිතයන් ප්‍රකාශ කර ඇති පරිදි මෙම ණය පහසුකම් සඳහා ලබාදී ඇත්තේ උද්ධමනය අනුව වෙනස් වන පොලී අනුපාතයක් බැවින් තවත් අර්බුදය උග්‍ර වී ලංකාව ණය උගුලකට සිරවීම අනිවාර්ය ප්‍රතිඵලය වේ.

10) මෙම ණය අනුමතකර දීම මූල්‍ය අරමුදල සිදුකර ඇත්තේ හුදෙක් දේශපාලන වශයෙන් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ආරක්ෂා කිරීම සහ අර්බුදයට පත් ධනේශ්වර ආර්ථික යාන්ත්‍රණය ආරක්ෂා කිරීම මිස ලංකාවේ ආර්ථිකය ආරක්ෂා කිරීමට නොවන බව මනාව පැහැදිලිය.

## පංති දේශපාලන අරමුණු

මූල්‍ය අරමුදලේ ජනවාරි ඉදිරිපත් කළ වැඩපිළිවෙළ තුළ පවා සඳහන් නොවූ ලංකාවට ණය අනුමත කිරීම මාර්තු වනවිට කඩිමුඩියේ සම්මත කිරීම මගින්ද, ඔවුන් මුලින් සඳහන් කළ ජනවරමක් සහිත පාලනයක් තිබීමේ අවශ්‍යතාව නොසලකා මැතිවරණ කල්දමන ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවට ණය ලබා දීමට ක්‍රියාත්මක වීම මගින්ද එම අධිරාජ්‍යවාදී වුවමනාව පැහැදිලි වේ.

ලංකාව තුළ අධිරාජ්‍යවාදී රටවල සහ මූල්‍ය අරමුදල ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන පිළිබඳව ඉතිහාසයේ සිටම මනා අවබෝධයක් ඇත. එම අවබෝධය ඇති කිරීමේදී ලාංකේය වමේ ව්‍යාපාරයේ අධ්‍යයනය හා ජනතාව දැනුවත් කිරීම ඉවහල් වී ඇත. ඒ නිසාම භූ දේශපාලනික වශයෙන් ලෝකයේ සුවිශේෂී ස්ථානයක පිහිටි ශ්‍රී ලංකාව ආර්ථික, දේශපාලනික වශයෙන් මුළුමනින්ම යටත් කිරීමට අධිරාජ්‍යවාදී ප්‍රාග්ධන බලයට හා දේශපාලන බලයට මේ දක්වා නොහැකි වී ඇත.



**ඩේවිඩ්සන් එල්බුඩූ** (Davison L Budhoo)

*ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආර්ථික විශේෂඥ*

*(වසර 12ක් සේවය කිරීමෙන් පසු තම ඉල්ලා අස්වීමේ ලිපිය ඉදිරිපත් කරමින්)*

"කිසිම රටක් දියුණුවේ මගට යොමු කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමත් වූ බවට සාක්ෂ්‍ය නැත. දකුණු කොරියාව හා තායිවානය ගැන ඇතැම් අය කතා කරති. එහෙත් දේශපාලන හේතු මත ඇමරිකා එක්සත් ජනපදය මේ රටවල් දෙකට විශාල මුදලක් පොම්ප කර ඇත. මූල්‍ය අරමුදලේ වැටසටහන් හේතුවෙන් යම් රටක් මුලදී පැවතියාට වඩා ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වී ඇතැයි කියනා අයෙක් වේ නම් ඉදිරියට එන ලෙස මම අභියෝග කරමි.

අවුරුදු දොළහකට පෙර ඔබේ සංවිධානය විසින් මට පැළඳවූ වෙස් මුහුණ මම ඉරා දැමුවෙමි. අද සිට මගේ මාර්ගෝපදේශකයා වන්නේ මගේම හෘද සාක්ෂ්‍යයයි. මේ රටේ ආර්ථික හා මූල්‍ය කටයුතු පිළිබඳ තත්වය වැරදි ලෙස පෙන්නුම් කිරීමට අපට හැකිවන සේ ඇතැම් වැදගත් සංඛ්‍යා ලේඛන අපි අමු අමුවේ විනාශ කළෙමු.

දෙළොස් වසරකට අධික සේවා කාලයකින් පසු අද මම ඉල්ලා අස්වන්නෙමි. ලතින් ඇමරිකාව, බටහිර ඉන්දීය කොදෙව් හා අප්‍රිකාවේ රටවලටත්, එහි ජනතාවටත් ඔබගේ තිත්ත බෙහෙත් හා කූට ප්‍රයෝග ගිල්වීමේ කාර්යයෙහි මම අවුරුදු 12ක්ද, ක්ෂේත්‍රයේ දින 1000ක්ද නිරත වී සිටියෙමි. මට මගේ මේ ඉල්ලා අස්වීම මිල කළ නොහැකි තරම් වටිනා නිදහසක් ගෙනදෙයි. කෝටි ගණනක් හාමතේ පසුවන දුගී දුප්පතුන්ගේ ලේ තැවරුණු මගේ දෑත සෝදාගැනීමේ මුල්පියවර මේ ඉල්ලා අස්වීම නිසා මට ලැබීමට ඊට හේතුවයි.

කැමඩෙයස් මහත්මයාණෙනි,

ලේ කඳ කෙතෙක්දැයි කිවහොත් එය දෙගොඩතලා යන ගංගාවක් බඳුය. ඒ ලේ වියළී කැටි ගැසෙයි. ඒ ලේ කැටි මගේ සිරුර පුරා තැවරී තිබේ. ඔබේ සංවිධානයෙහි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි නාමයෙන් මා කළ දේ සෝදා හැරීමට ප්‍රමාණවත් සබන් ප්‍රමාණයක් මේ මුළු ධරණීතලයේම වුව නැතැයි ඇතැම් විටෙක මට සිතේ."



සේනාධිපති තෙරෙන්සියුස් අධිරාජයාගේ අණ පරිදි යුද්ධ සියල්ලම ජයගෙන ආපසු රෝමයට ජයග්‍රාහී ලෙස පැමිණියේය. අගනුවරට පැමිණි ඔහු අධිරාජයා බැහැදැකීම සඳහා අවසර පැතීය.
සේනාධිපතියා ආදරයෙන් පිළිගත් අධිරාජයා හමුදාවට කරන ලද සේවය සඳහා ඔහුට ස්තුති කර එයට කළගුණ සැලකීමක් වශයෙන් මන්ත්‍රණ සභාවේ උසස් පදවියක්ද දෙන බවට පොරොන්දු විය.
තෙරෙන්සියුස්ට අවශ්‍යව තිබුණේ වෙනකකි. ඔහු එයට අකැමැත්ත පළ කළේය.
“ඔබේ කීර්තිමත් නාමය ආරක්ෂා කිරීමටත්, ඔබේ බල පරාක්‍රමය පැතිරවීමටත් මම මහා යුද්ධ ජයග්‍රහණය කළා. මම මරණයට බිය වූවේ නැහැ. මට එක ප්‍රාණයක් නොව, බොහෝ ගණනක් තිබුනොත් ඒ සියල්ලම ඔබ සඳහා කැප කරනවා. එහෙත් මගේ තරුණ කාලේ ගෙවී ගිහින් යුද්ධ කරලා මහන්සියි. මගේ ඇගේ ලේ දුවන්නේ බොහොම හෙමින්. මගේ පරපුරෙන් පැවත එන ගෙයක විවේක ගන්නත්, ගෘහ ජීවිතයේ සතුට විඳින්නත් දැන් කාලය ඇවිදින් තියෙනවා.”
“තෙරෙන්සියුස් මොනවද මගෙන් බලාපොරොත්තු වෙන්නේ?” අධිරාජයා ප්‍රශ්න කළේය.
“අධිරාජයානෙනි කරුණාවෙන් සවන් දෙන්න! සෑම දිනකම මගේ කඩුව මගේ ලේවලින් පණපොවමින් හමුදා සේවයේ බොහෝ කාලයක් සිටි නිසා මට කිසිම වස්තුවක් උපයා ගන්න බැරිවුණා. මම දුප්පත්...”
“වීර තෙරෙන්සියුස් අවශ්‍ය දෑ කියන්න.”
“ඔබේ යටහත් සේවකයාට උදව් කිරීමට කැමති නම් අවසාන කාලය ගෙදරට වී සාමයෙන් ගතකිරීමට ඔබේ ත්‍යාගශීලී භාවයෙන් ඔහුට ආධාර කරන්න. ශ්‍රේෂ්ඨ මන්ත්‍රණ සභාවේ උසස් පදවි මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම කැමතියි රාජකාරියෙන් ඈත් වී නිදහසේ විවේක ගන්න. මගේ ජීවිතයේ ඉතිරි කාලය ගත කිරීම සඳහා මට මුදල් ටිකක් ලබා දෙන්න.”
අධිරාජයා ත්‍යාගශීලියෙකු නොවීය. තමන් සඳහා මුදල් රැස්කිරීමට ප්‍රියකළ ඔහු අනුන් සඳහා වියදම් කිරීමට මැලිවිය. සෙන්පතියාගේ ඉල්ලීම නිසා ඔහු කල්පනාවට වැටිණි.
“තෙරෙන්සියුස්, ඔබට කොපමණ මුදලක් අවශ්‍යද?” අධිරාජයා ප්‍රශ්න කළේය.
“දිනාර් දස ලක්ෂයක්, අධිරාජයානෙනි”
අධිරාජයා නැවතත් කල්පනාවට වැටිණි. තෙරෙන්සියුස් හිස පහත් කරගෙන බලාපොරොත්තුව සිටියේය.
අවසානයේදී අධිරාජයා මෙසේ කීවේය.
“වීර තෙරෙන්සියුස්! ඔබ ශ්‍රේෂ්ඨ රණකාමියෙක්. ඔබේ විජයග්‍රහණ නිසා ඔබ තෑගි ලැබිය යුතුයි. මම ඔබට

වස්තුව දෙන්නම්. හෙට මධ්‍යම දහවල් මගේ තීරණය ඔබට දැනගන්න පුළුවනි."
තෙරෙන්සියුස් ආචාර කර පිටවී ගියේය.
ඊළඟ දින නියමිත වේලාවට සෙන්පතියා මාළිගාවට පැමිණියේය.
"ආයුබෝවන්, වීර තෙරෙන්සියුස්" අධිරාජයා ඔහු පිළිගත් අතර තෙරෙන්සියුස් සීරුවෙන් ආචාර කළේය.
"අධිරාජයානෙනි, ඔබේ තීරණය දැනගන්න මම කැමතියි. මට වස්තුව ලබාදීමට ඔබ පොරොන්දු වුණා."
"ඔබ වැනි විරෝදාර රණකාමියෙක් තම සේවය සඳහා සුළු තෑග්ගක් ලබාගන්නවාට මම කැමති නැහැ. මට කන් දෙන්න. මගේ භාණ්ඩාගාරයේ ලක්ෂ පනහක් බ්‍රාස් (දිනාර් පහෙන් එකක් වටිනා කුඩා කාසියකි.) කාසි තිබෙනවා. ඔබ භාණ්ඩාගාරයට ගොස් එක කාසියක් ගෙනවිත් මගේ දෙපා ළඟ තබන්න. ඊළඟ දවසේත් භාණ්ඩාගාරයට ගොස් බ්‍රාස් දෙකක් වටිනා කාසියක් ගෙනවිත් පළමුවැනි කාසිය ළඟම තියන්න. තුන්වැනි දවසේ බ්‍රාස් 4ක් වටිනා කාසියක්ද, හතරවැනි දවසේ බ්‍රාස් 8ක්ද, පස්වැනි දවසේ බ්‍රාස් 16ක් ද ආදී වශයෙන් කාසි ගෙනෙන්න. ඒ ඒ වටිනාකමෙන් යුත් කාසි සැමදාම සූදානම් කරන්න මම අණ කරන්නම්. කාසි ඉසිලීමට ඔබට ශක්තිය තිබෙන තුරු මගේ භාණ්ඩාගාරයෙන් ඒවා ගෙනෙන්න. ඔබට උදව්කරන්න කිසිම කෙනෙකුට තහනම්; ඔබ ඔබේ ශක්තියෙන්ම කාසි ඉසිලිය යුතුය. ඔබට කාසි ඉසිලීමට නොහැකි වූ විට එය නවත්වන්න. එයින්ම අපේ ගිවිසුමත් අවලංගු වෙනවා. එහෙත් ඔබ විසින් භාණ්ඩාගාරයෙන් ගෙනෙන ලද සියලුම කාසි ඔබට අයිති වෙනවා"
අධිරාජයා විසින් කියන ලද සෑම වචනයක්ම තෙරෙන්සියුස් ආශාවෙන් අසා සිටියේය.
එකකට එකක් විශාල කාසි ගොඩක්ද ඔහු ඒවා රාජකීය භාණ්ඩාගාරයෙන් ගෙනෙන හැටිද තෙරෙන්සියුස්ට මැවී පෙනිණ.
"අධිරාජයානෙනි! මම එයට එකඟයි. ඔබේ තෑග්ග ඇත්ත වශයෙන්ම ඉතාමත් අගෙයි." ඔහු සතුටින් කීවේය.
තෙරෙන්සියුස් සැමදාම රාජකීය භාණ්ඩාගාරයට ඒම ආරම්භ විය. එය පිහිටා තිබුණේ අධිරාජයාගේ අමුත්තන් පිළිගන්නා ශාලාව කිට්ටුවමය. පළමුවැනි කාසිය රැගෙන ඒම තෙරෙන්සියුස්ට අමාරු කාරියක් නොවීය.
පළමුවැනි දිනයේ බ්‍රාස් එකක් වටිනා කාසියක් ඔහු ගෙනාවේය. එය ග්‍රෑම් 5ක් බරැති මි. මී. 21 විෂ්කම්භයක් ඇති කුඩා කාසියකි. (ශත පනහේ කාසියකට වඩා තරමක් විශාලය. - අනුවාදක)
දෙවැනි, තුන්වැනි, සතරවැනි, පස්වැනි හා සයවැනි දිනවලද දෙගුණයක්, සතරගුණයක්, අටගුණයක්, 16 ගුණයක්, 32 ගුණයක් බරැති කාසි ගෙන ඒම සෙන්පතියාට එතරම් අසීරු නොවීය.
හත්වැනි කාසියේ බර ග්‍රෑම් 320ක් විය. විෂ්කම්භය සෙ. මී. 8.4 කි. (හරියටම මි. මී. 84)
අටවැනි දිනයේදී තෙරෙන්සියුස් බ්‍රාස් 128 කට සමාන කාසියක් ගෙන ගියේය. එහි බර ග්‍රෑම් 640 ක් වූ අතර විෂ්කම්භය සෙ. මී. 10.5ක් පමණ විය.
නවවැනි දිනයේදී තෙරෙන්සියුස් බ්‍රාස් 256 ක වටිනාකමක් ඇති කාසියක් ගෙනාවේය. එහි විෂ්කම්භය සෙ. මී. 13කි. බර කි. ග්‍රෑම් 1 1/4 ට වැඩි විය.
දොළොස් වැනි දවස වන විට කාසියේ විෂ්කම්භය සෙ. මී. 27ක් වූ අතර බර කි. ග්‍රෑම් 10 1/4 ක් විය.
සේනාධිපතියාට මෙතෙක් හිතවත්කමක් දැක්වූ අධිරාජයා තම ජයග්‍රහණය විවෘතවම පෙන්වීමට පටන් ගත්තේය.
දොළොස් වතාවක් භාණ්ඩාගාරයෙන් මුදල් ගෙන ආ නමුත් මෙතෙක් පිටවී ඇත්තේ තඹ කාසි 2000ක් පමණකි.
දහතුන්වැනි දිනයේදී වීර තෙරෙන්සියුස් කාසි 4,096 ක් වටිනා කාසියක් ගෙනාවේය. එහි විෂ්කම්භය සෙ.මී. 34ක් වූ අතර බර කි. ග්‍රෑම් 20 1/2ක් විය.
දහහතරවැනි දිනයේදී තෙරෙන්සියුස් විෂ්කම්භය සෙ.මී. 42ක් හා බර කි.ග්‍රෑ. 41ක් වූ කාසියක් භාණ්ඩාගාරයෙන් ගෙනාවේය.
"වීර තෙරෙන්සියුස්, නුඹට තවම මහන්සි නැද්ද?" සිනහව මැඩපවත්වා ගනිමින් අධිරාජයා ප්‍රශ්න කළේය.
"නැහැ. මගේ අධිරාජයානෙනි." නළලේ ඩහදිය පිසදමමින් තෙරෙන්සියුස් උත්තර දුන්නේය.
පහළොස්වැනි දිනය ළඟා විය. තෙරෙන්සියුස් බ්‍රාස් 16,384ක් වටිනාකමක් ඇති මහා කාසිය අධිරාජයා වෙත අමාරුවෙන් ගෙනාවේය. එහි විෂ්කම්භය සෙ.මී. 53ක් වූ අතර බර කි. ග්‍රෑ. 80 කි.
දහසයවැනි දිනයේදී සෙන්පතියා කාසිය උරහිස් මත තබා අමාරුවෙන් අධිරාජයා වෙත ආවේය. එම කාසිය බ්‍රාස් 32,768 වටිනා කාසිවලින් තැනුවකි. එහි බර කි. ග්‍රෑ.164 ක් වූ අතර විෂ්කම්භය සෙ. මී. 67 ක් විය.
සෙන්පතියා බොහෝ මහන්සි වී සිටියේය. අමාරුවෙන් හති ළෑවේය. අධිරාජයාට සිනහ පහළ විය.
ඊළඟ දිනයේදී තෙරෙන්සියුස් අධිරාජයාගේ මාලිගාවට පැමිණි විට සියලු දෙනාම කොක්හඬ ලා සිනාසී ඔහු පිළිගත්හ. එම කාසිය තෙරෙන්සියුස්ට උසුලාගෙන ඒමට නොහැකි විය. ඔහු එය රෝදයක් මෙන් පෙරළා ගෙන

ආවේය. කාසියේ විෂ්කම්භය සෙ. මී. 84 ක් වූ අතර බර කි. ග්‍රෑ. 328 ක් විය. කාසි 65,536 ක බරට එහි බර සමාන විය.

දහඅටවැනි දිනය තෙරෙන්සියුස් ධනවත් වීමේ අවසාන දිනය විය. එදින ඔහුගේ භාණ්ඩාගාර ගමනද එහි සිට කාසි අධිරාජයාගේ මාලිගාවට ගෙනඒමද අවසාන විය. අවසාන වශයෙන් බ්‍රාස් කාසි 1,31,072 කට සමාන කාසියක් ඔහු භාණ්ඩාගාරයෙන් ගෙනාවේය. එහි විෂ්කම්භය මීටරයකට වඩා වැඩි වූ අතර බර කි. ග්‍රෑ. 655 කි. තම හෙල්ලය ලීවරයක් ලෙස පාවිච්චි කරමින් ඉතාමත් අමාරුවෙන් තෙරෙන්සියුස් එය අධිරාජයාගේ මාලිගාවට පෙරළාගෙන ආවේය. මහා හඬක් නගමින් කාසිය අධිරාජයාගේ දෙපා මුල පතිත විය.

තෙරෙන්සියුස්ගේ ශක්තිය සිඳීගොසිනි.

“ඒ ඇති. ඊට වඩා මට බැහැ.” ඔහු කෙඳුරුවේය.

තම කපටිකම ජයගත් බව දුටු අධිරාජයා සතුට පළ කරන සිනාව අමාරුවෙන් යටපත් කරගත්තේය.

ඔහු ගෙනා කාසිවල වටිනාකමට සරිලන මුදල කොපමණදැයි ගණන් බලන ලෙස අධිරාජයා භාණ්ඩාගාර නිලධාරීන්ට නියම කළේය.

භාණ්ඩාගාර නිලධාරීහු රජතුමාට වටිනාකම දන්වා සිටියහ.

“අධිරාජයානෙනි, ඔබතුමාගේ ත්‍යාගශීලීභාවයට පිංසිදු වන්නට ජයග්‍රාහී රණකාමී තෙරෙන්සියුස් බ්‍රාස් 2,62,143 ක් ලබා ගත්තා.”

ඒ අනුව සෙන්පතියා ඉල්ලූ දිනාර් ලක්ෂ දහය මෙන් 20 ගුණයක් අඩුවෙන් අධිරාජයා ඔහුට ගෙව්වේය.

භාණ්ඩාගාරයෙන් ගෙවූ මුදලෙහි නිවැරදිතාවය සොයා බලමු.


| දිනය | බ්‍රාස් | බර ග්‍රෑම් |
|---|---|---|
| 1 | 1 | 5 |
| 2 | 2 | 10 |
| 3 | 4 | 20 |
| 4 | 8 | 40 |
| 5 | 16 | 80 |
| 6 | 32 | 160 |
| 7 | 64 | 320 |
| 8 | 128 | 640 |
| 9 | 256 | 1,280 |
| 10 | 512 | 2,560 |
| 11 | 1,524 | 5,120 |
| 12 | 2,048 | 10,240 |
| 13 | 4,096 | 20,480 |
| 14 | 8,192 | 40,960 |
| 15 | 16,984 | 81,920 |
| 16 | 32,768 | 1,63,840 |
| 17 | 65,536 | 3,27,680 |
| 18 | 1,31,072 | 6,55,360 |

මෙවැනි ශ්‍රේණියක සංඛ්‍යාවල එකතුව සොයන ක්‍රමය අපි දනිමු. 89-99 වැනි පිටුවල පෙන්වා ඇති ක්‍රමය අනුව එය සොයාගත හැකිය. එම ශ්‍රේණියේ එකතුව 2,62,143කි. තෙරෙන්සියුස් අධිරාජයාගෙන් දිනාර් දශ ලක්ෂයක්, එනම් බ්‍රාස් 50,00,000 ඉල්ලුවේය. එහෙත් ඔහුට ලැබුණේ ඉල්ලූ ප්‍රමාණයට වඩා ඉතාමත් අඩුවෙනි.

50,00,000÷ 2,62,143 = 19 ගුණයක් අඩුවෙනි.


**ගණිත විනෝදය - වයි. පෙරෙල්මාන්**

# පරෙස්සම් වන්න: නිදහස් වූ බූරුවන් හැම තැනම



බූරුවෙක්ව උගේ අයිතිකරු රාත්‍රියේ දී ගහක බැඳ තැබීමට පුරුදුව සිටියේය. එක් රාත්‍රියක භූතයෙක් පැමිණ ලණුව කපා මෙම බූරුවා නිදහස් කර දැමීය. එය සිදුවීම දාමයක ඇරඹුම විය.
ලිහා දැමුණු බූරුවා ගොස් යාබද ගොවියෙකුගේ ඉඩමක වගාවන් විනාශ කළේය. එයින් කෝපයට පත් ගොවියාගේ බිරිඳ බූරුවාට වෙඩි තබා මරා දැමුවාය.
එයින් කෝපයට පත් බූරුවාගේ අයිතිකරු ඊට පළිගැනීමක් ලෙස ගොවියාගේ බිරිඳ ඝාතනය කළේය.
තම බිරිඳගේ මරණයෙන් කෝපයට පත් අසල්වැසි ගොවියා දෑකැත්තකින් කොටා බූරුවාගේ අයිතිකරු මරා දැමීය.
මේ සිදු වීමෙන් බූරුවා අයිතිකරුගේ බිරිඳ කොතරම් කෝපයට පත් වූවාද කිවහොත් ඇය සහ ඇගේ පුත්තු එක්වී අසල්වැසි ගොවියාගේ නිවසට ගිනි තැබූහ.
තම නිවස අළු බවට පත් වූ ආකාරය දෙස බලා සිටි ගොවියා, බූරුවා අයිතිකරුගේ බිරිඳ සහ දරුවන් මරා දැමීය.
සියල්ල අවසානයේ, ඉතිරි වූ ගොවියා මෙම සිද්ධි නිසා පසුතැවිලි වූ අතර මේ සියලු දෙනා මරා දැමීමට මුල් වූයේ ඇයිදැයි භූතයාගෙන් ඇසීය.
"මම කිසිවෙකු මැරුවේ නැත, මම කළේ කඹයක බැඳ සිටි බූරුවෙකු නිදහස් කිරීම පමණය. ඔබ සියලු දෙනාම ඔබ තුළ සිටින යක්ෂයන් නිදහස් කළ අතර පසුව සිදු වූ සියල්ලටම හේතු වූයේ එය මිස මා නොවේ." භූතයා පිළිතුරු දුන්නේය.
වර්තමාන මාධ්‍යයන්ද මේ කතාවේ භූතයා වගේය. එය දිනපතාම බූරුවන් මුදා හරින අතර මිනිස්සු දෙවරක් නොසිතා එකිනෙකා සමඟ ගැටෙති; තර්ක කර ගනිති; එකිනෙකාට රිදවා ගනිති.
කෙසේ වුවද අවසානයේ මාධ්‍ය සියලු වගකීම්වලින් නිදහස් වේ.
එබැවින්, මුදා හරින සෑම බූරුවෙකුටම ප්‍රතිචාර දැක්වීමට නොයා අපගේ මිතුරන්, ඥාතීන් සහ ජනප්‍රජාව සමඟ අපගේ සබඳතා ආරක්ෂා කර ගැනීම අතිශය වැදගත්ය.

(අන්තර්ජාලය ඇසුරෙනි)



# ශිෂ්ටසම්පන්න වන්න...

යම් සංස්කෘතියක ශිෂ්ටාචාර ගත වීමේ පළමු සලකුණ ලෙස සලකන්නේ කුමක්දැයි වසර ගණනාවකට පෙර මානව විද්‍යාඥවරියක වන මාග්‍රට් මීඩ්ගෙන් ඇගේ ශිෂ්‍යයෙකු අසා සිටියේය. සිසුවා සිතුවේ මාග්‍රට් මීඩ් බිලී කොක්ක හෝ මැටි වළං හෝ ඇඹරුම් ගල් පිළිබඳව කතා කරනු ඇතැයි කියාය.

එහෙත් ඇය ඒවා පිළිබඳ කිසිත් නොකීවාය. යම් සංස්කෘතියකට අයත් මිනිසෙකුගේ කැඩුණු උකුල් ඇටයක් නැවත සනීප වී ඇත්නම් එය මිනිසා ශිෂ්ටාචාර ගත වීමේ පළමු සලකුණ වන්නේ යැයි ඇය පිළිතුරු දුන්නාය. සත්ව ලෝකය තුළ ඔබ ඔබේ පාදය බිඳ ගත්තේනම් ඔබට අත්වනු ඇත්තේ මරණයයි. ඔබට අවදානමෙන් මිදීම සඳහා දිව යාමට නොහැකිය. දියබීම සඳහා ගඟ වෙත යාමට නොහැක. ආහාර ලබා ගනු පිණිස දඩයමේ යා නොහැක. ඔබ ආහාර සොයමින් යන වන සතෙකුගේ ගොදුරක් වනු නිසැකය. කැඩුණු පාද අස්ථියක් සුවපත් වන තරම් කාලයක් කිසිදු සතෙකු ජීවත් වන්නේ නැත. නමුත් කෙනෙකුගේ කැඩුණු කලවා අස්ථියක් සුව වී තිබීමෙන් පෙනෙන්නේ ඇද වැටුණු කෙනා සමග නතර වීමටත්, ඔහුගේ තුවාලය වෙළීමටත්, ඔහු ආරක්ෂිත ස්ථානයකට ගෙනයාමටත්, සුව වන තුරු රැකබලා ගැනීමටත් තවත් කෙනෙකු කාලය වෙන් කළ බවයි. දුෂ්කරතා මැද තවත් කෙනෙකුට උදව් කිරීම ආරම්භ වූ තැන ශිෂ්ටාචාරය ඇරඹෙයි. මාග්‍රට් මීඩ් තවදුරටත් පැහැදිලි කළාය. අන්‍යයන් වෙනුවෙන් සේවය කරන විට අපි මිනිසුන් ලෙස අපේ උපරිමය කරමින් සිටිමු. ශිෂ්ටසම්පන්න වන්න...



art ආර්ට්

# හුම්මානයට ගමනක්

**කේ. ජේ. බණ්ඩාර**

සිමුගැනීමට සුදුසුම තැන ලෙස මම එය තෝරාගෙන සිටියෙමි.

වෙන්ව යාම කෙදිනකවත්, කිසිදු තැනකවත් සුමට නොවන බව මම දැනසිටියෙමි. එය කොතනක හෝ තැනක, සුවපහසු ඇඳක් මත, තමාට තවදුරටත් සුවපහසුව සැලසීමට ඇප-කැපව සිටින, ඒ වෙනුවෙන් අවශ්‍යවන ඕනෑම කැපකිරීමක් කිරීමට සුසැදී සිටින මිනිසුන්ගේ ඇස් තමා වෙතට යොමුව තිබියදී ම සිදුවිය යුතුය යන්න බොහෝ දෙනෙකුගේ විශ්වාසයයි. කෙදිනක හෝ සිය කැමැත්තෙන් සමු ගන්නට ඉඩ ලදොත්, ඒ සඳහා සමුගැනීමේ වේදනාවට සමාන රළු ස්ථානයක් ලෙසට මම එය හඳුනාගෙන සිටියෙමි.

“ඒ වුණාට එතන ලස්සන තැනක්!”අටවක කීවේය. “සුන්දරත්වය විඳින්න කියලා එන මිනිස්සුන්ගෙන් හැම සති අන්තෙකම එතන පිරෙනවා!”

“මිනිස්සු එන්නේ රළුකමේ සුන්දරත්වය විඳින්න” අනෙක් අතට ඔහුම තර්ක කළේය. “අන්තිම රළු, වේදනාත්මක දේවල් තමයි ලෝකේ ගොඩක්ම සුන්දර දේවල් කියලා විඳින්නේ”

මට ඇය සමග මා ගත කළ ප්‍රථම රාත්‍රිය සිහිපත් විය. ඒ අත්දැකීමේ චකිතය මෙන්ම ශාරීරික වේදනාවෙන් ද, අනාගතය පිළිබඳව අවිනිශ්චිත සිතිවිලිවලින් ද ඇය ඔද්දල්ව සිටියාය. සියලු සුන්දර දේ විඳගැනීමෙන් පසුව ඇතිවන හිස්කමෙන් හා උදාසීනත්වයෙන් මම දෑස් පියාගෙන සිටියෙමි. ඇගේ පපුවේ ගෝරනාඩුවත්, සුසුමේ ගිනියමත් මට ඇස් විවර කරන්නට බලකරන ලදී.

මා ඇස් අරිද්දී දුටුවේ නිල්පාට, බොඳවූ ඇස් දෙකකි.

“මොකද?” මම මඳක් සිනා සී ඇසුවෙමි.

“රිදෙනවා!”

“කොතනද?”

“මෙතන” ඇය පපුව මත අත තබා එය හෙමිහෙමින් උදරය දෙසට තල්ලු කළාය. මම වහාම ඇගේ අත ග්‍රහණයෙන් ගෙන ඇය නැවැත්වීමි.

“ඒක රිදීමක් නෙවෙයි. ඒක තමයි දරාගන්න බැරි සතුට. ඔයාට රිදෙනවා වගේ දැනෙන්නේ ඒ සතුට දරාගන්න තරම් ශක්තියක් අපට නැති නිසා. ඔයා ඒ තරමට පරිණත වෙන්න”

“මෙච්චර දරාගන්න අමාරු, වේදනාකාරී දෙයක් පරම සතුට කියලා ඔයා කියන්නේ කොහොමද?”

“ලෝකේ පරම දේවල් හැම එකක්ම, රළු, ගොරෝසු, උත්සාහයක ප්‍රතිඵලයක්. ඒක වේදනාත්මක අත්දැකීමක්ම තමයි”

ඇය නිහඬ වූවාය.

“ඉතිං, මේ විදිහට උඹ පැදුරටත් නොකියා ගියාම, ඒකත් එයාට පරම සතුටක් කියලද උඹ දැන්

කියන්න හදන්නේ?"අටවක ඇසුවේය. "හිතපං. උඹ උදේම ඇඳේ නැතිවුනාම එයා කලබල වෙන තරම. ඊට පස්සේ අර කොල්ලෝ දෙන්නා බිරාන්ත වෙන විදිහ. උන් පිස්සෝ තුන්දෙනෙක් වගේ, පාරක් පාරක් ගානේ, උඹ හොය හොය ඇවිදියි. දන්න නොදන්න මිනිස්සුන්ගෙන් අහ අහ. හිතපං එයාලට මොකද වෙන්නේ කියලා"

"එයාලා මං හොය හොයා කරදර වෙන්න ඕන නෑ" මම කීවෙමි.

පසුම්බිය සමග සියලුම මුදල් හා ණයපත් සුපුරුදු තැන්වලම තබා ආවෙමි. ගමනට අවශ්‍ය ප්‍රමාණයට වඩා යම් වැඩිපුර මුදලක් හා ජාතික හැඳුනුම්පත සාක්කුවේ විය.

"කව්රු හරි මගේ සාක්කුව ඇදලා බලපු ගමන්ම මගේ හැඳුනුම්පත ලැබෙනවා. අනික ඉන්ෂුරන්ස් එක ගන්න පුළුවන් විදිහට තමයි මං හැම දෙයක්ම කරන්නේ"

බස් නැවතුමට පැමිණි පළමු බස් රථය නික්ම යන තෙක් මම උදාසීනව බලාසිටියෙමි.

"මොකෝ, බය හිතුනද?" අටවක සාවද්‍ය හඬින් අසයි.

"තාම උදේ වැඩියි. මට මගේ වැඩේ කෙරෙනකොට වටපිටාවේ සාක්කිකාරයෝ ඉන්න ඕන. උදෙන්ම එතන්ට කට්ටිය එන්නේ නෑ"

"අද කට්ටිය ආවෙම නැත්තම්?"

"ඉරිදා. නිවාඩු දවස. අනිවාර්යයෙන්ම කට්ටිය එනවා"

අතීතය ආවර්ජනය කර බලන විට සියල්ල සිදුවූයේ බොහෝ වේගයෙනි. පළමුව විදුලිය කප්පාදුවට ලක් විය. දෙවනුව වාහනයට තෙල් නැති විය. තෙවනුව මිලදී ගැනීමට වෙළඳසැල්වල බඩු නැතිවිය. අනතුරුව, රැකියාව නැති විය.

වසර පහලවක් සේවය කළ ආයතනයේ ප්‍රධානියා වන සිඩ්නි මා කැඳවා, ශෝකයෙන් පිරි මුහුණෙන් සිය අදහස ප්‍රකාශ කළේය.

"ඔයාට අදම, වැඩකරන මිනිස්සු දෙසීයක් විතර එක්ක මේ ආයතනයේ, මගේ පුටුව බාර ගන්න පුළුවන්?"

ඔහු සන්සුන්ව කියන්නට උත්සාහ කළේය. ඒ යටින් වූ වෙව්ලුම, මගේ හිස සිට දෙපා තෙක්ම දැනුනේය.

"ඔව්, වැඩ කරගෙන යන්න බඩු නෑ. දැන් නම් බඩු තිබ්බත් කරගෙන යන්න වැඩ නෑ. අපි ළඟ තියෙන දේකින් මට තව මාස දෙකක් පඩි ගෙවන්න පුළුවන් වෙයි. ඊට පස්සේ මට කිසිම දේකට වගකියන්න බැරිවෙයි"

ඔහු කතා කළේ කාර්යාලයේ ජනේලයෙන් එපිට බලාගෙනය. මෙතනට අගනගරයම මැනවින් පෙනේ. ඔහුගේ වම්පස, උස් කුළුණු සමග ඉදිවුණු තට්ටු ගොඩනැඟිලි සමූහයකි. නිවාස සංකීර්ණ, සාප්පු සංකීර්ණ, හෝටල් ආදී එම ගොඩනැඟිලිවල නම්, මෙතනට එන හැම වාරයකම මැතිරීමට මම පුරුව සිටියෙමි. මගේ එක් සිහිනයක් වූයේ එවැනි ගොඩනැඟිල්ලක් තනිව සැලසුම් කිරීමය.

"උඹට ඕක දකුණු පැත්තේ තැනක් අරගෙන හදන්න පුළුවන්" අටවක කීවේය. "ඒ පැත්තේ අර මුඩුක්කු ගෙවල් ගොඩක් කඩල ගන්න ඉඩමක"

ප්‍රධානියාගේ වම්පස දර්ශනය ඔහු විසින් හැඳින්වූයේ "දිව්‍ය ලෝකය" නමිනි. දකුණු පසින් පෙනෙන අඩු දියුණු පෙදෙස "අපාය" නමින් හැඳින්විනි. ඉන් මෙපිට පෙනෙන අග නගරයේ ප්‍රධාන දුම්රිය පොළ ඒ නොදියුණුකම තවත් වැඩි වර්ධනය කළේය. මම එවෙලේ ඒ දෙස නෙත් යොමාගෙන සිටියෙමි.

"මිනිස්සු අරගල කළේ, සටන් කළේ අර වගේ දිව්‍ය ලෝකයක් හදා ගන්න. ඒත්, අන්තිමට වුනේ හැමෝම අර ජේන තැනටත් වඩා අන්ත අපායකට වැටිච්ච එක. දැන් අපාය හදපු උන්ම කියනවා, උන්ම දිව්‍ය ලෝකෙ හදලා දෙනකං ටිකක් ඉවසාගෙන අපා දුක් විඳින්නලු. මිනිස්සුත් එහෙම හිතනවා ඇති. ඒත්, ඒ මිනිස්සු නොදන්නා දේ තමයි, යම රජ්ජුරුවොයි, යම පල්ලොයි කවදාවත් දිව්‍ය ලෝකයක් හදන්නේ නෑ කියන එක. යම රජ්ජුරුවෝ අතට එන හැම සතයම වියදම් කරන්නේ, තමන්ගේ තැන, අපාය සංවර්ධනය කරන්න!" අටවක කීවේය.

"මං නැත්තම් මේක ඇදගෙන යන්න පුළුවන් චරිත්ට කියලා මං දන්නවා. මං කවදා හරි යනකොට මෙතන ඔයා වාඩි කරවලා යන එක තමයි මගේ තිබ්බ හීනය. ඒත්, මට ඔයාට දීලා යන්න වෙන්නේ හිස් කෝම්බයක්! ඇත්තටම, ඇතුලේ මොකවත්ම නැති හිස් කෝම්බයක්!" හැමදාම ඇස් දෙක දෙස ඍජුව බලාගෙන කතා කරන ප්‍රධානියා වෙන කොහෙදෝ බලාගෙන කීවේය.

"මොකක්ද සිඩ්නිගේ ප්ලෑන් එක?" මම ඇසුවෙමි.

"මං ඕස්ට්‍රේලියාවට යනවා"

"කවද්ද?"

"මාස දෙකකින් විතර"

අප අතර ගොරහැඩි නිහැඬියාවක් මතුවිය.

"ඔයා ඒ මාස දෙකෙත් මේ මිනිස්සුන්ට පඩිය ගෙවලම යන්න. මං හෙට ඉඳලම වැඩට එන එක නතර කරනවා සිඩ්නි!"මම නිහැඬියාව බිඳිමින් කීවෙමි.

කඩවල බඩු තිබුණද ඒවා මිලදී ගැනීමට මට මුදල් අහිමි වූයේ ඒ පරිද්දෙනි.

සිඩ්නි විසින් මගේ ජීවිත රක්ෂණ වාරිකය අඛණ්ඩව මාස දෙකක් ගෙවා ඇති බව සතියකට පෙර දැන ගතිමි.

"සර්, තිහට කලින් වාරිකේ නොගෙව්වොත් ලයිෆ් ඉන්ෂුරන්ස් එක අවලංගු වෙනවා" ටෙලිෆෝනය එහා කෙළවරින් ඇමතූ මිහිරි කටහඬක් හිමි කාන්තාව කීවාය. එදින විසිවෙනිදා විය. මවිසින් කඩිනමින් තීරණයක් ගත යුතු විය.

හදිසි අනතුරකින් මා මිය ගියහොත් ලැබෙන වන්දියෙන් ඇයටත්, දරු දෙදෙනාටත් අවම වශයෙන් වසර තුනක් යාන්තම් ජීවිතය ගැට ගසා ගත හැකි බවට මවිසින් ගණන් හදා බලා තිබිණි. එබැවින් මවිසින් සියල්ලම, නිවැරදිවම සැලසුම් කළ යුතුවිය. මා රැකියාවක් අහිමිව සිටින බවක් ඇය දැන නොසිටියාය. විස්පස්වැනිදා මිතුරු-මිතුරියන් සමග හුම්මානේ යන බව මම ඇයට දිනකට පෙර කීවෙමි. දුරකථයෙන් කතා කර සමීප වෘත්තීය යහළුවන් කිහිප දෙනෙකුටත්, මිතුරු-මිතුරියන් පිරිසක් සමග හුම්මානේ යන බව කීවෙමි.

අධිවේගී මාර්ගය ඔස්සේ ගොස් බස් දෙකකින් පහසුවෙන් හුම්මානයට ළඟාවිය හැකිය. මෙකල වාරකන් බැවින් දකුණේ මුහුද බෙහෙවින් රළුය. අහම්බෙන්, හුම්මානයේ ගල්පර අතරට ඇද වැටෙන අයෙකු ගල් දෙබොක්කාවක හිරවී නිසැකවම මිය යනු ඇත.

"වතුර ගොඩක් සීතලයි. කන් අඩි පුපුරන්න පුළුවන්" අටවක කීවේය.

"සමහර විට උඹ සිහිය නැතිවෙලා රැල්ලත් එක්ක උඩට එන්න පුළුවන්. කව්රු හරි උඹව ඉස්පිරිතාලෙකට අරගෙන ගියොත් මළ කෙළියක් නේද වෙන්නේ!"

දෙවන බසය පැමිණ මාකුඹුර බස් අංගනයේ නැවැත්වීය.

"ඉක්මනට නැග්ගොත් ජනේලේ ළඟ සීට් එකක් අල්ලා ගන්න පුළුවන්" අටවක කීවේය.

මම බස් රථයකට නැඟ කෙළවර අසුනක වාඩි වීමි.

ඇය පැමිණ මා අසල අසුන්ගත්තේ ජංගම දුරකථනයට පිළිතුරු දෙමිනි.

"මං කෙළින්ම ඉස්පිරිතාලෙටම එන්නම්" ඇගේ හඬ වෙව්ලුම්කයි. "ඔයාට මල්ලි ගැන ඔයිට වඩා ඇහැ ගහගෙන ඉන්න තිබුණා ලොකූ"

ඇගේ කටහඬේ ශෝකයක් මෙන්ම කෝපයක් ද ඇත. ඇය තවදුරටත් සිය දියණියට උපදෙස් දෙමින් සිටියාය.

"ටිකට්!" සාමාන්‍ය බස්වලට වඩා වෙනස් කොන්දස්තරවරයෙක් පැමිණ හෙමින් සිහිපත් කළේය. මම ටිකට් පතක් මිලදී ගතිමි.

"නෝනා ටිකට්!" කොන්දොස්තර පවසයි. ඇය ආයාචනාත්මකව කොන්දොස්තරවරයා දෙස බැලුවාය.

"මං තංගල්ලෙන් බැහැලා සල්ලි දුන්නට කමක් නැද්ද මල්ලී?"

ඇගේ පැනයෙන් කොන්දොස්තරවරයා වික්ෂිප්ත වූ බවක් පෙනුනි.

"බැහැපු ගමන් බැංකුවෙන් අරගෙන දෙන්නම්"

"බැංකුවේ සල්ලි තියෙනව නම්" කොන්දොස්තරවරයා සාවඥ ස්වරයෙන් පැවසුවේය.

"ඔයාට මෙතනිනුත් ගන්න පුළුවන්!" ඔහු වාද කරයි.

"මගේ ගිණුම තියෙන්නේ එහෙ!"

"කාඩ් එකක් නැද්ද?"

"නෑ!"

කොන්දොස්තරවරයා දැඩි තීරණයක් ගැනීමට තත්පර කිහිපයක් වැය කළේය.

"උඹ මැරෙන්න ඉන්නේ. උඹට ඔය හබ වැඩක් නෑ බං" අටවක දිගු නිහැඬියාවක් බිඳිමින් කීවේය.

"තදියං වෙලා ටිකට් එකට සල්ලි හෙම දෙනවා නෙවෙයි"

"මිස් මොකුත් හිතන්නේ නැත්තම් මං ටිකට් එකට සල්ලි දෙන්නම්" මම වහා කීවෙමි.

"මෝඩයා!" අටවක කෝපයෙන් කෑ ගැසුවේය.

"මැරෙන්න යන දවසේවත් රැවටෙන්නේ නැතිව හිටපං"

"ලොකුම ලොකු උදව්වක් මල්ලී. මං තංගල්ලෙන් බැහැපු ගමන් සල්ලි ටික අරගෙන දෙන්නම්" ඇය කෘතඥතා පූර්වක ස්වරයෙන් කීවාය.

"ඒකට කමක් නෑ. ඒ ගැන එච්චර හිතන්න එපා" මම කීවෙමි.

ඇය අග නගරයේ කුඩා රැකියාවක නිරත වන්නීය.

දරු දෙදෙනා සිටිනුයේ ඇගේ මව සමගය. ඇගේ සැමියා ධීවරයෙක් බව කී ඇය මේ වන විට බහුදින ධීවර යාත්‍රා ධීවර කර්මාන්තයේ නොයෙදෙන බැවින් සැමියාගේ රැකියාව අහිමිව ඇති බව කීවාය.

"ඕකා බිබී ඇවිදිනවා විතරයි. කිසිම දෙයක් හොයලා බලන්නේ නෑ. කාලකණ්ණියා." ඇය ඇසෙන, නෑසෙන හඬින් කීවාය. "කොහෙන් හොයා ගන්න සල්ලිවලින්ද මන්ද!"

ඇගේ පුතා කොල්ලන් සමග රණ්ඩුවක පටලැවී, තුවාල ලබා රෝහල්ගත කොට ඇත. ඇය හදිසියේ නිවස බලා යන්නේ එබැවිනි.

"කොල්ලගේ ලේ ගොඩක් ගිහිල්ලා" ඇය කීවාය.

ඇය විසින් මේ කෙටි තොරතුරු මා සමග පවසන ලද්දේ දිගින් දිගටම ලබාගත් දුරකතන ඇමතුම් අතර වාරයේ ලද මඳ විරාමයන්වලදීය.

"කොල්ලට ලේ උන්නන්න බල මාලු ටිකක්වත් අරගෙන දෙන්න ඕන" ඇය නැවතත් කියයි. ඇය ඒ

"මං මුං දෙන්නත් එක්ක බලු දුකක් විඳින්නේ මල්ලී. වෙලාවකට පණ නහ ගන්නත් හිතෙනවා" ඇය කීවාය. මම තිගැස්සුනෙමි.

"අන්න උඹට සෙට් වෙන කෙනෙක්. සෙට් කරගෙන උඹත් එක්කම, එක්කරගෙන ගියා නම් හරි. නියම ගමන් සගයෙක්"

අපි තංගල්ල බස් නැවතුමෙන් බැසගතිමු.

"මල්ලී මෙතන ඉන්න. මං සල්ලි අරගෙන එන්නම්" ඇය බස් නැවතුමේ එක්තරා ස්ථානයක් පෙන්වා කීවාය. මම හිස සැලීමි. ඇය සෙනග අතරින් නොපෙනී ගියාය. කුමක්දෝ හේතුවක් නිසා ඇය පෙරළා පැමිණෙන්නේද යන්න දැන ගැනීමට මට අවශ්‍ය විය.

"ඕක හොඳයි. ටිකක් ප්‍රමාද වෙන එක. දවල් වෙනකොට රැල්ලත් සැරටම එනවා" අටවක සිහිපත් කළේය.

මිනිත්තු පහලවක් පමණ ගෙවී ගියේය. ඇය නැවත පැමිණියේ නැත.

"මැරෙන්න ඉන්න එකේ උඹට මොකටද සල්ලි" අටවක කීවේය. "අනික සදහටම රැවටිච්ච උඹලා අවසාන දවසෙත් රැවටුනා කියන එක මහ ලොකු අවනම්බුවක් නෙවෙයි නේ"

මිනිත්තු තිහක් පමණ ගෙවී ගියේය. ඇය ඒ වන විටත් පැමිණියේ නැත.

"කෙනෙක් එනකං බලාගෙන ඉන්න එකත් හෙනම ආතල් එකක් නේද? විශේෂයෙන්ම ඔයා මැරෙන්න තීරණය කරලා ඉන්න වෙලාවක්!"අටවක නැවතත් නිහැඬියාව බිඳිමින් කීවේය.

පැයක් පමණ බලා සිටීමෙන් අනතුරුව මම තවත් බලාගෙන නොසිටින්නට තීරණය කළෙමි.

"උදේටත් මොකුත් කාල නැති එකේ. මොකුත් කාලම ගියොත් හොඳයි නේද?" අටවක සිහිපත් කළේය.

"බඩේ දැන් කාපු කෑම තිබ්බොත් කට්ටියගේ සැකේ අඩු වෙනවා. උඹ හිස් බඩෙන් මැරුනොත්, අනිවා සිය දිවි නසා ගන්න ආව එකෙක් කියලා දැන ගන්නවා"

මා යන්නට සැරසෙත්ම, දෑතින් මළු කිහිපයක් ගත් ඇය මා ඉදිරියේ පෙනී සිටියාය.

"මල්ලිට ගොඩක් වෙලා බලාගෙන ඉන්න වුණා නේද?" ඇය හති දමන ස්වරයෙන්, එහෙත් පසුතැවීමක හඬින් ඇසුවාය.

"සල්ලි ටිකක් ඉල්ලා ගත්තා. මං පුළු පුළුවන් විදිහට කොල්ලට කන්න දේවල් ටිකක් ගත්තා"

ඇය අත කුඩා බිස්කට් පැකැට්ටුවක් හා පෙට්ටියෙන් ඉවත් කර දුන් තුන් හුලස් චීස් පෙත්තක් සහිත බෑගයක් විය. තවත් බෑගයක වූයේ ආහාර පාර්සලයක් විය යුතුය. බාගෙට ඉදීගෙන එන ඇඹුල් කෙසෙල් ගෙඩි ඇවරි බාගයක් තවත් බෑගයක විය.

ඇය ඒ සියල්ලම එක් අතකට ගෙන, අනෙක් අතින් පසුම්බිය ඇද්දාය.

"මට මිස්ගේ ෆෝන් එක පොඩ්ඩක් දෙනවද?" මම ඇසීමි.

"ඇය විමතියෙන් මෙන් මා දෙස බැලුවාය. මගේ ස්වරූපය හා ඇඳුමට අනුව, මා අත ජංගම දුරකථනයක් නොතිබීම ඇය විශ්වාස නොකරන බව පෙනින.

"හොඳ වෙලාවට දැන් රී ලෝර්ඩ් එකක් දැම්මා" ඇය චකිතයෙන් කීවාය.

මම හිමාලිට ඇමැතුමක් ගතිමි. මුදල් පසුම්බිය හා ජංගම දුරකථනය නිවසේ තබා මා ගිය ගමන කුමක්දැයි ඇය බෙහෙවින් කලබලයට පත්ව සිටියාය. නාඳුනන දුරකථනයකින් මගේ කටහඬ ඇසෙද්දී ඇය හෙළු සැනසුම් සුසුම, මට ජංගම දුරකථනය ඔස්සේද මැනවින් ඇසුණි. මා දුරකථනය ඇයට ආපසු දෙන විට, ඇය මුදල් නෝට්ටු කිහිපයක් මා වෙත දිගු කළාය.

"මට ඒ සල්ලි එපා. ඕකෙන් මිස් පුතාට බල මාලු අරගෙන යන්න!"

# බලව සගයිනි පිපෙයි ඉර මල

බලව සගයිනි පිපෙයි ඉර මල උදා ගිර මුදුනේ
පහන් ටැඹ මුල අඳුර එකලූ මාවතකි පෙනුනේ
කණාමැදිරින් ගැයූ සීපද අපට නැහැ ඇසුණේ
බලව සගයිනි පිපෙයි ඉර මල උදා ගිර මුදුනේ
අතින් අත පටලා ගනිමු අපි දිනමු අපෙ සිහිනේ

දේශයක් ඇත දිනන්නට ඒ අපදිනූ අපෙ නිජබිමයි
පරපුරක් ඇත රකින්නට ඒ අපේ මතු දරු පරපුරයි
බලව සගයිනි පිපෙයි ඉර මල උදා ගිර මුදුනේ
අතින් අත පටලා ගනිමු අපි දිනමු අපෙ සිහිනේ
රුපු සෙනඟ සැඩ සුළං මාරුත පෙරමඟට එන බව දනිව්
බිඳ දමව් බැඳි යදම් බාධක නඟව් රණ හඬ උස් නදින්
මඟ දෙපස රතු මල් පිපී ඇත පිය නඟමු ඒ මාවතයි
තුරු හිසින් එන විහඟ ගී හඬ කියන්නේ ජය ටැඹ ළඟයි

දේශයක් ඇත දිනන්නට ඒ අපදිනූ අපෙ නිජබිමයි
පරපුරක් ඇත රකින්නට ඒ අපේ මතු දරු පරපුරයි
බලව සගයිනි පිපෙයි ඉර මල උදා ගිර මුදුනේ
අතින් අත පටලා ගනිමු අපි දිනමු අපෙ සිහිනේ

Jayantha Samarasekara
NEWZEALAND

# කිරි කොකෙක් ඔබ අමතයි

කුඩමසුනි, ගෙම්බනි
ඉදිබුවනි, දියබරියනි
මෙවිල් වාසී
මා හිතාදර යටත් වැසියනි


නියඟයන් කීයක් ආව ද?
ගඟ ගලා අතවර කෙරුව ද?
ඒ වුණත් ඔබ සැළුනද?
මේ පාරම්පරික නෙලුම් අල
මෙපින් බිම අත ඇරිය ද?

පෙඳ, පාසි, සෙවෙල මඩ ගඳ
මේ නෙලුම මඟදි මට කීවා
ඔබ විඳින අනවරත කරදර
ඒ මැදින් මඩ නොගෑවී
සුවඳට නෙලුම් පිපුනම
කාටද ඉතිං ආඩම්බර?

මඩ වලක් විලක් කල
නෙලුම් පවුලයි මේ බිමේ අභිමානය
ඉතිං අත්හරින්නට එපා
වැවක් ගැන, ඔබේ සුබ සිහිනය

මෙවරත් මේ විලෙන්
පුදසුනට යනවා මයි නෙලුමක්
පිටි පස්සේ අය අත් උස්සලා
දෙන්න බලන්න අත්පුඩියක්

**රන්සර බණ්ඩාර**





# දවසක දරන්නෝන නුඹ මේ පමාව...

කවි නොලියවෙන්නෙ රෑට
මං ඔයා ගැන වැඩිපුරම හිතන දාට
අහස දිහා බලාගෙන පඬුපාට
ඔබ ඇතැයි හිතනවා තරුවක ඈත

ආදරේ ඉබි ගමනක තබමින් ඇත් අඩි
සමනල කන්ද මුදුනට තියෙනවද කොයිතරම් පඩි
සිතුවිලි නඩය කිරිකෝඩු ආධුනික ගතිය හරි වැඩි
හිතපං මේ අවාරය තනිකම හරිම හැඩි දැඩි

වැස්ස ගැන හාංකවිසියක් ඉඟි නොදෙන අහස
පලා පැහැය විමසනවා පොළොවක මෑත
මං ආං එහෙමයි දරාගෙන මේ රහස
ඔයා මගෙ හොඳ යාළුවෙක් කියන්නයි ආස

හිතන එක දැනෙන්නෝන පෙම්වතුන් වුණාම
නොකිව්වොත් අහන්නෝන හිතන්නේ මොනාද
බැල්මකත් තියෙන්නෝන තිත නොව කොමාව
දවසක දරන්නෝන නුඹ මේ පමාව

**- දීපිකා පෙරේරා -**

# සරුංගලය...

ඉගිලෙන අතර උඹ අහසේ දුර ඈත
සිතුවෙමි දෙන්නටම ගැලපෙන යුග ගීත
හිතවත් කම් තිබුනෙ නැතුවත් ළඟ පාත
මේ තරමටම කොහොමද අපි සමපාත

පැත්තක් බර වුණොත් පැත්තක් ගැස්සෙනවා
කූරිය ගගහ හොට ඇණගෙන නවතිනවා
සේරිය වැරදුනොත් ඔක්කොම වරදිනවා
සමබර වුණොත් හරි විදියට උඩ යනවා

ඈතින් ස්වර දහස් ගණනක ගීත ගැයේ
පාතින් ප්‍රමිතිගත ස්වරයක තනුව වැයේ
සීමිත දුරක විතරයි අපි ඉගිළ ගියේ
සීමාසහිත නූලක් බැඳ තිබුණි ලයේ

කොයි වර්ගෙක හුළඟ හැමුවත් එක්වරම
හයියෙන් ගමන් බෑ ඊකයි ඉස්තිරම
නෛසර්ගික උනත් පදයේ කස්තිරම
වෛවර්ණය තමයි අහසෙදි ලස්සනම.....

**- ප්‍රගීත් කිරිඇල්ල -**

# දුෂ්කර ඉස්කෝලේ ටීචර් ගැයූ ටීකා කවිය

කරකස නියං සමේ අභිමාන ගන වනන්තරේ හීන්දිය
සීරාවක් තණ පත් ඇබිත්තක් හොයාගෙන සා
පිපාසෙන් සුදහ ගින්නෙන් හිමි හිමින් සැරේ මුව
පොව්වන් යන්නා වාගේ

ගාටා උදේ ඉස්කෝලෙට ගිය කලට

කාස්ටක අව් ගිනි දැවිල්ලෙන් දූවිලි බුරුත්තෙන්
වැහී හේබා කරකුට්ටං වුණ අන්ත අසරණ
ගස්කොළං අතු මත්තට හීතල හිරිපොද වරුසාවක්
සිරි සිරි ගගා එක දිගට ඇද හැලෙන්නා වාගේ

කාටත් සිල්ප නැණ ලැබුණායි එක ලෙසට

අච්චු පොතක් එක්සයිස් පොතක් බාල ඇඳුමක්
කැඩුමක් පෑනක් පැන්සලක් වතුර පයිප්පයක්
වෙනුවට මේස් ලොරියක්ම තෑගි දෙන්ට ආපු ටවුමේ
මහත්තුරුන්ට අපේ ලොකු සර් ඉහේ අත ගසා කීවා
වාගේ

බාටා දෙකක්වත් නැති මේ ළමයින්ට

ඇඹුල් තියල් හදන්ට හේනේ ඉරිඟු පඳුරුවලින් මාළු
කූරි රෑනක් නෙළාගෙන ඒ හදන මාළු දමන්ට බුලත්
පන්දලමෙන් රිදී දීසි දුසිමකුත් කඩා ගෙන දුවන්
එන්ඩ කිව්වට කිසි කමක් පලක් නැත්තා වාගේ

ඩේටා කොහෙද පාඩං අහගෙන ඉන්ට....

**- ලක්ශාන්ත අතුකෝරළ -**


බිඳෙන බව දැන දැනම
බිමට අතහැරි පසුව "හිත "
සියුම් මුවහත් කැබලිති,
කලබලෙන් අහුලා වළලමි.
හය හතර නොදන්නා පොඩි එවුන්
අත කපා ගනී යැයි බිය වෙමි.
වේදනාබර විලාප,
ලේ ගලන තුවාල -කැපුම් සහ සීරුම්
උන්ට තව හුරු නැත !

- චන්දි දිසානායක -

එක දෙසට පියාඹන
රැළෙන් මගහැරුණු
වී කුරුල්ලෙකි
මංමුළා වුණායි හිතුවාට
ඌ සොයාගත්
යම් සත්‍යයක්, රසයක් ඇති...

- නොඉමි -

**ළහිරු කරුණාරත්න**





පාඨක
සටහන්..

# පාසල් වර්ගීකරණයේ වින්දිතයා

**සනත් පතිරණ**
විද්‍යාවේදී (ව්‍යාපාර අධ්‍යනය)

"බඩේ තියන් ඉන්න පුළුවන්නම්, කරේ තියන් ඉන්න බැරි ඇයි"

තම දරුවා පාසලට ඇතුළත් කර නොගත්තේ යැයි පවසමින් දරුවාද කර තබා ගෙන දරාගත නොහැකි සිත් තැවුලෙන් එම අසාධාරණයට විරෝධතාවය පාමින් විරෝධතා පුවරුවක්ද අත තබාගෙන කොළඹ ගාලු මුවදොරට රාජාංගනයේ සිට පැමිණි කාන්තාවක් පොලිස් නිලධාරීන් සමඟ බහින් බස් වීමකදී ඇයගේ මුවින් පිට වූ කලකින් අසන්නට ලැබුණු හරවත් වදන් පෙළකි, එම වැකිය.

පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ දැවැන්ත සටනින් පරාජිතයන් බවට හෝ වින්දිතයන් බවට පත්වන්නන් බොහෝමයක් මේ ශාපලත් දේශයේ හැම තැනින්ම දැකිය හැකිය. එවැනි සිද්ධියක් අප පසුගිය දිනක සමාජ මාධ්‍ය හරහා දැක ගත්තෙමු. එම තත්වයට මුහුණ දෙන දරුවා හා දෙමාපියන්ගේ මානසික මට්ටම කෙබඳුද? හොඳ පාසල් හා නරක පාසල් කියා තිබේද? ජාතික පාසල්වලට යන්නේ යමක් කමක් ඇති වැදගත් දෙමව්පියන්ගේ දරුවන්ය.  පළාත් සභා හෝ වෙනත් පාසල්වලට යන්නේ යමක් කමක් නැති අවැදගත් දෙමව්පියන්ගේ දරුවන්ද? ලංකාවේ අධ්‍යාපනය කුමන ආකාරයෙන් සලකා බැලුවත් ගැටලු සහගතය. දරුවන් පාසලට ඇතුළත් කිරීමේ ගැටලු, විභාග පැවැත්වීමේ ගැටලු, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගැටලු, පාසල් අධ්‍යාපනයේ ගැටලු ආදිය දැකිය හැකිය. විධිමත් ලෙස සැලසුම් කළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් මෙතෙක් නැතුවා පමණක් නොව මේ ක්‍රමය තුළ එවැන්නක් සකස් වේද යන්නත් අනුමාන කළ නොහැක.

සැබවින්ම අධ්‍යාපනය යනු කුමක්ද? විවිධ නිර්වචන ඇත. මහත්මා ගාන්ධිතුමාගේ නිර්වචනයකට අනුව අධ්‍යාපනය, හිස, අත, සහ හදවත දියුණු කිරීම අධ්‍යාපනය වේ. අධ්‍යාපන ක්‍රමය තුළ පොත පත කියවීම, විවිධ විෂයන් ඉගෙනීම හා ලෝකයේ ස්වභාවය ඉගෙනුම තුළින් 'හිස' දියුණු කිරීමත් සාහිත්‍ය, කලාව, ආගම, සෞන්දර්ය, සංගීතය, සිරිත් විරිත් ඇතුළු හර පද්ධතීන් පිළිබඳ දැනුම ලැබීම තුළින් 'හදවත' දියුණු කිරීම නොහොත් තෙතමනය සහිත සංස්කෘතික ළතෙත් බවක් හා අනෙකා සමඟ ජීවත් වීමට හික්මීම ලබා දීමත් තමන්ගේ සහජ දක්ෂතා හඳුනාගෙන එකිනෙකා එක් එක් ක්ෂේත්‍රවලට යොමු කිරීම තුළින් කිසියම් වෘත්තියකට මඟ පෙන්වීම 'අත' දියුණු කිරීම යන්නෙන් අර්ථ ගන්වයි. මෙම අංශ තුනම සමබරව යා යුතුය. එකක හෝ අඩු වැඩි වීමක් වුවහොත් අසමබර අයෙකි. රටක අධ්‍යාපනය යනු ප්‍රධානතම ආයෝජනයයි. එය නිසි පරිදි සැලසුම් කර කළමනාකරණය කළ යුතුය.

හැම වසරේම උදාවන පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ සීතල යුද්ධය 2024 වර්ෂය සඳහා ද උදා වීමට තව මාස කිහිපයක් ඉතිරිව ඇත. මේ වන විට පදිංචිය තහවුරු කිරීම සඳහා ව්‍යාජ හෝ අව්‍යාජ ලිපි ලේඛන සකස් කිරීමට දෙමව්පියන් සුහුසුළුව සිටිනවා ඇත. සමහරු කල්වේලා ඇතිව මෙම සටනට මුහුණ දීමට ආම්පන්න සූදානම් කරගෙන සිටිති. ජාතික පාසල් හා පළාත් සභා පාසල්වලට තම දරුවන් ඇතුළත් කිරීම සඳහා වන පොරකෑමෙන් අනතුරුව යමෙකුට සාධාරණයත් තවකෙකුට අසාධාරණයත් අඩු වැඩි වශයෙන් ජයග්‍රහණය කරනු ඇත.

රාජාංගනයේ මව ඉහත කී සටනින් පරාජයට පත්ව තම දරුවාද කර තබා ගෙන රාජාංගනයේ සිට කොළඹට ආවේ මේ වසරේ මාස 06 ක් ගත වී ඇතත් තම දරුවාට පාසලක් අහිමි වීමේ අයුක්තිය පාලකයන්ට කියා පෑමටය; තම දරුවාට යුක්තිය ඉටු කර ගැනීමටය. මෙම උග්‍ර ගැටලුවට විසඳුම් සමාජය සතු වන නමුත් ඒ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තීන්වල ප්‍රබල ප්‍රතිසංස්කරණ සිදුවීම අත්‍යවශ්‍යය.

පාසල් වර්ගීකරණය නුසුදුසු බවත් සමාජයේ ගැටලු හා ගැටුම් රාශියක් නිර්මාණය කිරීමට අහිතකර හා වේදනාකාරී ලෙස බලපාන බවට පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවල හා අධ්‍යාපනවේදී වැනි පාඨමාලා හදාරන ගුරුවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ විද්වතුන්ට මේ සම්බන්ධයෙන් අවබෝධයක් ඇත. අනෙක් අතට පාසල් වර්ගීකරණය වහා ඉවත් කළ පමණින් ගැටලුව විසඳෙන්නේද නැත. අධ්‍යාපන පහසුකම් සැමට සමාන වන සේ පුළුල් කිරීම අනිවාර්යයකි.

පාසල් වර්ගීකරණය නිසා ග්‍රාමීයව තිබූ බොහෝමයක් පාසල් වැසී ගියේය. එබැවින් සෑම දරුවෙකුටම පහසුවෙන් ළඟාවිය හැකි අවම දුරක සමාන පහසුකම් සහිත පාසල් පද්ධතියක් සකස් කළ යුතු වේ. එය අපහසු කාර්යයක් නොවේ. අද හෙළිවන වංචා දූෂණ, නාස්තිය, හොරකම් මෙන්ම විදේශ ණය හා රටේ ඇති වත්කම් සසඳන විට රට දියුණු කිරීම පසෙකලා හොරකමට මුල්තැන දී ඇති බවට වුවමනාවටත් වඩා කරුණු අනාවරණය වී ඇත.

නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය රාජ්‍ය වගකීමක් ලෙස සැලකුවද අද වන විට එය වාණිජකරණය වී ඇති අතර දැඩි උත්සාහයෙන්, අපහසුතාවයකින්, තරගකාරිත්වයකින් හා දැඩි පීඩනයකින් යුතුව උපයා ගත යුතු දෙයක් බවට පත්ව තිබේ. ඒ නිසාම අධ්‍යාපන ක්ෂේත්‍රය වංචා, අල්ලස් හෝ දූෂණ හා නොයෙක් වර්ගයේ අර්බුද ගැටුම් උපදවන ස්ථානයක් බවට පත්වී අවසන්ය. පෙරපාසල් අධ්‍යාපනයේ පටන් 'අධ්‍යාපනය' අද වෙළඳපොළේ අලෙවි වන වෙළඳ භාණ්ඩයක් බවට පත්ව තිබෙන බවට විවාදයක් නැත. අධ්‍යාපනය එහි මූලික සංකල්ප, පරමාර්ථ හා මූලික හර පද්ධතීන්ගෙන් බැහැරව ගමන් කරන්නක් බවට පත්ව ඇත. මෙයට ප්‍රධානම හේතුව පාසල් වර්ගීකරණය කර තිබීමය. එනම් ජාතික පාසල්, පළාත් සභා පාසල්, නවෝද්‍යා පාසල්, මධ්‍ය මහා විද්‍යාල, මහා විද්‍යාල මෙන්ම මුස්ලිම් පාසල්, දෙමළ පාසල්, මද්‍රාසා පාසල් ලෙස ආගම හෝ ජාතිය අනුවද පාසල්ද ගැහැනු පාසල් හා පිරිමි පාසල් ලෙස ලිංග භේදය අනුවද ජාත්‍යන්තර පාසල් ලෙසද පාසල් තිබීම නිදසුන් ලෙස දැක්විය හැකිය.

හැම දෙමව්පියෙක්ම ජාතික පාසලකට හෝ ජනප්‍රිය පාසලකට දරුවා ඇතුළත් කර ගැනීමට උත්සාහ දරති. එය වරදක් නොවේ. මන්ද තම දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දීම සෑම දෙමව්පියෙකුගේම බලාපොරොත්තුව වන නිසාය. පවතින ක්‍රමය වෙනස් නොවී කෙනෙකු හිතන පිළිවෙළ පමණක් වෙනස් කළ නොහැක. ඔවුන් හිතන්නේ ගමේ පාසලේ හොඳ ගුරුවරුන් හා හොඳ අධ්‍යාපනයක් නොමැති බවය. නගරයේ පාසලේ හොඳ අධ්‍යාපනයක් දෙන්නටත් ගමේ පාසලේ එසේ නොවන්නටත් හේතුව කුමක්ද? මෙම තත්වය උදා කළේ කවුද? මෙම තත්වය වළක්වා ගත හැක්කේ කාටද? එසේ නම් මෙම තරගයෙන් ජය ගැනීමට නොහැකි වූවන්ගේ මානසික කම්පනය කුමක් විය හැකිද? රාජාංගනයේ සිට කොළඹට ආ මවගේ කම්පනය කෙබඳු විය හැකිද? එම කම්පනය පැයකින්, දෙකකින් මාසෙකින් දෙකකින් තුනී වී යන්නක් නොවේ. ඇතැම්විට මරාගෙන මැරෙන්නට කෙනෙකුට සිතුණද එය පුදුමයක්ද නොවේ.

ලොකු ඉස්කෝල පොඩි ඉස්කෝල ලෙසත් දුප්පත් දෙමව්පියන්ගේ දරුවන් ලෙසත් පොහොසත් දෙමව්පියන්ගේ දරුවන් ලෙසත් පාසල් වර්ග වීම හා එවැනි හැඟීම් හා හීන මානයන් සමාජ ගත වීම සුලබ තත්වයකි. පාසලේ නම පිළිබඳව උස් පහත් මානසිකත්වයක් ගොඩ නැඟීම සහ රැකියා ලබා දීමේදී පිළිගත් යැයි සම්මත පාසල්වලට යන සිසුන්ට ප්‍රමුඛතාවය හිමිවන බවට වන විශ්වාසයක් සමාජය තුළ පවතී. එමගින් කෘත්‍රිම පංති භේදයක් නිර්මාණය කරයි. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙම සමාජීය පරතරය ඉවත්කොට සමාන තත්වයක් ඇති නොකළහොත් මෙම ගැටුම් වර්ධනය වීම එලෙසම සමාජය තුළ පවතිනු ඇත.

පවතින බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ අසාධාරණයට ලක්වන සිසුන්ට පාසල් ආරම්භ කර මාස 05-06ක් පාසලක් නොමැතිව නිවෙස් තුළ රැඳී සිටීම දෙමව්පියන්ට දරා ගත හැකි තත්වයක් නොවේ. රාජාංගනයේ සිට කොළඹට පැමිණි මවද එවැනි කම්පනයකට ලක්ව ප්‍රතික්‍රියා දැක්වූ ආකාරය අපට දැකගත හැකි විය. ඇය නගන ප්‍රශ්නයේ විශාලත්වය හා පරිමාව මේ පාලකයින්ට අවබෝධ වන්නේදැයි අපි නොදනිමු. එම මව හරවා නැවත රාජාංගනයට යැවූ පමණින් ඇගේ ප්‍රශ්නය විසඳේද? අනුමාන කළ හැක්කේ මෙම රාජාංගනයේ මවට 2023 ජූනි මාසය වන විටද තම දරුවාට පාසලක් නොලැබී ඇත යන්නය.

වර්තමානයේ රට තුළ පවතින උග්‍ර ආර්ථික අහේනිය හා ජීවන වියදම් ඉහළ යාමේ වැඩිම ඍණාත්මක බලපෑම අධ්‍යාපනයටය. ඒ තත්වය තුළ අනාගත අධ්‍යාපනය කුමන දිශාවකට ගමන් කරයිද යන්න සැක සහිතය. මන්ද අද වන විට දරුවා පාසලට යැවීමට සමහර දෙමව්පියන් අධෛර්යමත් වී ඇත. ඒ අධෛර්යමත් තත්වයට වැඩි දායකත්වයක් ඇත්තේ දෙමව්පියන්ට පාසල් බස් රථවලට ගෙවීමට, ආහාර පාන ලබා දීමට, දෛනික වියදම් දැරීමට, පාසල් පොත් පත් හා උපකරණ මිලදී ගැනීමට නොහැකි වීමය. මේ තත්වය තුළ දරුවාට පාසලින් විභාගය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන ලෙසත් ටියුෂන් මගින් කෙසේ හෝ ළමයාට උගන්වන්නම් යන ඉල්ලීම් කරන තැනට දෙමව්පියන් පත් වී ඇති බව පසුගියදා අනාවරණය විය.

සමබර පෞරුෂයකින් හෙබි යහපත් පුරවැසියෙකු සමාජයට දායාද කිරීම අධ්‍යාපනයේ අරමුණ හා පරමාර්ථය වන විට දරුවා පාසලට ඇතුළත් කරන්නේ නීති විරෝධීව හා වංචා සහගතව නම් එහි අර්ථය කුමක්ද? එය ඉතිපිසෝ ගාථාව කියමින් දඩයමේ යනවා වැනි ක්‍රියාවක් නොවන්නේද? කෙසේ නමුත් මෙම මජර පාලන ක්‍රමය ජනතාවට බලකර ඇත්තේ එසේ කිරීමටය. පාසල් වර්ගීකරණය ඉවත් කොට හැම ළමයෙක්ම ළමයෙක් ලෙසත් හැම ගුරුවරයෙක්ම ගුරුවරයෙක් ලෙසත් පිළිගනු ලබන සමාන මානසිකත්වයක් සමාජ ගත කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු කළ යුතු වුවත් එය දැනටමත් ප්‍රමාද වැඩිය.

'අධ්‍යාපනය' හුදෙක් තම ආත්මාර්ථය සඳහා පමණක් යන හැඟීම අධ්‍යාපනය තුළින්ම සමාජගත වීමට ඉඩ හැරීමෙන් අනාගතයේදී මානව බැඳීම් විරහිත සමාජයක විසඳා ගත නොහැකි අර්බුද රැසක් නිර්මාණය වනු නොඅනුමානය. අධ්‍යාපනය පැවතිය යුත්තේ මිනිසුන් අතර පරතරයක් හා පංති බේදයක් සඳහා නොව සමානාත්මතාවය උදෙසාය. අධ්‍යාපනය, තිරසාර සාමයත් සංහිඳියාවක් සඳහාය. මූලික අයිතිවාසිකමක් ලෙස සමාජ ගත කළ පමණින් ප්‍රශ්නය විසඳෙන්නේ නැත. ඒ වෙනුවෙන් හැම දෙනාටම හිතට මෙන්ම ගතට දැනෙන ලෙසට අවශ්‍ය ගුණාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය.

රාජාංගනයේ සිට තම දරුවෙකු කරේ තබා ගෙන කොළඹ ගෝල්ෆේස් ජනාධිපති ලේකම් කාර්යාලය අසලට පැමිණි මවට මුළු මහත් සමාජයම තමන්ටත් තම දරුවාටත් වෙනස්කොට සලකනවායැයි සිතන්නටත් සැබැවින්ම වින්දිතයෙක් වන්නටත් සැලැස්වූවෝ කවරහුද? පිළිතුරු සෙවිය යුත්තේ අපමය.




2038 රට ලෝකෙට ණය දෙන රටක් තරමට ඉහළ නැඟීමේ සිහින ප්‍රීතිය බුක්ති විඳිමින්ම පෝරිසාද කරණමක් ගහලා දඩෝං සද්දෙන් වැවට පැන්නා. කරණමත් පොඩ්ඩක් වැරැදුනා. ඊටත් වඩා ඉඩෝරෙන් හිදුන වැව් පතුලේ ඔළුව වැදිලා මඤ්ඤං වුණා. “මේ කාලේ හැටියට මඤ්ඤංවීම හැර අන් කවර සැපතක්ද” කියලා පෝරිසාද වැව් පතුලේ ගලක වැදිලා ගැටයක් මතුවුන හිස මුදුනයි පිටටම ඇලුන හිස් බඩයි අතගාන්න ගත්තා. රස්සාවක් කියලා හිඟමනක්වත් අමාරු රටක අස්වැසිල්ල පෝලිමේ හිටගත්තා වගේ සහනයක් දැනෙන්න ගත්තා. මොකද ඔළුව අතගාන්න වෙන්නේ තිරස්ව. බඩ අතගාන්න වෙන්නේ සිරස්ව. මාර ආතල් ආ... හරියට අස්වැසුම හොයාගෙන වෙට්ටු දාගෙන එහෙට මෙහෙට පෝලිම්වලට දුවනවා වගේ.

ඔන්න ඔය ආතල් එක අස්සේ උඩවලව වාන් දොරටු ඉබේම විවර වෙන්න ගත්තා. මොකද විදුලි බල ඇමතිට වතුර එවන එක නතර කරන්න අමතක වෙලා. බැරිම තැන නිහතමානීව කෘෂිකර්ම ඇමති බැහැලම කුඹුරුවල වක්කඩ කඩන්න ගත්තා. ඔන්න ඔය වෙලාවේ තමයි

“තිත්ත පැටව් උඩ පනින තාලයට

වක්කඩ ළඟ දිය ඇලි හැදුණා.

අමරවීර හොඳයි.

රනිලුත් හරි හොඳයි.

රනිල් හොඳයි. රනිල් හොඳයි.

අමරවීර හොඳයි

තිත්ත පැටව් හොඳයි

වක්කඩ හරි හැඩයි”

කියලා මෛත්‍රීපාල සිරිසේන බයිලයක් කියන්න ගත්තේ. මොකද වෙන ආණ්ඩුවක ඇමති කෙනෙක් වුණාට අමරවීර තමන් ළඟ හිටි එකානේ යන හැඟීම ඉස්මතු වුණා. එකෙකුට පිරිමහන්න බෑ වක්කඩ කැඩිල්ල. කට්ටිය 13 එක්ක පටලවා ගත්තට සර්ව පාක්ෂික සමුළුවක් ඕන වුණේ ඕකට පිළියම කතා කරගන්න. රාජපක්ෂ ක්‍රිකටර්ස්ලා, හැට පැන්නත් කොන්ද කෙළින් කියාගෙන පිත්ත කොන්දේ බැඳගෙන සමුළුවට ආවේ. මේක දැකලා රනිල් දෑතින්ම උඩ දමමින් බෝලේ කරකවනවා ඉවරයක් නෑ. දඟපන්දුවකටද කොහෙදෝ ආසාව. සජිත්ලා ආවට සමුළුවේ නෙවෙයි හිටියේ. “රටේ මිටි ජනතාව වැඩිවෙලා” කියලා නිවුස් එකක් දැකලා කලබල වෙලා. මිටි නම් කම්කරු මිටිනම් කම්කරු කියාගෙන රනිල් ළඟට ගියා. රනිල් රජ්ජුරුවෝ උඩයි උඩයි මිටි කොල්ලෝ බිමයි බිමයි කියලා

සජි රනිල් ළඟ මිටි පුටුවක වාඩි කළා.


උඩවලවේ වැඩේ තවම ඉවර නෑ. දැන් කහපාට පිදුරු කොළපාට ගොයම වෙලා. කිරි වැදිලා ගොයම හැදිලා කරල් පැහුණා. වක්කඩ දෝරේ ගලනවා. විදුලි ඇමති වක්කඩවලට විදුලිය උපදන ටර්බයින් හයිකරන්න ගත්තා. හැම වක්කඩේකින්ම ගන්න විදුලිය අයිඑම්එෆ් එකේ ණයට හිලව් කළා. (රටේ විදුලි බිල්පත් එකින් එක කාංචන අතින්මයි ඉරලා කුණු ගොඩට දැම්මේ) අන්තිමට ලෝක බැංකුවත් අපිට ණය වුණා. මේක නවත්වන්න බැරි තැනයි මෝදි සියලු වක්කඩවල හකුරු හංගන්න ගත්තේ. රනිල් වැඩකාරයා ඒ හකුරු එකතු කරලා චීනාට දුන්නා. චීනා හකුරු කකා ලංකාවෙන් තේ ගෙන්නලා බොන්න ගත්තා. ලංකාව "රනිල්ගේ තේ වත්ත" කියලා ලෝක ප්‍රසිද්ධ වුණා. ඔන්න ඔය අතර තමයි කෙහෙළිය පුරාණ ජනප්‍රවාදයක වගේ සෙංකඩගලදී නරියෙක් පස්සේ හාවෙක් එළවනවා දැකලා වනගත වුණේ. සෙංකණ්ඩ බමුණා වගේ භාවනානුයෝගීව සිටින කෙහෙළිය දැක නොබෙල් සාම කමිටුව කෙහෙළියට නෝ - බෙල් සාම ත්‍යාගය දුන්නා. කීර්තිය මොකටද මට රටේ ජනතාවට වඩා කියලා කෙහෙළිය නොබෙල් විකුණලා ජනාධිපති අරමුදලෙන් කොටු පනින්න ගත්ත ආධාරය ආපිට ගෙව්වා. ඉතිරි ඩොලර්වලට රටේ එකාලට නාන්න තරමට බෙහෙත් ගෙනාවා. අවංකභාවය නිසා ලැබුණු කොමිස්වලටත් බෙහෙත්ම ගෙනාවා.


අන්න ඒ බෙහෙත් ගොඩබාන්න තරම් හයියට කන්ටේනරයක් නැති තැන ලෙඩ්ඩුන්ටම වරායෙන් බෙහෙත් අරන් යන ක්‍රමයක් හැදුවා. අස්වැසුම පෝලිම් අතුරුදන් වුණා. බෙහෙත් පෝලිම දික්වුණා. නොමිලේ දෙන නිසාම මිනිස්සු තුන් වේලටම බෙහෙත් ආහාරයක් කරගත්තා. ප්‍රතිජීවක, මල්ටි විටමින් ආදියෙන් ඉස්මුරුත්තෙට පත් ජනතාව බත් දිහා බලන්නේ නෑ. ගස්යට නිදිකිරනවා. අන්න එතෙන්දි තමයි මහ කුඩ්ඩන්ට කෙළවුණේ. කුඩු ගහන්න එවුන් නෑ. හැමෝම පෙති ගහන්න ගත්තා. මුදලාලිලා කුඩු මුහුදට විසිකරා. ඒකෙන් වුණේ කුඩු ගහන්න හුරුවුණ මුහුදේ මාළුවෝ වෙරළට ආවා කුඩු හොයන්න. ඒකෙන් ධීවර කර්මාන්තය නැගල ගියා. රටේ බල්ලෙක්වත් මාළු කන්නේ නෑ. එපා වෙලා. ඒ තරමට රට වටේම මාළු. අන්න එහෙමයි මාළු රටට තවත් ඩොලර් උල්පතක් වුණේ. බෙහෙත් කාලම ජනතාව බත් නොකන නිසා වී අස්වැන්න ගබඩාවල එහෙමම. එතකොටයි අමරවීරට මතක් වුණේ චීනෙට සහල් අපනයනය කරන්න. ඒ වුණාට ලංකා ආණ්ඩුව අර චීන අශූචි නැව වගේ බාල වී ඇරියේ නෑ. සුපිරි වී ඇරියේ. චීන්නු වී වගාව නවත්තලා අමරවීර වීවලට වහවැටුණා. අන්න එහෙමයි ලංකාව පෙරදිග ධාන්‍යාගාරය වුණේ.

වේගෙන් රට 2048 රනිල්ගේ සංවර්ධනය කරා ඉගිළ යද්දි කන්න නැතිකමට පොළොවේ පස්ම කාලා හොඳටම බඩයන කැහැටු කපුටෙක් පෝරිසාදගේ හිසට මළපහ කළා. පෝරිසාදගේ මඤ්ඤං මොළේට ලාවට සීතලක් දැනුණා. මෙතෙක් වෙලා මඤ්ඤංව හිටි තැනම තිරස් අතට හිසයි සිරස් අතට බඩයි අතගගා සිටි පෝරිසාද සිහි විකලෙන් මිදුණා. හිසේ වේදනාවටයි සිහි ලද සතුටටයි පෝරිසාද නැවත කරණමක් ගහලා වැවට පැන්නා.

"ඩිග්.

බුදු අම්මෝ.".







ළමා ආරක්ෂාව පිළිබඳ සිව්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය
සැප්තැම්බර් 27-29 කාලය තුළ පැවැත්වෙනු ඇත්තේ කියුබාවේ හවානා අගනුවරය.
ඒ වෙනුවෙන් ලතින් ඇමරිකානු සහ යුරෝපා රටවල නියෝජිතයින් 200කට වැඩි පිරිසක් සහභාගි වීමට නියමිතය.

රාජගිරිය, කලපළුවාව, අංක 298 හි පදිංචි ටී.එම්.ජී. කණිෂ්ක රශ්මින් වන මා විසින් ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.